55226

# අපේ ජනරජ ගමන

ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න.

R 320.95493/55226

These books have been collected / purchased and donated by the Association of Sri Lanka Lawyers in The UK to the KURUNEGALA Public Library. UDALAGAMA - JAYA PHIRANA - WJIJESUNDERA COLLECTION.

You should not be in possession of this book outside the premises of the library. It would amount to an act of theft if you remove this book from the library. There are no exceptions.

# අපේ ජනරජ ගමන

අධ්‍යාපන අමාත්‍යාංශය

බලපත්‍රය

පොතේ නමː අපේ ජනරජ ගමන | බලපත්‍ර අංකයː අග්‍රපුළව/2/8756

කර්තෘː ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න

1952 පෙබරවාරි මස 29 වැනි දින නිකුත් කරන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ වූ උපකෘත ස්වභාෂා, ද්විභාෂා සහ ඉංග්‍රීසි පාඨශාලාවන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 19/ඒ ඡේදය යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්තුමන් විසින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කරන ලදී.

විජිත වෙලගෙදර
ලේකම්
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය

2010.09.09 වන දින
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල.
බලපත්‍රය අවලංගු වන දිනයː- 2015.09.08

මහජන පුස්තකාලය මහ
විමර්ශන අංශය
මහ නගර සභාව
කුරුණෑගල

R

**කර්තෘගේ වෙනත් කෘති:**

- "සංවර්ධනය"
- ''21 වන සියවස ශ්‍රී ලංකාව හා සංවර්ධනය'

(මෙම ග්‍රන්ථ දෙකම විශ්වවිද්‍යාල පශ්චාත් උපාධි සඳහා නිර්දේශිතයි.)


| වර්ග අංකය | 320.95493 |
|---|---|
| ප්‍රවේශ අංකය | 55226 |

# අපේ ජනරජ ගමන

මහජන පුස්තකාලය සහ
විමර්ශන අංශය
මහ නගර සභාව
කුරුණෑගල

ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

සෙනෙවිරත්න, ඉන්ද්‍රජිත්
අපේ ජනරජ ගමන / ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න -
ගොතටුව (නව නගරය) : කර්තෘ,
2010
පි. ...... : සෙ.මී. 21

ISBN 978-955-52642-0-4
.... 320.95493 ඩිව් 22

i. දේශපාලන ඉතිහාසය - ශ්‍රී ලංකාව ii. ග්‍රන්ථ නාමය

ප්‍රථම මුද්‍රණය: 2010 ජූලි

**අපේ ජනරජ ගමන**

© ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න

ISBN 978-955-52642-0-4

කවර නිර්මාණය හා සැලසුම:
ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න

පරිගණක සහාය:
සජීව රොෂාන් පෙරේරා

පරිගණක අක්ෂර සංයෝජනය:
උපුල් ධම්මික - 0716-433370

මුද්‍රණය:
ඉම්ප්‍රෙෂන්ස් (පෞද්ගලික) සමාගම,
නුගේගොඩ.
දුර: 0777-802798

කර්තෘ ප්‍රකාශනයකි
ඇස්. ඇම්. අයි. කේ. සෙනෙවිරත්න
845/12, දොඩම්ගහහේන, ගොතටුව නව නගරය.
දුර: 0112-410345, 071-4400677, 0777-296688

# පෙරවදන

ආචාර්ය ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න විසින් රචිත "ජනරජ ගමන සහ අපේ රාජ්‍ය ලාංඡනය" නමැති ග්‍රන්ථයට පෙරවදනක් ලිවීමට හැකිවීම ගැන අතිශයින්ම සතුටු වෙමි. මීට ප්‍රථම මේ කතුවරයා විසින් රචිත "සංවර්ධනය" හා "21 වන සියවස ශ්‍රී ලංකාව හා සංවර්ධනය" යන ග්‍රන්ථ දෙකට වඩා වෙනස් මඟක ග්‍රන්ථයක් ලෙස මෙය හඳුන්වා දිය හැකියි.

ශ්‍රී ලංකාව යටත් විජිතවාදී ග්‍රහණයෙන් මිදී 1972 ජනතා පරමාධිපත්‍ය හිමි රාජ්‍යයක් නොහොත් ජනරජයක් වීම හේතුකොට අප රටේ ඇතිවූ දේශපාලනික, නීතිමය හා සමාජමය පරිවර්තනය කේන්ද්‍රකොට මෙම ග්‍රන්ථය සම්පාදනය කර තිබේ. මෙම කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට නව ජනරජ ලාංඡනයක් නිර්මාණය වූ අතර, අද දිනද ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය ලෙසට භාවිත වන්නේ එම ලාංඡනයයි. මෙහි ඇති විශේෂත්වය නම් එම ලාංඡනයේ නිර්මාතෘවරයා වන්නේ මෙම ග්‍රන්ථයේ කතුවරයාගේ පියාණන් වන කලාපති, කලාභූෂණ, පුරාවිද්‍යා චක්‍රවර්ති ඇස්. ඇම්. සෙනෙවිරත්න මහතා වීමයි. එබැවින් මෙම කරුණ ග්‍රන්ථයේ වටිනාකම තවත් වැඩිකරයි මා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මෙන්ම සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ රාජකාරි භාරව සිටි දශක තුනකට ආසන්න කාලපරිච්ඡේදය තුළ ඇස්. ඇම්. සෙනෙවිරත්න මහත්මා ඉතා දක්ෂ මෙන්ම අපට හිතවත් නිලධාරියකු ලෙස අප සමඟ කටයුතු කළ ආකාරය මෙහිදී සතුටින් සිහිපත් කරමි. එම කාලසීමාව තුළ විවිධ නව ගොඩනැගිලි සැලසුම් නිර්මාණය, පුරාවිද්‍යා සංරක්ෂණ සැලසුම් නිර්මාණය කිරීම, බිතුසිතුවම් පිටපත් කිරීම, විවිධ ග්‍රන්ථ සඳහා විද්‍යාත්මක චිත්‍ර සටහන් නිර්මාණය කිරීම ප්‍රධාන කොට විවිධ ආයතන සඳහා ලාංඡන නිර්මාණය කිරීමටද එතුමාණන්ට අවස්ථාව උදාවූ බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

එවන් ජාතික සේවයක් කළ ඇස්. ඇම්. සෙනෙවිරත්නයන්ගේ එම නිර්මාණයන් පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම ග්‍රන්ථයේ අවසන් පරිච්ඡේද කීපය යොදා ගැනීම සම්බන්ධයෙන් කතුවරයාහට මාගේ ස්තුතිය පුද කරමි.

කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලයේ සිය පාසල් දිවිය ගතකරන කාලයේ සිට ආචාර්ය ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න මම හොඳින් දැන හඳුනාගෙන සිටියෙමි. අධ්‍යාපනයට මෙන්ම පාසලේ බාහිර කටයුතු සඳහා ඔහු විසින් කරන ලද කැපවීමද මාගේ මතකයෙහි ඇත. ඇතැම්විට අපගේ මෙන්ම දෙපාර්තමේන්තුවේ සහාය පවා පාසල් කටයුතු සඳහා යොදා ගැනීමට තරම් ඔහු දක්ෂ විය. විවිධ සාහිත්‍ය හා කලා කටයුතු, නාට්‍ය හා වෙනත් සංස්කෘතික උත්සව සංවිධානය කිරීමද මෙහිලා ප්‍රමුඛය. දැනට විශ්වවිද්‍යාලය තුළ මෙන්ම විවිධ රාජ්‍ය සහ වෙනත් අධ්‍යාපන ආයතනයන්හි බාහිර කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කරන ඔහු ගත් කතුවරයකු මෙන්ම ප්‍රවීන ඡායාරූප ශිල්පියකුද වේ. මේ සියලු හැකියාවන් සමඟ ග්‍රන්ථකරණය පිළිබඳව ඔහු දක්වන ලද පරිචය මෙම පොතෙන් මනාව පැහැදිලි වේ. එබැවින් මෙම ග්‍රන්ථය පාසල් සිසුනට, සාමාන්‍ය ජනතාවට මෙන්ම විද්‍යාර්ථයින්ගේ ප්‍රයෝජනය සඳහා වටිනා ග්‍රන්ථයක් බව මෙහිලා සතුටින් සඳහන් කරනු කැමැත්තෙමි.

**ආචාර්ය රෝලන්ඩ් සිල්වා**

කුලපති - මොරටුව විශ්වවිද්‍යාලය,
හිටපු පුරාවිද්‍යා කොමසාරිස් හා
අධ්‍යක්ෂ ජනරාල්,
සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය.
2010.06.07

# හැඳින්වීම

මිනිසුන් වන අප එකිනෙකා අනෙකාට වෙනස් වේ. මෙම වෙනස සමස්ත විශ්වයටම පොදුවූ ධර්මතාවයකි. මිනිසුන්ගේ වෙනස්කම් හඳුනා ගැනීමට භෞතික ලක්ෂණ මෙන්ම විවිධ නාම, ගතිගුණ, බුද්ධිය, හැකියා සහ සිතුම් පැතුම් ආදී භෞතික නොවන අංගද යොදා ගැනේ. මේ නිසාම මෙහි සංකීර්ණත්වය අතිශයින් පුළුල් වේ. තිරිසනුන් අතර පවා එකිනෙකා වෙනස්ව හඳුනා ගැනීමට ශබ්දය ප්‍රධාන විවිධ සංඥා ක්‍රම පවතින බව දැනට සොයාගෙන ඇත. "නානාථ කායා නානාථ සංඥා" ලෙසට අප බුදුන්වහන්සේ පෙන්වා දී ඇත්තේද මෙම සමස්ත වෙනස පිළිබඳ ධර්මතාවයයි.

එකම පිරිසක් තුළ පුද්ගලයන් මෙලෙස විවිධ ලෙස වෙනස් වෙද්දී ඔවුනොවුන් හඳුනා ගැනීම සඳහා විවිධ සංකේතයන් යෙදීම සිදුවේ. පුද්ගල නාමය මෙහිලා සුවිශේෂය. එසේ ජීව විද්‍යාත්මකවද පුද්ගල විවිධත්වය, හැඩය, ස්වභාවය, ප්‍රමාණය, මුහුණ මෙන්ම ඇඟිලි සලකුණු ආදී සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කෙරේ. රාජ්‍යයක් හෝ ආයතනයක් ලෙස පුද්ගල විවිධත්වය හැඳුනුම් පත්‍රය මගින් නීතියෙන්ම ස්ථාපිත කොට ලියාපදිංචි කර ඇත. මේ අනුව "පුරවැසියා" යන පොදු පදය තිබුණද පුරවැසි විවිධත්වය නිශ්චිතව, නීතියෙන් වෙන්වූ හඳුනා ගැනීමේ සංකේත හා නාම පවතින බව මෙහිලා සැලකිය යුතුයි.

එකිනෙක ඒකකයන් මෙසේ වෙනස් වෙද්දී වෙනස නිසාම උරුම කොට ඇති විශේෂ "බලයක්" මේ සියල්ල තුළ පැවතිය යුතුය. සෑම සත්වයෙකුටම ඇති තමන් කෙරෙහි ඇති "අයිතිය" (Rights) මිනිසා කෙරෙහි "මානව හිමිකම්" (Human Rights) ලෙසට හඳුන්වනු ලබන අතර රටක් කෙරෙහි එය ස්වාධිපති (Sovereignty) බලය ලෙස හඳුන්වමු.

නමුත් විවිධ ආධිපත්‍යයන් මගින් සෑම පුද්ගලයෙකුම, සෑම සත්වයෙකුම හා සෑම රටක් කෙරෙහිම ඇති තමා සන්තක වූ අයිතිය ක්‍රියාත්මක කිරීමේදී සදාචාර සීමාවන් මෙන්ම සදාචාර නොවන සීමාවන් ක්‍රියාත්මක කොට ඇති බව පැහැදිලිය. සදාචාර සීමාවන් නිර්මාණය වන්නේ නීතිය, සිරිත් විරිත් හා ආකල්ප මත

වන අතර සදාචාර නොවන සීමාව යටත්-විජිතවාදය, නව යටත්විජිතවාදය, ජාත්‍යන්තර වාණිජ්‍යවාදය, ජාත්‍යන්තර බලවාදය, ත්‍රස්තවාදය ආදී වශයෙන් බලවතා විසින් දුබලයා පෙළීමේ කුමන හෝ ක්‍රමයක් මේ තුළට අන්තර්ගත වෙයි.

අපගේ මව්බිමද ඈත ඉතිහාසයේ සිට විවිධ ආක්‍රමණවලට ගොදුරු වූ බව අප සියලු දෙනා දන්නා කරුණකි. දාඨීය, පීඨීය, කනයමාර, පිලයමාර, කාලිංග, මාග, එළාර, පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි ආක්‍රමණයන් මේ අතර සුවිශේෂ වෙයි. ඊට හේතුව වන්නේ මෙම ආක්‍රමණ නිසා දේශයේ ජනතාව සතු තමා කැමති පාලකයා දේශීයව පත්කොට තමාව පාලනය කරවා ගැනීමේ ස්වාධීන නිදහස් අයිතිය ජනතාවට අහිමි කිරීමයි. වෙනත් වචනයකින් ප්‍රකාශ කළහොත් තමා සතු ස්වාධිපති බලය වෙනත් රටක හෝ පාලකයකුගේ ස්වාධිපති බලයට යටත් කොට ජීවත් වීමට සිදුවීමයි. මෙම දෘෂ්ටියෙන් 1505 පෘතුගීසි, 1658 දී ලන්දේසි පාලකයන්ට නතුව, 1796 සිට මහා බ්‍රිතාන්‍ය රැජිනගේ පරමාධිපත්‍යය නැතහොත් ස්වාධිපති බලයට අප යටත් වූ බව සිහිපත් කළ යුතුයි. එය ඉවත් කොට නැවතත් ශ්‍රී ලංකාවේ ජනතාව ඔවුන් වෙත තිබූ පරමාධි-පත්‍යය යළි ස්ථාපිත කොට නීත්‍යානුකූල කරගැනීමේ දැවැන්ත විප්ලවීය ක්‍රියාදාමය සිදුවුණේ කවදාද, එය රටක් ලෙස, ජාතියක් ලෙස, රාජ්‍යයක් ලෙස, රටවැසියකු ලෙස අතිශයින් වැදගත් කොට සැලකිය යුත්තක් වේ. මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමේ මූලික අරමුණ වූයේ මෙම ප්‍රස්තුත කාරණයයි. එනම් 1972 මැයි 22 දින අපට හිමිවූ ජනරජය හා එහි වැදගත්කම සාකච්ඡා කිරීමයි.

දෙවනුව වැදගත් කාරණය වූයේ උක්ත "ජනරජය" කේන්ද්‍ර කොට නිර්මාණය කරන ලද ශ්‍රී ලංකාව හා එහි සමස්ත සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අනන්‍යතාවය හා පසුබිම මෙයයි යනුවෙන් ප්‍රකාශ කිරීමට නිර්මාණය කොට ස්ථාපිත කරනු ලැබූ "ජනරජ ලාංඡනය" පිළිබඳව විද්‍යාත්මක විග්‍රහයක් ලබාගැනීමයි. ලේඛකයකු ලෙස ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේදී ප්‍රස්තුත කාරණා දෙකක් අභිමුඛව කරුණු විග්‍රහ කොට බැලූ විට ශ්‍රී ලංකාවේ සෑම ලේඛකයකු මෙන්ම සෑම පුරවැසියකුටම ඇති ඒ පිළිබඳ පරම අයිතිය හා අභිමානය මා හටද පොදුවේ තිබුණු නමුත් ඊට එහා ගිය සුවිශේෂ අයිතියක් හා බැඳුණු සුවිශේෂ අභිමානයක්

විශේෂිතව උරුමව ඇති බවද මා හට පසක් වීමයි. ඊට හේතුවූයේ 1972 ජනරජය වෙනුවෙන් නිර්මාණය කළ, එතැන් සිට ඉර-හඳ පවතිනා තුරු ජනතාවට ස්වාධිපති බලය ඇති බව ප්‍රකාශ කොට නිර්මිත ජනරජ ලාංඡනය නොහොත් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය නිර්මාණය කළ නිර්මාණකරුවාණන් මාගේ පියාණන් වීමයි. මෙම සුවිශේෂී අයිතිය හා අභිමානය උරුමව මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමට ලැබීම මාගේ භාග්‍යයක් කොට සලකන අතර මෙය මාගේ යුතුකමක් ලෙසටද සලකමි. එක් අතකින් නිදහස් අධ්‍යාපනයෙන් පරිපෝෂණය වූ පුරවැසියකු ලෙස තම මාතෘභූමිය හා එහි පොදු ජනතාව වෙනුවෙන් කළයුතු අත්‍යන්ත යුතුකමක් ඉටු කිරීමක් ලෙස මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීම සැලකේ. අනෙක් අතට ජනරජ ලාංඡනයේ නිර්මාතෘවරයාණන්ට ගරු කිරීමක් ලෙසට මෙන්ම පීතෘ වන්දනාව කේන්ද්‍ර කොට නිර්මිත ග්‍රන්ථයක් ලෙසටද මෙම ග්‍රන්ථය සැලකිය යුතුවේ.

**ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න**
ලන්ඩන් නුවරදීය.

Indrajith Seneviratne
c/o Kumudu Seneviratne - Studds
No - 33, Pretoria Road,
Leytonstone, Ell 4BB
London.

# අනුමෝදනාව

තම ජීවිත කාලය තුළ සමාජය වෙනුවෙන් කිසියම් කැපකිරීමක් සිදුකරන ලද මිනිසුන් නිසා සැමවිටම බැබලුණේ දේශයයි. අපද කුඩා කල සිටම එවන් චරිත දෙස බලා උගත් දෑ බොහෝය. නමුත් අප රට බොහෝ දෙනා පුරුදුව සිටින්නේ අප රටේ වීරයන්ට වඩා වෙනත් රටවල අය ඇගයීමටය. ඇතැම් විට තම ප්‍රදේශයේ, ගමෙහි හෝ නිවස තුළම ජාතික වීරයකු සිටිනවා වන්නට පුළුවන. නමුත් මේ පිළිබඳව කිසිම තැකීමක් නොකිරීම වරදකි.

පවුලක් ලෙස, ගමක් ලෙස, කණ්ඩායමක් ලෙස, ප්‍රදේශයක් හෝ රටක් ලෙස සිතීමේ වැදගත්කම මතුවන්නේ මෙහිදීය. තම රට දෙයට වඩා බොහෝ දෙනා අගයන්නේ වෙනත් රටක නිෂ්පාදනයන්ය. තම ප්‍රදේශයේ, ගමේ සම්පත් හඳුනා ගැනීමට බොහෝ දෙනා අදක්ෂයෝය. තම පවුලේ අයගේ ගුණ යහපත්කම් ඇගයීම, ඒවාට ගරු කිරීම, ඒවා අනුගමනය කිරීම ආදිය එදා ලාංකික සමාජය සතුව තිබූ ශ්‍රේෂ්ඨ ගුණාංගයෝ වෙති. ඉහත තත්ත්වයන් සැලකිල්ලට ගෙන යම් ආදර්ශයක් ලබාදීමේ අරමුණ මා තුළ ඇතිවිය.

කුඩා කල සිටම මා හැදී වැඩුණු පරිසරය තුළ මා හදවතේ සිටි වීරවරයා සහ වීරවරිය අම්මා සහ තාත්තාය. අම්මා ගුරුවරියක ලෙස සිසු පරපුරක් වෙනුවෙන් කළ මෙහෙයත්, අප පවුලේ උන්නතිය සඳහා කළ අනේකවිධ කැප කිරීමත්, කොළඹ යුගයේ කිවිඳියක් ලෙස අම්මා ලත් ඇගයීම් හා ඇය ඇසුරු කළ කවි පරපුරේ පී. බී. අල්විස් පෙරේරා, යූ. ඒ. ඇස්. පෙරේරා (සිරි අයියා), කුඩලිගම, විල්සන් හැගොඩ වැනි දැවැන්ත සාහිත්‍ය පෞරුෂයන් ඇසුර නිසා ඇය කෙරෙහි තිබූ ගෞරවය සහ ඇගෙන් ලත් ආභාෂය නිසා මෙවන් නිර්මාණ සඳහා ඉඩ ලැබෙන්නට ඇතැයි පිං අනුමෝදනා පෙරටුව සිහිපත් කළ යුතුය.

මාගේ පියාණන් තුළ තිබූ කලා හැකියාව රට, ජාතිය සහ සංස්කෘතික දායාදයන් මෙන්ම පුරාවිද්‍යාව කෙරෙහි තිබූ සුවිශේෂී ලෙන්ගතුකම කුඩා කල සිටම මා විකසිත කරන්නට සමත් විය. බොහෝ සරල ගැමි ගති පැවතුම් උරුම කොට ජීවත් වූ ඔහුගේ

සැහැල්ලු ජීවිතය මා ප්‍රිය කළ බව කිව යුතුය. අප කුඩා කල සිට සිය රාජකාරි සඳහා (සර්කිට්) දින, සති, මාස ගණන් ගතකළ තාත්තා, අප වෙත රැඳී නොසිටියත් ඔහු වෙත තිබූ ගෞරවය එසේ පැවතුණි. ඔහුගෙන් ලත් කලා හා ඉතිහාසය පිළිබඳ පරිචය සුවිශේෂී වෙයි. එසේම මා කුඩා කළ තාත්තා විසින් අප පාසලේ චිත්‍රපට දර්ශන පවත්වමින් පුරාවිද්‍යා ස්මාරක, ඉතිහාසය ආදිය ගැන කළ දේශනා මාගේ මතකයේ ඇත. පාසලේ අනෙක් මිතුරන් ඉදිරියේ මා හට ඒ තුළින් ප්‍රසාදය පුංචි හදවතට ආශිර්වාදයක් වූ බව කිව යුතුය.

කෙසේ වුවද අප අසල සිටි වැඩිහිටියන්, ගුරුවරුන් ආදීන් "ඔයාට වටිනා අම්මෙක්, තාත්තෙක් ඉන්නවා" යනුවෙන් කළ ප්‍රකාශ තුළින් මා ප්‍රත්‍යක්ෂ කරගත්තේ සාමාන්‍ය මව්-පියණට අදාළ ගුණයන්ට වඩා සුවිශේෂ වූ ගුණයක් ඔවුන් දෙදෙනා තුළ ඇති බවකි. ඒ හෙයින් ඔවුන් තුළ ඇති විශේෂි ගුණයන් දිනයක ඇගයීමට පාත්‍ර කිරීම පිළිබඳ අවශ්‍යතාවක් මාගේ යටි හිතේ තිබූ බව පැහැදිල කරුණකි මෙනිසා එදා සිට එම ගුණයන් මා හදවතට ඇතුළු කළ සියලු දෙනාට පිං අනුමෝදනා කළ යුතු වේ.

එල ඇති ගස්වලට ගල් ගසන බව මා හොඳින් දැන සිටියේය. මේ හෙයින් තාත්තා සුදුස්සා වුවද ඔහුට නොලැබී ගිය දේ බොහෝය. ඔහුට බැණ වැදුණු අයද විය. මේ සියල්ලට වඩා ඔහුගේ නිර්මාණයන්ට තමන්ගේ නම් දමා ගැනීමට උත්සාහ කළ අයද සිටිය අතර මොවුන් අතර ගිහි-පැවිදි අයද සිටි බව ඉතා සංවේගයෙන් යුතුව පැවසිය යුතුවේ. අටලෝ දහමට නොසැලෙන හදවතක් උරුම වූ තාත්තා ඒ දෙස මෛත්‍රී සහගතව බලා සිටියා විනා කිසිවක් ප්‍රකාශ නොකළේය. මෙයම ඔහුගේ පසුකාලීන පාඩුවලටද හේතු විය. මේ හෙයින් මා පියාණන්ට පහර ගැසූ සියලු දෙනා ඒ පහරත් සමඟ මෙම ග්‍රන්ථ සම්පාදනයට කිසියම් දිරියක්, පෙළඹවීමක් මා වෙත ප්‍රදානය කරන්නට යෙදුණි. ඒ නිසා ඒ සියලු දෙනාට මම මෛත්‍රී සහගතව ස්තුති කරමි.

මා පියාණන් විශ්‍රාම සුවයෙන් සිටින 1980 දශකයේදී ජනරජ ලාංඡනය නිර්මාණය පිළිබඳව කල්පනා සඟරාවේ විවාදයක් හටගති. එවකට එහි කර්තෘ ධුරන්ධර ගුණදාස ලියනගේ ගුරීන් මේ පිළිබඳව තම උනන්දුව වඩාත් යොමු කරමින් උසාවියක නඩු විනිශ්චයක

ස්වභාවයෙන් එයට අදාළ සාක්ෂි කැඳවන ලදී. ලිඛිත මෙන්ම වාචික සාක්ෂිද විත්තිකරු වූ මාගේ පියාණන් සතුව බොහෝ තිබුණි. එවකට නූතන මහාවංශයේ කර්තෘ තුමන් වූ මහාචාර්ය හෙට්ටිආරච්චි, මහගමසේකර වැන්නවුන් මෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දින සටහන් වාර්තා පවා අදාළ සාක්ෂි ලෙස ඉදිරිපත් වූ නමුත් කර්තෘතුමා ඒ සියල්ල වෙනුවට එක් සාක්ෂියක් පමණක් කල්පනා සඟරාවේ පළ කරන්නට යෙදුණි. ඒ 1972 ජූනි 05 වෙනි දින "දවස" පුවත්පතේ කතුවැකියයි. ඉතිරි සාක්ෂි ප්‍රකාශන සියල්ල අද දිනත් මේ ලේඛකයා සතුවේ. එය එසේ සුරක්ෂිතව තබාගන්නා මෙන් එතුමා එදා විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් වූ මාගෙන් කළ ඉල්ලීම කොතරම් වටින්නේදැයි මා හට ප්‍රත්‍යක්ෂ වූයේ මේ ග්‍රන්ථය සම්පාදනය කරන මොහොතේදීය. එතුමාට ගෞරවයක් ලෙස ඒ සාක්ෂිය මෙහිදීද පළකරමි. මෙම කාර්යයේදී කල්පනා කර්තෘතුමන් සහ මපියාණන් සම්බන්ධීකරණය කළේ අප සියලු දෙනාටම නිබඳ උදව් උපකාර කළ ලේඛකයන්ගේ, කලාකරුවන්ගේ, බුද්ධිමතුන්ගේ, මහා සංසරත්නයේ අයිතීන් ගැන නිතර සොයා බලා කටයුතු කළ, මේ වනවිටත් එම කාර්යය සිදුකරමින් පවතින ප්‍රවීණ ලේඛක සෝමසිරි කස්තුරිආරච්චි මැතිතුමන්ය. එතුමාණන්ට ස්තුති කිරීමටත්, ගුණදාස ලියනගේ මැතිඳුන්ට පිං අනුමෝදන් කිරීමටත් මෙය අවස්ථාවක් කරගනිමි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මා පියාණන් සේවය කළ කාලසීමාව තුළ මෙන්ම ඊට පෙර, පසු ආදී වශයෙන් පියා විසින් දැඩි ආදරයෙන්, ගෞරවයෙන් නිතර සිහිපත් කරන්නට යෙදෙන කීපදෙනෙකි. මේ අය අතර තම පණ මෙන් ආදරය කළ, ගෞරවය කළ දිවංගත මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් ප්‍රමුඛ සහකාර පුරාවිද්‍යා කොමසාරිස්වරයකු වූ ජයන්ත උඩුවර, වෛද්‍ය රන්ජන් අබේසිංහ, කලාශූරී ජෝ දඹුළුගල ආදීන් හට පිං අනුමෝදන් කොට ගෞරවයෙන් සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

මාගේ පියාගේ සේවා කාලය තුළ සිට මේ වනතෙක් ඔහු වෙත අසීමිතව ආදරය කළ, එසේම පියාණන්ද අතිශයින් ගරු කළ මවිසින් මෙම ග්‍රන්ථය සම්පාදනය කරන අදහස කියූ විට අසීමිත සතුටකින්

එම අදහසට විවරණ ලබාදුන් මෙන්ම, මෙම ග්‍රන්ථයට පෙරවදන සම්පාදනය කළ හිටපු පුරාවිද්‍යා කොමසාරිස් මෙන්ම මධ්‍යම සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ජනරාල්, දැනට මොරටුව විශ්වවිද්‍යාලයේ කුලපති ධුරන්ධර ආචාර්ය රෝලන්ඩ් සිල්වා මැතිතුමාණන් හට ශීර්ෂ ප්‍රණාමයෙන් සහ හදබැති සෙනෙහසින් යුතුව ස්තුති කරමි.

මාගේ පියපස, මව්පස සමස්ත ඥාති පරපුරට මෙන්ම විශේෂනේම පියාණන්ගේ සතුට උදෙසා විශේෂ අවධානයෙන් ක්‍රියා කළ, වරෙක එතුමාණන්ගේ පුරාවිද්‍යා රේඛා සහ සටහන් ප්‍රදර්ශනයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී ප්‍රදර්ශනය කිරීමට පුරෝගාමී වැඩ කොටසක් සිදුකළ අප පවුලේ අය කෙරෙහි අසීමිත සෙනෙහසින් යහපතම උදෙසා උපදෙස් ලබාදෙන අප ඥාති සොයුරු පේරාදෙණි විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ මහාචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත් අයියාටද ශීර්ෂ ප්‍රණාමයෙන් ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. එසේම මෙම ග්‍රන්ථය සම්පාදනයට සෑම දිනම දුරකතනය ඔස්සේ මා උනන්දු කළ, අනේක උදව් උපකාර සිදුකරමින් මා දිරිමත් කළ පරිගණක ඉංජිනේරුවරයකු මෙන්ම ඇමෙරිකාවේ "නාසා" අභ්‍යවකාශ ආයතනයේ පරීක්ෂණ කණ්ඩායම් සහායකයකු ලෙස තේරී මුළුමහත් ශ්‍රී ලංකාවට මෙන්ම අප පවුලේ සියලු ඥාතීන්ට කීර්තිය අත්කර දුන්, දැනට ඇමෙරිකාවේ පදිංචි වුලාන්ත විජේසුන්දර ඥාති සොයුරාණන් හදබැති සෙනෙහසින් යුතුව ස්තුති පූර්වකව සිහිපත් කරමි. එසේම මා පියාණන්ගේ සෑම කටයුත්තකදීම සෙවණැල්ලක් සේ අප පවුල සමඟ එක්ව කටයුතු කරන ආර්ථික විද්‍යා විශේෂඥවරයකු වන අතුල චන්ද්‍රසිරි මාමාටද, නැන්දාටද, තාරකා විද්‍යාඥ අසේල ධර්මසිරිවර්ධන මාමාටද මෙහිදී ස්තුති කරමි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සිටි සියලුම කොමසාරිස්වරුන් මපියාණන්ට හොඳින් සැලකූ බව හෙතෙම කියයි. මේ සියලු දෙනා අතර මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය රෝලන්ඩ් සිල්වා සුවිශේෂ බව ඔහු ප්‍රකාශ කරන්නේ නෙත් කඳුළු පුරවාගෙනය. විටෙක සහකාර කොමසාරිස් ධුරයක් දැරූ ජයන්ත උඩුවර මැතිඳුන් මගේ පියාගේ අති කල්‍යාණ මිත්‍රයෙක් වූ බව නම් මතකය. එසේම

වර්තමාන පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ධුරන්ධර ආචාර්ය සෙනරත් දිසානායකයන් මා දුටු සැණින් ඉතා ලෙන්ගතුව මා පිළිගත්තේ මපියාණන් නිතර හමුවන මිත්‍රයකු පරිද්දෙනි. එසේම මේ සියල්ල සම්බන්ධීකරණය කරමින් මා හට මහත් ලෙස පිහිට වූ සුවිශේෂම පුද්ගලයා වූයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) ප්‍රසන්න රත්නායක මැතිතුමන්ය. මේ සියලු දෙනාටත් එහි කාර්ය මණ්ඩලයටත් මාගේ අවංක ආදර ස්තුතිය මෙසේ පුද කරමි.

ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂිකා ආචාර්ය සරොජිනී වෙත්තසිංහ මැතිනිය සහ සහකාර අධ්‍යක්ෂ සරත් කාරියවසම් මැතිතුමන් අදාළ කාර්යයේදී මා හට අවැසි දේ සොයා දීමට ගත් සහෝදරත්වයේ උත්සාහයට අනේකවාරයක් ස්තුතිවන්ත වෙමි. එසේ නොවන්නට මා හට කැප කිරීමට සිදුවන කාලය විශාලය. එහි මහජන සම්බන්ධතා අංශයේ සුරේන් අතුකෝරාල, නිරෝෂන්, සෆ්රාස්, අසංක යන මහත්වරු මෙන්ම ශ්‍රියානි මහත්මියත්, සෙවීමේ අංශයේ සුනීතා ගුරුගේ මහත්මියත් යන අය සහාය නොදෙන්නට තවමත් එහි ඇති විශාල ප්‍රමාණයක ලියකියවිලි පුරව පුරවා අවශ්‍ය ලේඛන පිටපත් ලබාගැනීමට තව සති ගණනක් ගත කරන්නට සිදුවනු ඇත.

මාගේ සියලු කටයුතුවලදී මා හට දැඩි සෙහෙනහසින් දිරිමත් කරන මා මිත්‍ර හිටපු මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය, වර්තමානයේ පිලිපීනයේ මහ කොමසාරිස් ධුරන්ධර නාවලගේ බැනට් කුරේ මැතිඳුන්ටද, පිය සෙනෙහසින් යුතුව මාගේ විශ්වවිද්‍යාල ජීවිතයේදී මට දිරිය දෙන මහාචාර්ය අනුර වික්‍රමසිංහයන්ටද, මා හොඳින් තේරුම් ගෙන අවශ්‍ය සියලු තැන්හිදී උදව් උපකාර කළ ලයිසියම් ජාත්‍යන්තර පාසල් ජාලයේ අධ්‍යක්ෂ මොහාන් ලාල් ග්‍රේරු මැතිඳුන්ට සහ කුමාරි ග්‍රේරු මැතිණියටද, එම ආයතනයේ ඉන්දික සහ භාසිත මහතුන්ටද සහෝදර ප්‍රේමයෙන් අප පවුලේ සියලු කටයුතුවලදී සෙවණැල්ලක් මෙන් ක්‍රියා කරන බස්නාහිර පළාත් සභා මන්ත්‍රිනී අශෝකා ලංකාතිලක මෙනෙවියටද, පසුවදන සපයමින් සෑමවිටම මා දිරිමත් කරන ප්‍රවාහන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඒ. සපුමාන්න මැතිඳුන්ටද, ඉංජිනේරු බණ්ඩාර මැතිඳුන්ටද, රත්මලාන ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය මධ්‍යස්ථානාධිපති බී. එම්. රනිල් මැතිඳුන් ප්‍රමුඛ ජයවර්ධන, ප්‍රියන්ත, නිරෝෂන්, ඇන්ටන්, අමල්, උදයකාන්ත, කපිලදේව, සුමිත් යන උපදේශක මණ්ඩල සාමාජිකයන් ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටද,

එහි හේරත් මහතාටද, මා කල්‍යාණ මිත්‍ර පියසිරි, ධම්මික මහතුන්ටද, ශ්‍රියාවන්ත අයියාටද තුති මල් පිරිනැමීමට මෙය අවස්ථාවක් කරගනිමි.

මාගේ ප්‍රථම ග්‍රන්ථයේ පරිගණක සැලසුම් කළ මේ ග්‍රන්ථය සඳහාද නිබඳවම එම වගකීම භාරගත් මා මිත්‍ර උපුල් ධම්මික මහතාට සහ මෙම ග්‍රන්ථය මුද්‍රණය කළ ප්‍රියන්ත පිලිප් ශාන්ත යන මහතුන්ට සහ එම ආයතනයේ කාර්ය මණ්ඩලයටද, මා හට නත් අයුරින උපකාර කළ හිල් හවුස් අධිපත ලසන්ත මල්ලීටද, නීල් චාමිකර මල්ලීටද, ඡායාරූප සංස්කරණය කර දුන් සජීව මල්ලීටද මාගේ අවංක ස්තුතිය පුදකර සිටිමි.

මාගේ ජීවිතයේ බොහෝ කටයුතුවලදී මූල්‍යමය ශක්තියෙන් මා දිරිමත් කළ මහජන බැංකුවට සහ වසර 49 පිරුණු දා යහපත් ගනුදෙනුකරුවකු ලෙසට මා සම්මානයට පාත්‍ර කළ කොටිකාවත්ත මහජන බැංකුවේ කළමනාකාර එස්. බී. විජේසිංහ මහතාටද, නියෝජ්‍ය කළමනාකාර එච්. බී. ජේ. ක්ලෙමන් මහතාටද, එම්. චරිත් ප්‍රනාන්දු මහතාටද, ජී. ඒ. එස්. දයානන්ද මහතා සහ එම්. ඒ. මාලනී මහත්මිය ප්‍රධාන එහි සියලුම සේවක මණ්ඩලයටද, අදාළ බැංකුවේදී මාගේ පියාගේ ගුණ නිතර ගායනා කළ හිටපු කළමනාකාර ඥානසිරි මැතිතුමාටද, ලංකා බැංකු ජාලයේ සහකාර සාමාන්‍යාධිකාරී (උපකාරක සේවා) කේ. ටී. කරුණාරත්න මැතිඳුන්ටද මාගේ හද බැති ප්‍රණාමය පළකර සිටීමටද මෙය අවස්ථාවක් කරගනිමි. එසේම පීපල්ස් ලීසිං සමාගමේ එස්. කේ. අනුරාධ තරුණ මහතාවද මෙහිදී සිහිපත් කරමි.

කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලයේ අධ්‍යාපනය ලත් මා හට මා-පිය සෙනෙහසින් අකුරු කියවූ දිවංගත නියෝජ්‍ය විදුහල්පති එච්. එම්. ගුණපාල ගුරු පියාණන් ප්‍රමුඛ මාගේ සෑම ග්‍රන්ථයක්ම දොරට වැඩීමේදී නිබඳ සහාය ලබාදුන් දැනට අප විද්‍යාලයේ විදුහල්පති ධුරන්දර ආචාර්ය අශෝක සේනානි හේවගේ මැතිඳුන් හා සියලුම ගුරු මව්පියතුමන්ලාට මෙන්ම විශ්වවිද්‍යාලයේ සිට මේ දක්වා මට ගුරු වූ සියලු දෙනාටද, මා හට උපදේශකත්වය සපයන පූජ්‍ය හාරිස්පත්තුවේ ආරියවංශාලංකාර ස්වාමීන් වහන්සේ, කළුතර දිසාවේ ප්‍රධාන සංඝනායක මාරපන විජිත ස්වාමීන් වහන්සේ, බස්නාහිර පළාතේ උප ප්‍රධාන සංඝනායක පොත්තේවෙල විනීත ස්වාමීන් වහන්සේ, ගොතටුව ශ්‍රී ඥානවිමලාරාමාධිපති මහර ධම්මදස්සි ස්වාමීන් වහන්සේ, දැනට නවසීලන්තයේ ලංකාරාමාධිකාරී ලෙස වැඩ වාසය කරන අපේ ප්‍රඥාසිරි ස්වාමීන් වහන්සේ, හිටපු


විදුහල්පති පූජ්‍ය පණ්ඩිත උපරතන ස්වාමීන් වහන්සේ, සහ පොළොන්නරුව කඹලවැව ශ්‍රී ජිනේන්ද්‍රාරාමාධිපති ගල්පෝරුයායේ ප්‍රදීපවංශ ස්වාමීන් වහනසේ ප්‍රමුඛ සෙසු පූජ්‍ය පක්ෂයටද මාගේ නමස්කාර ප්‍රණාමය පුදකර සිටිමි.

මාගේ පියාණන්ගේ මෙන්ම මව්තුමියගේ ජීවිතයේ පැවැත්ම පිළිබඳව නිබඳව වගකීමෙන් ක්‍රියාකරන විශේෂඥ වෛද්‍ය රුවන් ඒකනායක, විශේෂඥ වෛද්‍ය චන්දිම ද මැල්, විශේෂඥ වෛද්‍ය මකුලොලුව, වෛද්‍ය කරුණාරත්න හා වෛද්‍ය ජූඩ් ජෙරාඩ් හා වෛද්‍ය නයනා ද සිල්වා යන මැතිතුමන්ලා හා මැතිනියන්ට අපගේ තුති පිරිනැමීමට මෙය අවස්ථාවක් කරගනිමි.

බිතුසිතුවම් රූ මෙන් නොසැලී සහෝදර ප්‍රේමයෙන් මා සනහාලන නිබඳ මව්-පිය සෙනෙහසුත්, ඔවුන් සුවපත් කිරීමේ උදාර පිංකමත් වගකීමෙන් භාරගෙන කටයුතු කරන ආදරණීය කමනි අක්කාටද, දූ දරු සම්පත තුරුළු කොට සතුටින් ජීවත්වන නෙළුම් අක්කාට හා ආනන්ද අයියාටද, විශේෂයෙන්ම මෙම ග්‍රන්ථය ලිවීමට අවශ්‍ය පසුබිම සැකසීමට සහ මාගේ විවේකය හා ඒ සඳහා අවශ්‍ය දැනුම ලබාගැනුම උදෙසාම මා එංගලන්තයට ගෙන්වා ගත් මේ සියල්ල සඳහා විශාල වියදමක් දැරූ මාගේ ආදරණීය කුමුදු අක්කාට සහ කෙවින් අයියාටද, අප පවුලට නිබඳ ශක්තියක් වූ අශෝක අයියා සහ ලලිතා අක්කාටද, අප නිවසේ සෙවණැල්ලක් සේ රැඳෙමින් අප සියලු දෙනා පිළිබඳ සොයා බලන නන්දාවතී මහත්මියටද, මාගෙන් අධ්‍යාපනය ලබන, ඇතැම්විට මා වෙනුවෙන සුවිශාල කැපවීම් කරන සහ විටෙක මා වෙනුවෙන් කඳුළු සලන ලයිසියම් තුරුණු පාසලේ, විශ්වවිද්‍යාලයේ හා ජාතික තරුණ සේවා සභාවේ, රත්මලාන ලලිත් ඇතුළත්මුදලි පුහුණු ආයතනයේ මගේම දූලා-පුතාලාටත්, මාගේ ජීවිතයේ සියලු දුක්ඛ දෝමනස්සයන්ට මා සමඟ රැඳෙමින් මා අස්වසාලන රවිඳු කරුණානායක, ප්‍රියන්ත පිලිප්, උදේශ් අනුරාධ, සචිත හර්ෂණ, ශරුස් යන සහෝදරයින්ටද මාගේ අවංක ආදර ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

**ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න**

නො: 845/9, දොඩම්ගහහේන,
ගොතටුව නව නගරය,
අංගොඩ.
දුරඃ071-4400677 - 0777-296688 - 0112410345





අඩසිය වසක් සුවඳ දී වියපත් "නෙළුම් මල"
පුදමි ඔබට මෙසේ....
ලක් පුතකු ලෙස.....

"නෙළුම් මල - ඉපැරණි ලාංකික ගෘහ නිර්මාණ ශිල්පයේ පදනමයි".

- මහාචාර්ය සෙනරත් පරණවිතාන

These books have been collected / purchased and donated by the Association of Sri Lanka Lawyers in The [illegible] to the KURUNEGALA Public Library. UDALAGAMA - JAYAPHIRANA - WIJESUNDERA COLLECTION.

You should not be in possession of this book outside the premises of the library. It would amount to an act of theft if you remove this book from the library. There are no exceptions.

# පිදුම....



ශ්‍රී ලංකාවේ ජනරජ ලාංඡනය
අප සමස්ත ජාතියේම සංකේතයයි.
එය නිර්මාණය කළ තැනැත්තා මෙන්ම
අප රටේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට,
කලාවට සහ සංස්කෘතික උරුමයන්
ජාතියට ආරක්ෂා කරදීමට,
අතිශයින් කැපවී නිහඬව ක්‍රියා කළ
මාගේ ආදරණීය පියාණන්ට සහ
ඔහුට එම ජාතික සේවය
ඉටුකරලීම සඳහා
අප පවුලේ සමස්ත බර කරට ගත්
ආදරණීය මව්තුමියට....

මහජන පුස්තකාලය [illegible]
විමර්ශන අංශය
මහ නගර සභාව
කුරුණෑගල

# පටුන


පිටුව

- පෙරවදන v
- හැඳින්වීම vii
- අනුමෝදනාව xi

1. ශ්‍රී ලංකාව ජනරජයක් වෙත ගිය ගමන් මඟ 23
   - i. ඓතිහාසික පසුබිම
   - ii. ජනරජයක් වීම සහ එහි නෛතික ස්වභාවය

2. අපේ රාජ්‍ය සංකේත හා ජනරජ ලාංඡනය 47
   - i. රාජ්‍ය සංකේතවල ස්වභාවය හා විකාශනය
   - ii. අභිනව ජනරජය සඳහා ලාංඡනයක් නිර්මාණය කිරීමේ කාර්යය
   - iii. ජනරජ ලාංඡනයේ අන්තර්ගත සංකේතවලින් ඉදිරිපත් වූ අදහස් සහ ඇතිවූ ගැටලු

3. ජනරජ ලාංඡනයේ නිර්මාතෘ ඇස්. ඇම්. සෙනෙවිරත්න 93
   - i. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු මට්ටමින් ඔහු කළ ජාතික සේවාවන්
   - ii. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් පසු කළ සේවාවන්

# 1

# ශ්‍රී ලංකාව ජනරජයක් වෙත ගිය ගමන් මග

## ඓතිහාසික පසුබිම

නිශ්චිතව ඉතිහාස සීමාවක් ලෙස සැලකෙන අනුරාධපුර යුගයටත් බොහෝ පෙර සිට ආරම්භව 1505 දක්වාම බොහෝ හැල හැප්පීම් මධ්‍යයේ අපට උරුමව තිබුණේ දේශීය රාජ්‍ය පාලන ක්‍රමයකි.[A]

ප්‍රධාන වශයෙන් ඉන්දියාව ආසන්නයේ පිහිටියද භාරත දේශයට වෙනස්[1] සංස්කෘතික පරිසරයන් උරුම කොට හෙළ ගති සිරිත් හා තම්බපන්නි දේශය විශිෂ්ට කාර්මික දැනුමක් මගින් මෙහෙයවන ලද උසස් මානව සමාජ ක්‍රමයක් පැවතුණි.[2] මෙය වඩාත් ආධ්‍යාත්මීකරණය වන්නේ අනුරාධපුර යුගයේ මිහිඳු හිමියන්ගේ ලංකා ගමනත් සමඟ බව සත්‍යයකි.

---

[A] කතුවරයාගේ "21 වන සියවස ශ්‍රී ලංකාව හා සංවර්ධනය" නමැති ග්‍රන්ථයේ පිටු 1-24 පරිශීලනය කරන්න.

[1] භාරතයේ 'තුලක්‍රමය' ශ්‍රී ලංකාවේ තුල ක්‍රමයට වඩා විශාල වශයෙන් වෙනස් වූවකි. එසේම යාග හෝම හා බ්‍රාහ්මණ ධර්මය ඒ ආකාරයටම ශ්‍රී ලංකාවේ මුල්බැස නොගිය බවද මෙහිලා කිව යුතුය.

[2] ''සීගිරිය'', ''අම්පාර'' ආශ්‍රිත කැණීම්වලින් මතුවූ යපස් උදුන් භාවිත කළ යුගය මෙන්ම ''රාවණ'' පුරාවෘතියද මේ කරුණට අදාළව සාක්ෂි සපයයි. එසේම බුදුන් වහන්සේගේ ලංකා ගමන්වලට අදාළ සාධකද ශ්‍රී ලංකාවේ මානව ශිෂ්ටාචාරයේ දියුණුවට සාධක සපයයි. උදා: ''මැණික් පුටුව''.

මිහිඳු මහ රහතන් වහන්සේ ලංකා ගමනත් සමග ලාංකික ජනතාවට ලැබුණු ප්‍රඥාව සමඟ හෙළ බෞද්ධයාට ලැබුණේ ආර්ථික ශක්තිය සමඟ බද්ධ වූ අතිශයින් හික්මුණු ධාර්මික ජීවිතයකි. මෙය කලා ශිල්ප තුළින් සහ එදා සමාජ ක්‍රමය තුළින් පෙනෙන්නට තිබුනු විශේෂිත ලක්ෂණයකි. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ වැඩමවීම, දන්ත ධාතූන් වහන්සේ මෙන්ම පාත්‍රා ධාතුව රාජ්‍ය උරුමයේ සංකේතය බවට පත්වූ අතර, ශ්‍රී ලංකාවේ දේශපාලනයේ අලිඛිත ව්‍යවස්ථාව බවට පත්වූයේද එම බෞද්ධ චර්යාත්මක උරුමයයි. එදා පැවැති රාජ්‍ය පාලනය පිළිබඳ අටුවාටීකා ලිවීමට මෙම ග්‍රන්ථය ඉතිහාස ග්‍රන්ථයක් නොවේ. නමුත් එදා අපේ පාලන ක්‍රමයේ මූලික හරය පමණක් අවබෝධ කරගැනීම ඉදිරි වටහා ගැනීම් සඳහා අපට වැදගත් වනු ඇත.

අප දිවයිනේ රාජ්‍ය පාලන සංකේතය හෝ බලයේ උල්පත ලෙස (Sorce of Power) එදා ඔටුන්න හෝ නොපෙනෙන දේව නාමයක් තිබුණේ නැත. ඉහත සඳහන් කළ පරිදි බුදුන් වහන්සේගේ උද්දේශික, පාරිභෝගික හා ශාරීරික ධාතූන් වහන්සේලාගේ උරුමය රාජ්‍ය උරුමය ලෙස සංකේතාත්මකව පිළිගනු ලැබීය.

එදා අනුරාධපුර යුගයේ සිට පැවත ආ පාලන හා පරිපාලන ක්‍රමවේදයේ මූලික කේන්ද්‍රීය ලක්ෂණ ගොනු වූයේ "ගම", "ගම් සභාව" (Village Council) මතටය. බටහිර රටක පවා නොතිබුණු ග්‍රාමීය පදනම මත නිවැරදිව ඉදිකරනු ලැබූ ප්‍රජාතාන්ත්‍රික පාලන ක්‍රමයක්[3] අපට උරුමව තිබුණි. එපමණක්ද නොව බටහිර හෝ ඉන්දියානු මොඩලයට දෙවියන්ගේ හෝ මහා බ්‍රහ්මයාණන්ගේ නියෝජිතයා ලෙස අප පාලන රජු පත්වූයේ නැත. ඔහු "ගාමිණී", "පරුමක" හා "මහා පරුමක" ලෙස ග්‍රාමීය පදනමින් පත්වූ ප්‍රජා නායකයෙක් විය. මේ අනුව අපගේ සිහල දීපයේ රාජ්‍ය ප්‍රජා නායකයාට පැවරුණු ප්‍රධාන කාර්යයන් වූයේ තුනකි. ඉන් ප්‍රධානම යුතුකම වූයේ රටේ වැව් අමුණු සාදවා කෘෂිකර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සංවිධානය කිරීමයි. ඒ සඳහා අවශ්‍ය නායකත්වය ජනතාවට ලබාදීමයි. දෙවනුව බුදුදහම පවත්වාගෙන යාමට සහ එය නංවාලීමට අවශ්‍ය පහසුකම් සැලසීම කළ යුතුවූ අතර තෙවනුව රටේ ආරක්ෂාව පිළිබඳ වගකිව යුතු විය. මේ වගකීම් ත්‍රිත්වය සඳහා

[3] මෙම කර්තෘවරයා "21 වන සියවස ශ්‍රී ලංකාව හා සංවර්ධනය" යන ග්‍රන්ථය (2000 පළමු පරිච්ඡේදය 1-22 පිටු) පරිශීලනය කිරීමෙන් මේ ගැන විධිමත් තොරතුරු ලබාගත හැකිය.

මහා පරුමක රජුට ප්‍රධාන උපදේශකයාණන් වහන්සේලා ලෙස ක්‍රියා කළේ බෞද්ධ භික්ෂූන් වහන්සේයි. මෙයින් පෙනී ගිය ප්‍රධානතම කාරණය වූයේ දස රාජ්‍ය ධර්මය අනුව අර්ථයෙන් සහ ධර්මයෙන් රට පාලනය කිරීමේ වගකීම රජුට හිමිවූ බවකි.

එක් අතකින් ආර්ථික රටාව මඟින් බවභෝගවලින් අටුකොටු පුරවාගෙන රං, රිදී, මුතු, මැණික්, ඇත්, දත් ආදී නිර්මාණයන් මඟින් බුදුන් වහන්සේගේ ධර්ම සංකේතයන් නිර්මාණය කරමින් හොඳ වෛද්‍ය ක්‍රම, ඉංජිනේරු ශිල්පය, ජල කළමනාකරණය, වාස්තු විද්‍යාව ඇතුළු මෙකී නොකී විවිධ ශිල්පයන්ගෙන් අනූනව ඉතා බුද්ධිමත් ජනතාවක් හා ධනවත් ජනතාවක් ලෙස ලාංකිකයෝ වසර දහස් ගණනකට පෙර සිට ජීවත් වූ බවට සාක්ෂි එමටය. බොහෝවිට මේ ස්වභාවයෙන් පෙනී යන්නේ හෙළ සිංහල කලාකරුවාගේ කලාත්මක හා විද්‍යාත්මක නිර්මාණ පරිචය පිළිබඳ අවධානය යොමු කිරීමේදීය. ස්වභාවික ජල උද්‍යානයක් ලෙස සීගිරිය නිර්මාණය කිරීමත්, පීඩනය පිළිබඳ නූතන සංකල්ප පවා යොදමින් ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන 'ඇත් පහන'• ආදිය ආසන්නතම උදාහරණ දෙකක් පමණක් ලෙස දැක්විය හැකිය.

මෙලෙස කොතරම් භවභෝග වස්තු සම්භාරයක් තිබුණත් ලාංකික සිංහල බෞද්ධයා ඉතා අල්පේච්ඡිත ජීවිතයක් ගත කළ බව මනාව වැටහේ. විශේෂයෙන්ම ඉපැරණි රජ මාලිගා හා රාජ්‍ය සභා මණ්ඩප දෙස බැලීමේදී ඒවායේ ප්‍රමාණාත්මක බව මෙන් කීප ගුණයක් විශාල වූ ගොඩනැගිලි හමුවන්නේ භික්ෂූන් වහන්සේ අරබයා නිර්මාණය කොට පූජා කළ ගෘහයන් වීම මෙහිලා විශේෂ අවධානයට යොමුවිය යුතුය. ලෝකයේ කිසිදු රටක මෙම සුවිශේෂ ලක්ෂණය හමු නොවෙයි. රජ මාලිගා, සිටු මාලිගා, පවුරු, බලකොටු ආදිය සුවිශාල ලෙස ඉදිකිරීමට බොහෝ රටවල අධිරාජ්‍යයන් මෙන්ම දිග්විජයට යොමුවූ සියලු දෙනා විසින් සිදුකරන ලද්දකි.

ශ්‍රී ලංකාවේ ඉපැරණි රාජ්‍ය පාලන ක්‍රමය අනිවාර්යයෙන්ම දැඩි ප්‍රජාතාන්ත්‍රික මහජන සහභාගිත්වයෙන් යුතු පාලන ක්‍රමයක් වීමට ප්‍රධාන හේතුවක් බලපෑ බව කිව යුතුයි. එනම්, රජතුමාගේ ආරක්ෂාවට සහ රාජ්‍ය සේවය සඳහා කැපවූයේද, එමෙන්ම හදිසි අවස්ථාවකදී යුද හමුදාව ලෙස සකස් වූයේද සාමාන්‍යයෙන් එක් පවුලක පිරිමියා

•දැදිගම කොටවෙහෙර ඇත් පහන. දැදිගම කොටවෙහෙර ආචාර්ය සී. ඊ. ගොඩකුඹුරේ ශූරීන්ගේ ග්‍රන්ථය පරිශීලනය කිරීම සුදුසුය.
Memoris of the Archaeological Survey of Ceylon Volume - viii Published by the Department of Archaeolgy Colombo. - Ceylon 1969.

කොටසක්ම වීමයි. එනම් මොවුන් පඩි බැගින් වූ මහජනයාගේ නැත. රාජ්‍යකාරී ක්‍රමයට තම සේවය රටට ලබන හමුදාවක් වූයේ කිසිදු පාලන ක්‍රමයක දක්නට නොලැබුණි. ලබා දුනි. මෙය ලෝකයේ පඩි ගෙවන හමුදාවක් වූයේ නම් එම හමුදාව එයට හේතුව වූයේ පතුරුවාලීම සහ ජනතාව පීඩනයට ලක් කිරීමට ලවා තම බලය හැකිවීමයි. නමුත් මෙහිදී ජනතාවගෙන්ම ලැබෙන සේවය රජුට විරුද්ධව පාවිච්චි කිරීමේ ඉඩ ඇහිරුණි. එසේම බෞද්ධ ජනතාවට ශික්ෂණය ආදිය නිසා දේශීය රජවරුන් කෲර ලෙස ක්‍රියා කිරීමේ ගැඹුරු බව ඉතා අඩුවූ බවද ප්‍රකාශ කළ යුතුය. එසේම රජු දේවත්වය ආරූඪ නොකිරීම හා සාමාන්‍ය ප්‍රජා නායකයකු බවට පත්වීම තුළ සහ **"ගම් සභාවේ"** ක්‍රියාකාරීත්වය තුළ ශ්‍රී ලංකාවට අදාළ සුවිශේෂ ප්‍රජා පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වූ බව මෙහිලා පැවසිය යුතුය. මෙයද පාලකයාගේ බලය අඩු කිරීමට බලපෑ විමධ්‍යගත ක්‍රමයකි. මෙම පාලන ක්‍රමයේ නායකත්ව සංකේත වූයේද මුලදී සඳහන් කළ බුදුන් වහන්සේගේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ පාත්‍රා ධාතුව හෝ දන්ත ධාතුන් වහන්සේගේ හිමිකාරීත්වයෙනි.

"මාගේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිසයි...."

ලෙසට දුටුගැමුණු රජතුමා කළ ප්‍රකාශය ඉහත සඳහන් රාජ්‍යයේ ස්වභාවයට සංක්ෂිප්ත ලෙස කළ අර්ථ දැක්වීමක් බඳුය.

බුදුදහමෙන් ලක්වැසි ජනතාව තුළ හැදුණු වැඩුණු අල්පේච්ඡිත බව මෙන්ම භවභෝග වැඩි දියුණු කරගැනීමෙන් ආර්ථිකයද ශක්තිමත්ව පවත්වාගෙන යමින් දානමානාදිය දෙමින් බණ අසමින්, භාවනා කරමින් සිදුකළ සමාජ පැවැත්ම අවසානදී ලාංකික පොදු ජනතාවගේ සංස්කෘතික මූලය (Cultural root) බවට පත්ව ඇති බව සිතිය යුතුය. එතැන් සිට ශ්‍රී ලංකාව නියෝජනය කරන කුමන සංකේතයක වුවද මෙම හෙළ-බොදු සංස්කෘතික මූලයේ නියෝජනයන්[4] අනිවාර්ය විය. මෙනිසා බිහිවූයේ **දේශීය ප්‍රජාතාන්ත්‍රික රාජ්‍ය ක්‍රමයකි.**

නූතන පාලන ක්‍රමයන්හි තිබෙන, තිබිය යුතු යැයි අපේක්ෂිත බොහෝ කාරණා එදා පාලන හා පරිපාලන ක්‍රමයන් තුළ අප රටේ

[4] "දේශීය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යත්වය" - මෙම වචනය බටහිර උගතුන්ට නම් හාස්‍යය උත්පාදක, විසන්වාදී ආණ්ඩුක්‍රම ද්විත්වයකි. ඔවුන්ට අනුව "ප්‍රජාතන්ත්‍රවාදී පාලනය" එකකි, "රජුගේ පාලනය" තව එකකි. නමුත් මේ පිළිබඳව නියම විග්‍රහයක් අවශ්‍ය නම් කර්තෘගේ "21 වන සියවස ශ්‍රී ලංකාව හා සංවර්ධනය" ග්‍රන්ථයේ පළමු පරිච්ඡේදය අවධාරණයෙන් කියවන්න.

පැවතුණි. ග්‍රාම, නගර, ජනපද, මඬුලු (මණ්ඩල) වෙත ප්‍රාදේශීය පාලනයත්, රුහුණු, මායා, පිහිටි රට ආදී වශයෙන් පළාත් පාලනයත් ලෙස බලය විමධ්‍යගත කළ (Decentralization) පාලන ක්‍රමවේදයක් පැවතුණි. බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමයේ පවා පදනම් සකස් කළ සම්ප්‍රදායයන් (Conventions) මත ගම්සභා ක්‍රමයේ බොහෝ ක්‍රියා ව්‍යූහයන් සකස් වී තිබුණි. එසේම ජනතා සහභාගිත්වය (Participi-pation of the People) වැනි නූතන ප්‍රජාතාන්ත්‍රික මූලධර්මද ක්‍රියාත්මක විය. එපමණක්ද නොව 'නීතියේ හා බලයේ' උල්පත (Source of Power) ලෙස සැලකුණේද ජනතාවගේ බලයම බව පැහැදිලිය. මෙසා සුවිශේෂ වූ නූතන ලෝකයට ගැලපෙන පාලන රටාවක් තිබූ තම්බපන්නිය, සිහල දීපය පසුකාලීනව විවිධ ආක්‍රමණ බලපෑම්, සිවිල් යුද අරගලයන්ට මුහුණ දුන් බව පෙනී යයි. කොයිතරම් ගැටලුකාරීත්වයක් තිබුණත් 1505 පෘතුගීසීන් පැමිණෙන තුරුම ලාංකික සංස්කෘතික හරය ලෙස සැලකුණු සිහල-බොදු ලක්ෂණයන්ට ප්‍රහාරයක් එල්ල කිරීමට නොහැකි වූ බව පැහැදිලිය. නමුත් විදේශීය පඩි ගෙවන සොලී හා මලබාර් හමුදා දිවයිනට ගෙන්වා ගැනීමද, ඉන්දියානු ආක්‍රමණ, අභ්‍යන්තර අරගෙල සහ විවිධ විපත් (බැමිනි තීය මහා සාය) ආදි නිසා දේශීය සමාජ, ආර්ථික හා දේශපාලනික ලක්ෂණයන් තුළ තිබූ ප්‍රබලත්වය දුර්වල වුවද නැවත ඒවා යථා තත්ත්වයට පත්වූයේ ''ජන විඥානය'' **තුළ ශ්‍රී ලාංකික සංස්කෘතික හරය කැපී පෙනුණු හෙයිනි.** මෙකී ලක්ෂණයන්ට දරුණු ප්‍රහාරයක් එල්ල වූයේ 1505 දී පෘතුගීසීන්ගේ ආධිපත්‍යයට අප නතුවීමත් සමගය.

1505 පසු සිදුවූයේ කුමක්ද? එතෙක් පැවති බෞද්ධ ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යාණ්ඩුව ''හෞතීස්ම'' වූ අතර කෝට්ටේ රාජධානිය සමඟ මුහුදුබඩ පළාත් පෘතුගාල රජතුමාගේ පාලනයට නතුවීමයි. මෙහිදී පෘතුගීසීන් දොන් ජුවන් ධර්මපාල නමින් රූකඩ රජෙකු හෞතීස්ම කිරීමෙන් සිදුකළේ හුදු රටේ පාලන බලය ලබාගැනීමට නොවේ. නීතියේ උල්පත (Source of Power) සහ ස්වාධිපත්‍ය බලය (Sov-ereignty) කේන්ද්‍රගත වූ බෞද්ධ සිංහල පදනම ඉන් ඉවත් කිරීමයි. **එනිසා සිදුවූයේ එතෙක් තිබූ අපේම වූ ''ප්‍රජාතාන්ත්‍රික දේශීය රාජාණ්ඩුව'' වෙනුවට බටහිර කතෝලික ''ඒකාධිපති රාජාණ්ඩුවක්'' අපේ පාලනය තුළට සංක්‍රමණය වීමයි.**

මුලදී අපේ අයවලුන් හා එක්ව වාණිජ්‍ය ක්‍රියාවලියක් පවත්වාගෙන යන මුවාවෙන් ඔවුන් රවටා කුරුඳු, කරාබුනැටි, එනසාල්, ගම්මිරිස් ආදිය තුළින් අරඹා ක්‍රමානුකූලව අලි, ඇතුන් මරවා උන්ගේ දළ, මුතු, මැණික් හා නොයෙක් කෞතුක වස්තු කොල්ලකන තත්ත්වයට පත්වීම ගැන නිවැරදිව ඉතිහාස පොත්වලින් කරුණු හොඳහැටි සොයාගත හැකිය. මෙහිලා වඩාත් දරුණුම ක්‍රියාදාමයන් කීපයක් පෘතුගීසි සංක්‍රමණයත් සමඟ සිදුවිය. පළමුව එතෙක් මෙතෙක් සේද මාවත අනුසාරයෙන් අපට උරුමව තිබූ ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනු පෘතුගීසීන්ගේ ආධිපත්‍යය හා බලාධිකාරය තුළට නතුව ඔවුන් සමඟ පමණක් ගනුදෙනු කළයුතු ඒකාධිකාරී වූද, අනිවාර්ය වූද, වෙළෙඳ ද්‍රව්‍ය සැපයීමේ මූලස්ථානයක් බවට ලංකාව පරිවර්තනය වීමයි. මෙයින් දේශීය මුහුදුබඩ ජනතාවගේ ආර්ථිකයට සුවිශාල පහරක් එල්ල වූ අතර මධ්‍ය කඳුකර ජනතාව යම් ප්‍රමාණයක පීඩනයකට ලක්වූයේද සියලු නැව් තොටවල ආධිපත්‍යය ඔවුන්ට නතුවීම නිසාවෙනි.

දෙවනුව ලාංකික ජනතාව වෙත මත්ද්‍රව්‍ය හා තිරිඟු පිටි පුරුදු කිරීමේ සුවිශාල අපරාධය ආරම්භ කළේද පෘතුගීසින් විසින්මය. මේ තත්ත්වය කොතරම් දරුණු වීද යත් මුහුදුබඩ පළාත්වල ජනතාවගේ ආධ්‍යාත්මික නැමියාවන් සම්පූර්ණයෙන්ම නැති කිරීමටත්, පවුල්වල සමගිය නැති කිරීමටත්, සෞඛ්‍ය පරිහානිය කරා ළඟා කිරීමටත්, ඔවුන් විවිධ අපරාධකරුවන් හා තිවටයින් බවට පරිවර්තනය වීමටත්, ලැජ්ජාව, බය යන බෞද්ධ ලාංකික අනන්‍යතාවට සුවිශාල ප්‍රහාරයක් එල්ල කිරීමටත් එය සමත් වීමයි.

තෙවනුව ලාංකිකයන්ගේ අනන්‍යතාව බඳුවූ පිරිවෙන් ආශ්‍රිත අධ්‍යාපන ක්‍රමය වෙනුවට ඒ පිරිවෙන් පන්සල්ම යොදා ගනිමින් කිතුනු පාසල් පවත්වාගෙන යමින් බෞද්ධ වෙහෙර විහාර විනාශ කරමින් හා බලෙන් සිය ආගමට මිනිසුන් නතු කරගැනීමෙන් මෙන්ම විවිධ බදු පැනවීමෙන් ජනතාව තව තවත් දුගී දුප්පත් තත්ත්වයන්ට ඇද දැමීමෙන් හා ඔවුනට පෘතුගීසි නම් ගම් ලබාදීමෙන් මානසික ගැත්තන් හා මිත්‍යා දෘෂ්ටිකයින් කළ මහා පාපයද හොඳින් සිදුකරන්නට යෙදුණි.

සිව්වනුව එතෙක් මෙතෙක් අප හට නොවූ පාලන බලයේ උල්පත පෘතුගාලයේ මහ රජු බවට පත්කිරීම සහ දෙවියන්ගෙන්

වරම් ලබාගෙන (බෞතීස්ම) රාජ්‍ය බලයට උරුමකම් කිව යුතුය යන අතිශයින්ම වරදි ආකල්පය ස්ථාපිත කිරීමයි. නිර්මල බුදුසමය හා රාජ්‍යත්වය අතර තිබූ නෛසර්ගික බැඳීමට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කිරීම මෙසේ සිදුවිය.

මේ ආකාරයට සිය බල අධිකාරිත්වය මුහුදුබඩ පළාත්වල වැපිරීම පුද්ගලයකු අරබයා ඇතිවූ පිළිකාවක් බඳු විය. සමස්ත ශ්‍රී ලංකාවම අත්පත් කර නොගත්තද පෘතුගීසි පාලනය විසින් ව්‍යාප්ත කළ අධිරාජ්‍යවාදී සහ අධාර්මික ප්‍රතිපත්ති තුළින් එතෙක් මෙතෙක් ධාර්මිකව ගලා ආ ශ්‍රී ලාංකික අනන්‍යතාවට නැවත ප්‍රතිසංස්කරණය කළ නොහැකි හානියක් සිදුවිය.

ඉහත පෘතුගීසි ක්‍රියාකලාපය තුළ ඇතිවූ තවත් ප්‍රතිඵලයක් වූයේ ලාංකික බව, සිංහල බෞද්ධකම ලැජ්ජා සහගත කාරණයක් වීමත්, පෘතුගීසි භාෂාව හා අධ්‍යාපනය ලබා එය ඉතා මාන්නයක් කොට සැලකූ සිය ඇදහීම් මිත්‍යා දෘෂ්ටිකත්වයට පරිවර්තනය කළ විදේශීය අධිරාජ්‍ය ගැති ලාංකික පරපුටුවන් පිරිසක් නිර්මාණය වීම සහ ඔවුන් විවිධ නිල, නම්බුනාම හා තාන්න මාන්න ලබාගනිමින් අපේ කමක් නැති ගැත්තන් පිරිසක් ඇතිවීමයි. මෙහිදී එතෙක් ලාංකිකයන් හා වෙළහෙළඳාම් කළ අරාබි ජාතික හා වෙනත් ජාතික මුස්ලිම් ප්‍රජාවද සිය අනන්‍යතාව මත ඔවුනොවුන් හා එක්ව එතෙක් තිබූ ලාංකික ආගමික සහනශීලීත්වය බිඳ දමන ආකාරයේ ගමන් මාර්ගයකට හා ව්‍යාපාරික ජාලයකට අන්තර්ග්‍රහනය වීමද සඳහන් කළ යුතුය.

පෘතුගීසි බලකොටු ආශ්‍රිතව ඒ ඒ බලකොටුවට අදාළ නිල ලාංඡන මෙන්ම ඔවුන්ගේ රජතුමා සංකේතවත් කරන ලාංඡන ආදිය බොහෝ භාවිත වූ බවද කිව යුතුය. එම ලාංඡනවලට ගරු කිරීම එතෙක්-මෙතෙක් බෞද්ධ සංකේතවලට ගරු කළ අහිංසක ජනතාවට සිදුවිය.

1658 සිට ලන්දේසීන්ගේ ආධිපත්‍යය තුළද සිදුවූයේ පෘතුගීසීන්ගේ ක්‍රියාකලාපය වඩාත් වේගවත් වීම පමණි. යුද තත්ත්වයන්වල වර්ධනයක් යුද හමුදා ස්වරූපයේ විශාල මෙහෙයුම් මෙන්ම ඉහත කී සියල්ලම බලහත්කාරයෙන් භීෂණය මවා පා ජීවිත විශාල සංඛ්‍යාවක් විනාශ කරමින් ලන්දේසීන් විසින් සිදුකළ බව ඉතිහාසය දන්නා අප කවුරුත් පිළිගන්නා කාරණයකි. ආර්ථික ආධිපත්‍යය, යුද ආධිපත්‍යය, ආගමික ආධිපත්‍යය ආදිය පතුරුවා

හරින ගමන්ම ලාංකික අනන්‍යතාවන් හා ශක්තිමත් සමාජ පදනමකට හේතුභූත වූ සියලු කාරනා සුනුවිසුණු කිරීමේ බලහත්කාරයෙන් මෙහෙයුම් රාශියක් දියත් කරන ලදී. විශේෂයෙන් අප ගොවි බිම් මුල්වරට වතු වගාවන්ට නතු කිරීමත්, බෞද්ධ ආගමික සිද්ධස්ථාන සුනු විසුණු කිරීමත් මෙහිලා සිදුකළ සාපරාධී ක්‍රියාවන් ලෙස හඳුනා ගැනේ. VOC වෙළෙඳ සමාගම හා ජාත්‍යන්තර වශයෙන් ඔවුන් ලබා තිබූ විශාල නැව් ප්‍රවාහන ජාලය හරහා ලංකාව, ඉන්දියාව මෙන්ම බොහෝ ආසියාතික රටවල සාරය ඕලන්දයට රැගෙන යාමට සමත් වූ බව පැහැදිලිය. කෙසේ නමුත් වාණිජ්‍ය නාගරික ස්ථාන ගත කිරීම් වරායන් හා නැව් තොටවල් සංවර්ධනය කරමින් විශාල වශයෙන් ලන්දේසීන් එතෙක් පැවැති හුවමාරු ආර්ථිකය මූල්‍ය ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමටද ඔවුන් සමත් වූ බව පෙනේ. ලන්දේසි කාසි මෙයට සාක්ෂි සපයයි.

ඒ සියල්ලටම වඩා වැදගත් වන්නේ ඕලන්ද පල්ලි හා විශාල බලකොටු නිර්මාණය කරමින් ඔවුන් සිදුකළ දරුණු මිෂනාරී අධ්‍යාපන ආක්‍රමණයයි. ලාංකික මුහුදුබඩ ජනතාව ප්‍රධානකොට ලාංකිකයින් තුළ මානසික භීතිකාවන් වපුරා දැඩි ආකල්පමය වෙනසක් ඔවුන් තුළ ඇති කිරීමට පෘතුගීසීන්ට වඩා ලන්දේසීන් සමත් වූහ. විශේෂයෙන් ඔවුන් විසින් වාසගම්, භාෂාව, ආගම බලෙන් වෙනස් කිරීමට ගත් අමානුෂික කෲර ක්‍රියාමාර්ගයන් මනුෂ්‍ය සමාජයකට නුසුදුසු ක්‍රියාවන් පවා ප්‍රකට කරන්නට සමත් වූ බවද කිව යුතුය. කෙසේ වෙතත් ඕලන්දයේ රජතුමා විසින් පාලනය කළත් ඔවුන්ගේ VOC වෙළෙඳ සමාගමේ ලාංඡනය ඔවුන්ගේ නිල අනන්‍යතාව ලෙස භාවිත කරන්නට වූ බව සඳහන් කළ හැක.

මේ සියල්ලම පසුකොට 1796 දී බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දියානු වෙළෙඳ සමාගම හරහා මුහුදුබඩ පළාත් යටත් කරගැනීමත් 1798-1802 දක්වා වෙළෙඳ සමාගම වාණිජ්‍යය කටයුතු මෙන්ම බ්‍රිතාන්‍ය මහරජුගේ හමුදාව රටේ දේශපාලන කටයුතු භාර ගනිමින් ද්විත්ව පාලනය උදාවීමත් 1802 සිට බ්‍රිතාන්‍ය කිරීටයේ තනි පාලනයකට මුහුදුබඩ පළාත් යොමුවීමත් ඉන් අනතුරුව 1505 සිට අධිරාජ්‍යවාදීන් විසින් පෝෂණය කළ ආකල්ප හා මතවාද නිසා නිර්මාණය වූ දේශීය පරගැති රදළ ධනපති පන්තිය විසින් දිවයිනේ එතෙක් මෙතෙක් නොවූ විරූ මහා පාවාදීම සිදුකරන ලදී. 1815 දී ගිවිසුමක් මඟින්

උඩරට ප්‍රදේශ භාරදීම සහ අපේ දේශීය රාජ්‍යත්වය විනාශ කර දැමීමත්, එතැන් සිට ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන් බ්‍රිතාන්‍ය කොලනියක් හෙවත් යටත්විජිතයක් බවට පත්වීමේ ඛේදජනක සිදුවීමට පසු ලංකාවේ දේශපාලන, ආර්ථික හා සමාජමය ස්වභාවය වෙනස් වූයේ කෙසේද යන්න විග්‍රහ කළයුතුව තිබේ. මෙම කොලනියේ නියම ස්වභාවය මතුවූයේ 1818 කැරැල්ලට පසුවය.

පෘතුගීසීන් ලන්දේසීන්ට වඩා ඉංග්‍රීසීන්ගේ පාලන කාලය තුළ ඔවුන්ගේ අනන්‍යතාවට අනුව බ්‍රිතාන්‍ය මොඩලයට ලාංකිකයන් නිර්මාණය කිරීමට සමත් වී තිබේ. ලාභදායක යටත්විජිතකරණයත් ඔවුන්ගේ ප්‍රතිපත්ති තුළ තිබුණි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ගොඩනැං-වීමට ආසියා, අප්‍රිකා හා ලතින් ඇමෙරිකානු රටවල (උප ග්‍රහයන්ගේ) සම්පත් මව් ග්‍රහයා වෙත ඉතා සූක්ෂමවත්, ඉහළ ප්‍රතිශතයකින් හා වේගයෙන් උරා ගැනීමට බ්‍රිතාන්‍ය කිරීටය සමත් විය. තම යටත්විජිතයන්හි කෝටි ගණන් සම්පත් බලයෙන් පැහැර ගැනීමේ සිට ඔවුන්ගේ ආර්ථිකය කඩා බිඳ දමා තමන්ගේ යැපෙන්නන් බවට පත්කිරීම නිසා ඇතිවූ නොනවතින ආදායම් මාර්ග තරකර ගැනීම දක්වා මේ ක්‍රියාදාමය දුව යයි. යටත්විජිතයන්හි තිබූ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය මුලිනුපුටා දමා වතු ආර්ථිකයක් ස්ථාපිත කිරීමත්, එම භෝගයන් අත්‍යවශ්‍ය භෝග නොවීමත්, මිල තීරණය කිරීමේ හැකියාව යටත්විජිත රටවලට නොමැතිවීමත් තුළ උප ග්‍රහයන් නොහොත් අප රටවල්වල එතෙක් පැවැති ශක්තිමත් ආර්ථිකය දෙදරවා හැරීමට සහ ඉඩම් අහිමි විශාල ගොවි ජනතාවක් බිහිකිරීම මෙන්ම බොහෝ සාමාජික ප්‍රශ්න දායාද කිරීමට පසුබිම සකස් කරන ලදී.

මෙහි වඩාත් හාස්‍යය නම් අධිරාජ්‍යවාදීන් විසින්ම සංවර්ධනය, සංවර්ධනය වෙමින් පවතින හා අසංවර්ධිත යන මිනුම් පනවා, ප්‍රාථමික කෘෂි ආර්ථිකයක් උරුම කිරීම, දිළිඳුකම ආදී බොහෝ නිර්ණායතයන් දක්වන ලද්දේ ඔවුන් විසින්ම සිදුකරන ලද ක්‍රියාමාර්ගයන්ට වීමයි. බ්‍රිතාන්‍යයන් විසින් අපට උරුම කරදුන් දුම්රිය මාර්ග, මහාමාර්ග, පාලම්, බිංගෙවල් දෙස බලා සමහර පරගැත්තන් උදම් අනතු ලැබූවද, අපට උරුමව තිබූ අපේ අභිමානවත් ආර්ථිකය, සාමාජික, දේශපාලන තත්ත්වයත්, සමාජ ඇගයීම්, ආකල්ප හා සාරධර්මවලට සිදුකළ විනාශය හා ජාතීන් අසමගි කිරීමේ සිට, රටවල් මායිම් වැරදි ලෙස බෙදා දැක්වීම ආදී එකී මෙකී වැරදි ව්‍යසනයන් දෙස බැලූ විට ලැබූ ලාභය අබැටක් නොවටින බව ප්‍රත්‍යක්ෂ වන කරුණකි.

මෙහිදී අපේ අවධානය යොමු වන්නේ ඔවුන් විසින් නිර්මාණය කළ වෙස්මිනිස්ටර් ආකෘතියට අයත් දේශපාලන ක්‍රමයටයි. මුලසිටම බ්‍රිතාන්‍ය විසින් තම සියලුම කටයුතු කළේ පෘතුගීසීන්, ලන්දේසීන් මෙන්ම බ්‍රිතාන්‍ය මහරජුගේ කිරීටයේ නාමයෙනි. දෙවියන් වහන්සේගේ නියෝජිතයා ලෙස පූජ්‍ය අංශයෙන් පාප් වහන්සේ ප්‍රමුඛ පල්ලියටත්, පාලන අංශයෙන් අදාළ රටෙහි රජතුමාටත් තිබූ පිළිගැනීම සංඛේතවත් කෙරුණේ මුතු, මැණික්, එබ්බවූ රණින් නිමකළ ඔටුන්නෙනි. මෙය කිරීටය නම් විය. මෙම කිරීටය බලයේද, රාජ්‍යයේද උල්පත වූහ. මේ අනුව අදාළ රටෙහි ස්වාධිපති බලය අයත් වූයේ එම කිරීටයටයි. මෙනිසාම රාජ්‍යයේ සංඛේතය ලෙසට පාවිච්චි වූයේද රැජිනගේ හෝ රජුගේ ඔටුන්නයි.

එතෙක් අවුරුදු දහස් ගණනක් අපට උරුමව තිබූ අපගේ ජාතික චින්තනය යටපත් කරනු ලැබුවේ මෙම කිරීටයේ නාමයෙන් අපට ලබාදුන් බටහිර ඉංග්‍රීසි අධ්‍යාපන ක්‍රමය මාර්ගයෙන් යැයි කියුවහොත් නිවැරදිය. බ්‍රිතාන්‍යයන් ලෙසට සිතන පතන ආකාරයට අධ්‍යාපන ක්‍රමයක් අප වෙත ලබාදුන් අතර ඒ ඒ රටවල් සිය මව් භාෂාවෙන් දියුණුව ඉදිරියට යද්දී වසර 200 පමණ ඉංග්‍රීසි භාෂාවෙන් දියුණු වීමට නොනවතින අරගලයක අප තවමත් නියුතු වෙමු. නමුත් සාමාන්‍ය පෙළ සිසුන්ගෙන් 2009 වන විටත් 51% ක් පමණ ඉංග්‍රීසි භාෂාව අසමත් වීම හා ඉතා දුර්වල වීම මෙහි ප්‍රතිඵලයයි. මෙහි අනෙක් ඛේදජනක ප්‍රතිඵලය නම් ජපානය, කොරියාව, චීනය, මැලේසියාව, ප්‍රංශය, ජර්මනිය, බ්‍රිතාන්‍යය, රුසියාව යන රටවල් සිය රටවල මව් භාෂාව තුළින් සංවර්ධිත තත්ත්වයන් ළඟාවී සිටියදී අප තවමත් මඟ නොදන අතපත ගාමින් සිටීමයි. ඉන් ගම්‍ය වන්නේ තවමත් අප යටත්විජිත ආකල්ප හා එම මානසිකත්වයෙන් නොමිදුණු වහල් ප්‍රතිපත්ති සම්පාදනයක හිරවී ඇති බව නොවේද?

මෙලෙස ප්‍රකාශ කරන්නට යෙදුණේ දැනට නව යටත්විජිත-වාදයේ සංඛේතය ලෙස ප්‍රකටව පෙනී යනනේ බ්‍රිතාන්‍ය රැජිනගේ ඔටුන්න නොව, ඉංග්‍රීසි භාෂාව සහ කරපින්නාගත් බටහිර අධ්‍යාපන ක්‍රමය බව පහදා දීමටය.

මේ කෙසේ වෙතත් අපට බ්‍රිතාන්‍ය පාලනයේදී විටින් විට ඔවුන්ගේ වාසියට ගෙනා ප්‍රතිසංස්කරණ හේතුවෙන් ව්‍යවස්ථාදායක හා විධායක

සභා ලබාදීමත්, 1910, 1921, 1928, 1931 විවිධාකාරයේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාදීමත් සිදුවූ බව දනිමු. මේ පිළිබඳ විවිධ ලෙස විචාර පළවී ඇති අතර, 1931 ඇතිවූ රාජ්‍ය මන්ත්‍රණ සභාවත් සියලුම මන්ත්‍රීවරු කාරක සභාවලට බෙදී යාමත් රාජ්‍ය නිලධාරීන් තිදෙනා ඇතුළුව කාරක සභා සභාපතිවරු එක්වී ඇමැති මණ්ඩලය සකස් වීමත්, වයස 21 ට වැඩි සියලු දෙනා හට සර්වජන ඡන්ද බලය ලැබීමත් ආදී වැදගත් යැයි සම්මත ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණමය ප්‍රතිසංස්කරණයන්ට පසු වඩාත් සුබදායක ලෙස බ්‍රිතාන්‍ය පරිපාලන ක්‍රමවේදයන් තුළින් අප රටේ ස්ථාපිත වන්නට පටන් ගති.

නමුත් බ්‍රිතාන්‍යයන්ගේ පාලන කාලය තුළ මුල සිටදීම සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ලෙස ජනවර්ග බෙදා ඔවුන්ගේ අයිතීන් වෙන වෙනම සාකච්ඡා කිරීම අතිශයින් සමාව දිය නොහැකි වරදක් සිදුකරන්නට යෙදුණි. මෙම අති භයංකාර ජාතිවාදී බෙදීම හේතුවෙන් ලක්ෂ ගණනක් මිනිස් රුධිරය මත ඉන්දියාව, පකිස්තානය, බංග්ලාදේශය එකිනෙකට වෙන්වූ අතර වසර තිහක යුද්ධයක් දක්වා අභීත ලංකාමාතාව ගෙන ගියේත්,ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ ජීවිත අහිමි වූයේත් බ්‍රිතාන්‍යයන් මෙසේ ජාතිවාදී පදනම යටතේ පාලනය මෙහෙය වීමෙන් සිදුකළ සාහසික අපරාධය නිසාවෙනි.

ඩොනමෝර් ප්‍රතිසංස්කරණයට පසු 1947 ඇති කළ සෝල්බරි ප්‍රතිසංස්කරණයෙන්ද ඔවුන් සිතන පරිදි ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ඇති කළා යැයි සිතුවේ මන්ත්‍රී සංඛ්‍යාව වැඩි කිරීම නිසාවෙනි. නමුත් 1796 සිටම එතෙක් බ්‍රිතාන්‍ය මහරැජිනගේ අධිපති බලය හෝ ආණ්ඩුකාරයා, අග්‍රාණ්ඩුකාරයා යන අයගේ බලය හෝ රාජ්‍ය, මුදල්, නීති නිලධාරීන්ගේ බලතල හෝ බ්‍රිතාන්‍ය රජයට අයබදු අයකිරීමේ බලය හෝ අදාළ රටවලින් ඉවත් නොකළේය. එසේම අධිකරණමය ලෙස නඩු විසඳන ලද්දේද ඉංග්‍රීසි නීති සම්ප්‍රදායයන් අනුව ඉංග්‍රීසි ජාතිකයන් විසින්මය. මේ තත්ත්වයන් තුළ බ්‍රිතාන්‍ය පාලනයේ 'නිදහසක්' හෝ ස්වාධීනත්වයක් හෝ පරමාධිපත්‍යය පිළිබඳ අයිතියක් ලාංකික පාලනයට හිමිවූයේ නැත. මෙනිසාම බ්‍රිතාන්‍ය මහ රැජිනගේ නාමය හා කිරීටයේ රාජ්‍ය සංකේතමය බලතල කිසිදු අඩුවක් නැතිව පැවතුණි. 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක වීමත් සමඟම 1948 පෙබරවාරි 04 වන දින ශ්‍රී ලංකාවට

ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය කරන ලදී. ලංකා ජාතික සංගමය ප්‍රධාන කොට ඇති එවකට සිටි විවිධ මධ්‍යස්ථ හා සාම්ප්‍රදායික බලපෑම් කණ්ඩායම් මෙම ඩොමීනියන් තත්ත්වය ඉතා ඉහළින් අගය කළ බව පැහැදිලිය. ලාංකික යැයි කියා ගන්නා ඒ වනවිට සිටි දේශීය ධනපති පන්තිය බටහිර චින්තනය පෙරටුව කටයුතු කළ අතර ඔවුන් සහ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින් බ්‍රිතාන්‍ය ජාතිකයින්ටත් වඩා හොඳින් බටහිර ගැති චින්තනය ඉදිරියට ගෙනයන බව අතිශයින්ම පැහැදිලි වන්නට විය.

රැජිනගේ ඔටුන්න වෙනුවට ලංකාවේ අන්තිම රජු ශ්‍රී වික්‍රම රාජසිංහයන්ගේ ඔටුන්න ලංකාවේ රජයේ සංකේතය විය. නමුත් 1948 පසුවද ශ්‍රී ලංකා රාජ්‍යයක් තිබුණාද? යන්න ගැටලුවක් විය. එයට හේතුව වූයේ,

1. භූමි ප්‍රමාණයත්, 2. ජනතාවත්, 3. ආණ්ඩුවත්, 4. ස්වාධිපත්‍යයත් යන සිව් වැදෑරුම් කරුණු රාජ්‍යයක අවශ්‍යතා විමයි. ආණ්ඩුවක් තිබුණ මුත් එහි ව්‍යවස්ථාවේ පවා ලියැවී තිබුණේ රැජිනගේ පරමාධිපත්‍යය (The Sovereignty of the Queen) ව්‍යවස්ථාවේ ක්‍රියාත්මක වන බවයි. එබැවින් සියලුම නීති පැනවීම සිදුවූයේ රැජිනගේ නාමයෙනි. එවකට පාර්ලිමේන්තුවට අමතරව උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පැවතීම හා විජාතික හඬ ඒ තුළ ක්‍රියාත්මක විමත් පනත් කෙටුම්පත් වුවද බ්‍රිතාන්‍ය සාමි මණ්ඩලයට ඉදිරිපත් කිරීමේ හැකියාව තිබීමත් ශ්‍රී ලංකාව ඉහළ උසාවි නියෝගයන්ට විරුද්ධව බ්‍රිතාන්‍ය සාමි මණ්ඩලයට හෝ එහි ශ්‍රේෂ්ඨාධිකරණයට අවසන් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව තිබීමත් අග්‍රාණ්ඩුකාරයා බ්‍රිතාන්‍ය රජුගේ නියෝජිතයකු ලෙස පත්වීමත් යන කරුණු කාරණා සියුම්ව විග්‍රහ කොට බැලීමේදී ඩොමීනියන් තත්ත්වය තුළ තිබුණේ අර්ධ නිදහස් තත්ත්වයක් බව පැහැදිලිය.

1956 දී එස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක ශ්‍රීමතාණන් විසින් පංචමහා බලවේගය එක්කොට දේශීය චින්තනයට අග්‍රගන්‍යව මහා දේශපාලන විප්ලවයක් සිදුකළ බව පැහැදිලිය. මෙය වූ කලී 1505 සිට දේශීය වීරවරයන් විසින් දිවි පරදුවට තබා අධිරාජ්‍යවාදින් සමඟ කළ සටන්වල සංක්ෂිප්තයක් ලෙස

අර්ථ ගැන්වීම සුදුසුය. ඇත්තෙන්ම බොහෝ කාලයකට පසු ශ්‍රී ලාංකික අනන්‍යතාව මතුවූයේ මෙහිදී යැයි කීම නිවැරදියි. දෙස්-විදෙස් සුද්දන්ට අයත්ව තිබූ කොම්පැනි බොහෝ ජනසතුවීම, සිංහල රාජ්‍ය භාෂාව වීම හා ද්‍රවිඩ භාෂාවට නිසි තැන ලැබීම මෙන්ම පොදුජනතාවට හිතැති විශාල පියවරයන් තොගයක් සිදුකිරීමට යත්න දරුවද බලගතු යටත්විජිතවාදී භීෂණය හා එයට උදව් උපකාර කළ දේශීය කලු සුද්දන්ගේ ක්‍රියාමාර්ග හා කුමන්ත්‍රණ තුළ එම පොදුජන විප්ලවය වසර තුනක් ඇතුළත නිහඬ කිරීමට ඔවුන් සමත් වූ බව පැහැදිලි කරුණකි. ඒ කාලසීමාව තුළදී බණ්ඩාරනායක මහතා ආණ්ඩු ක්‍රමයේ වෙනසක් ඇති නොකළ අතර සමාජමය පෙරළියක් සිදුකරන ලදී. එහි සාර්ථකත්වය දූනුදූ අප මාතෘභූමිය භුක්ති විඳින බව කිව යුතුයි.

කෙසේ වුවද ඩොමිනියන් තත්ත්වය යටතේ රජයෙන් පත්වී විවිධ ජනහිතකාමී තීන්දු ගත්තද මේ සියල්ල අවසනාදී තීන්දු ගැනීම්, නීති පැනවීම්, ඒවා ක්‍රියාත්මක වීම් හා එහි අධිකරණ විනිශ්චයන් සහ (ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල) සියල්ල සිදුවූයේ රැජිනගේ නාමයෙන් වීම රටෙහි අභිමතය පවා සැහැල්ලුවට ලක්වන කරුණක් වූ බව පැහැදිලිය.

ඉහත ගැටලුවට විසඳුමක් ගෙන ඒමට බණ්ඩාරනායක අගමැතිතුමා සමඟ සිට සියලුම දේශීය බලවේගයන්ට වුවමනා විය. 1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලොව ප්‍රථම අගමැතිනිය ලෙස පත්වීම හා එතුමිය සමඟ සිටි සමාජවාදී හා කොමියුනිස්ට් කඳවුරේ නායකයින් කෙරෙහි බලපෑ විවිධ ජාත්‍යන්තර සිදුවීම් තිබුණි. 1917 රුසියානු විප්ලවයෙන් සිදුවූ පිබිදීමත්, අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව දිගින් දිගටම පැවැති උද්ඝෝෂණ, නිදහස් සටන් මෙන්ම ඇමෙරිකානු කම්කරු අරගලය ආදියෙන් සන්නද්ධව ලොව පුරා ධනවාදයට හා අධිරාජ්‍යවාදයට එරෙහිව සමාජවාදී සටන් ඇවිලී යාම මෙහිලා ප්‍රධාන වේ. විශේෂයෙන් කියුබානු විප්ලවයත්, චෙගුවේරාගේ නායකත්වයත් මෙම ව්‍යාපාර තව තවත් ශක්තිමත් කළ අතර වැඩකරන පීඩිත ජනතාව සිය අයිතීන් වෙනුවෙන් මේ වටා එක්රැස් වන්නට විය. එසේම පළමු හා දෙවැනි ලෝක සංග්‍රාම සමයේදී මිත්‍ර පාක්ෂික හමුදාවේ සොල්දාදුවන්ගේ සුබසාධනයට පොපි මල් ව්‍යාපාරයක්ද සංවිධානය විය. එය අධිරාජ්‍යවාදයට

මහජන පුස්තකාලය ශාඛ
විමර්ශන අංශය
මහ නගර සභාව
කුරුණෑගල

උල්පන්දමක් ලෙස සිතූ සමාජවාදීන්, මාක්ස්වාදීන්, ට්‍රොස්කිවාදීන් ඊට විරුද්ධව පියවර ගත් අතර මෙම මතවාදයන්ගෙන් පෝෂණය වූ එස්. ඒ. වික්‍රමසිංහ, සී. පී. ද සිල්වා, ඇන්. ඇම්. පෙරේරා, පීටර් කෙනමන්, කොල්වින් ආර්. ද සිල්වා වැන්නවුන් ''සූරියමල්'' ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ලංකා ජාතික සංගමය අධිරාජ්‍යවාදීන්ගෙන් ඉල්ලීම් ඉල්ලන සංගමයක් වූයෙන් ඉන් මිදී මහත්මා ගාන්ධිතුමාගේ ඉන්දියානු නිදහස් සටනේද පන්නරය රැගෙන ඔවුන් ලංකාවේ අධිරාජ්‍ය විරෝධී අරගලයට නායකත්වය ලබාදුණි. අවිස්සාවේල්ල, රුවන්වැල්ල ආදී ප්‍රදේශ තරග කරමින් පාර්ලිමේන්තුව කරා අදාළ හඬ රැගෙන ගිය අතර ඒ වනවිට කම්කරු නායකයෙක්ව සිටි ඒ. ඊ. ගුණසිංහගේ වර්ජන ව්‍යාපාරය හරහා මෙයට යම් සහායක් ලබාදෙමින් අවසාන වශයෙන් 1956 බණ්ඩාරනායක රජයටත්, 1960 සිරිමාවෝ බණ්ඩාරනායක රජයටත්, 1970 නැවතත් සිරිමාවෝ බණ්ඩාරනායක රජයටත්, සමාජවාදීන් හා කොමියුනිස්ට්වාදීන්ගේ මධ්‍යස්ථ කොටස සහාය පළකර සිටින ලදී. ඔවුන්ගෙන් විප්ලවවාදී රැඩිකල් කොටස් 1970 සිට සන්නද්ධ අරගලයක් මගින් බලය ලබාගැනීමේ අරමුණින් වෙනත් ජනතා විමුක්ති ව්‍යාපාර හා එක්ව ක්‍රියාකරනු ලැබීය.

මේ කාලසීමාව තුළ අධිරාජ්‍යවාදී බැමිවලින් සම්පූර්ණයෙන් නිදහස් වීමේ දැවැන්ත අවශ්‍යතාවක් ලංකාවට තිබුණි. මේ නිසා මෙම බලවේග නිරන්තරයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමගි පෙරමුණු රජයට එය අවධාරණය කළ අතර 1965-70 බලයට පැමිණි ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ එක්සත් ජාතික පක්ෂ රජය 1948 නිදහස ප්‍රමාණවත්ය යන සීමාව තුළ සිට ක්‍රියාත්මක වූ බව පැහැදිලියි. 1948 ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ නායකත්වයෙන් 1947 සෝල්බරි ව්‍යවස්ථාව අනුව ජාතීන්ගේ සංගමයේ කොටස් එක්ව එක්සත් ජාතික පක්ෂය ස්ථාපිත කිරීමත් ඔවුන් කිසියම් ලෙසින් අධිරාජ්‍යවාදී ව්‍යාපාර සමඟ සහජීවන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් තුළ එකල ඒ උත්සාහය යටපත් වී තිබුණි. කෙසේ හෝ එවකට දේශීය චින්තනයද, අධිරාජ්‍ය විරෝධී භූමිකාවද නියෝජනය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමාජවාදී කණ්ඩායම 1970 දී නැවත ජනතාවගෙන් බලය ඉල්ලන ලද්දේ මෙම අධිරාජ්‍යවාදයට යටවූ දේශීය "පරමාධිපත්‍ය බලය" නිදහස් කරගැනීමේ අවශ්‍යතාව පිළිබඳව ජනතාව දැනුවත් කරමිනි.

## ❒ ජනරජයක් වීම හා එහි නෛතික බව

1947 හඳුන්වා දෙන ලද සෝල්බරි ආණ්ඩු ක්‍රමයම නිදහස් ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය ලෙස ක්‍රියාත්මක වූහ. මෙහිදී මූලිකම වෙනස වූයේ බ්‍රිතාන්‍ය මහ රැජිනගේ නාමයට නීති සම්පාදනය කරන පාර්ලිමේන්තුව හා සෙනෙට් සභාව සඳහා ශ්‍රී ලාංකික නියෝජිතයන් පත්වීමත්ය. අනෙක් අතින් සිදුවූයේ නාමමාත්‍රික විධායක බලතල ක්‍රියාත්මක කරන අග්‍රාණ්ඩුකාරවරයාද, මහරැජිනගේ බ්‍රිතාන්‍ය කිරීටයේ නියෝජිතයකු ලෙස ලාංකිකයකු පත්කිරීමයි. සර් ඔලිවර් ගුණතිලක මහතා අග්‍රාණ්ඩුකාරවරයා ලෙස මේ යටතේ පත්විය. "සර්" යන නාම පදවිය පවා බ්‍රිතාන්‍ය රජයෙන් ඔහු වෙත ලබාදුන්නක් විය. කෙසේ වුවද 1948 සිට ලාංකිකයෝ විසින් ව්‍යවස්ථාදායක කාර්යභාරය මෙන්ම විධායක කාර්යභාරය කොතරම් හොඳින් ඉටුකළාද යත් එය බ්‍රිතාන්‍ය පාලකයින්ගේ වුවමනා අපේක්ෂාවන්ට කිසිදු ගැටුමක් ඇති නොකිරීමටද වගබලාගෙන තිබුණි. මේ බව වඩාත් පෙනී යනනේ 1956 දී බණ්ඩාරනායක ශ්‍රීමතාණන් විසින් පාර්ලිමේන්තුවේ කරන ලද කතා ගෙන බැලීමේදීය. පසුව එතුමාණන් සමඟ එක්ව වත්මන් ජනාධිපතිතුමාණන්ගේ පියාණන් වන ඩී. ආර්. රාජපක්ෂ මැතිඳුන් විපක්ෂයේ අසුන් ගැනීමට තරම් මෙය දුරදිග ගිය කාරණයක් වූ බව පැහැදිලිය. මෙහිදී සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච බලවේගයට දේශීය ලෙස කිසිදු තැනක් ලැබී නොතිබුණි. දේශීය පාලකයින්ගේද, විදේශීය පරගැතිබව මෙහිලා ප්‍රධාන විය. ඒ වනවිට බොහෝ දේශපාලනඥයින් බටහිර අධ්‍යාපනයෙන් මොළ සෝදාගත් අය වූහ. බණ්ඩාරනායක මැතිතුමා එසේ වුවද ඔහුට ඔක්ස්ෆර්ඩ් සරසවියේදී ලැබුණු සමාජවාදී පන්නරයත් ඔහුටම ආවේණික ගුණාංගත් එක්ව මේ නඩයට ප්‍රහාරයක් එල්ල කිරීමට පියවර ගත් බව ප්‍රථම පරිච්ඡේදයේදී පෙන්වා දුණි. මේ කටයුත්තෙහිලා ඩී. ආර්. රාජපක්ෂ වැනි දේශීය ගැමි සුවඳ හොඳින් දන්නා නායකයින්ගේ සහායද එතුමාණන්ට ලැබුණු අතර දිවයිනේ සිටි සමාජවාදී හා කොමියුනිස්ට්වාදීන්ගේ සහායද වක්‍රව ලැබී තිබුණි. අනෙක් අතින් සිංහල මහා සභාව වැනි දේශීය සංවිධානවල දැඩි ක්‍රියාකාරීත්වයද පිහිට වූ බව පැහැදිලි විය. මේ සියල්ලටම වඩා බෞද්ධ සඟ බලවේගයත්, ගැමි ජනතා බලවේගයත් එතුමා වටා පෙළගැසී තිබුණි.

1931-1947 දී ලාංකිකයනට පාලන බලය ලැබීම ඍණාත්මක දෘෂ්ටියෙන්ම විග්‍රහ කිරීම සාධාරණ නොවන කරුණු කීපයක්ද තිබේ.

රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ සිට ක්‍රමානුකූලව දේශීය නායකයින්ට පාලන බලය හා වගකීම එක්තරා දුරකට ලැබීම තුළ හොඳ පෞරුෂයක් ඇති දේශීය නායකයින්ට ඔවුන්ගේ හැකියා-වන්ගෙන් යම් ප්‍රමාණයක වාසියක රටට අත්කර දීමට හැකිවූ බව පෙනේ. ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ "ගොවි ජනපද ව්‍යාපාරය" නිසා නැවතත් ලාංකික කෘෂි ක්ෂේත්‍රය පිපිදී පණ ගසා නැගී සිටිය බව කිව යුතුය. අදද අනුරාධපුරය, පොළොන්නරුව පමණක් නොව අම්පාර, ත්‍රිකුණාමලය, යාපනේ පවා ගොවි ජනපද ව්‍යාපාර සාර්ථකව ඉදිරියට ගොස් ඇත්තේ එතුමාණන් ඊට ලබාදුන් ජීවය හේතුවෙනි.

අනෙක් අතට සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ මූලිකත්වයෙන් එතෙක් ධනපතීන්ට හා බටහිර ගැත්තන්ට පමණක් හිමිවූ අධ්‍යාපන වරප්‍රසාද පොදු ජනතාවටද භුක්ති විඳීමට හැකිවූ බව කිව යුතුය. නිදහස් අධ්‍යාපනය තුළින් දේශීය උගතුන් බිහිවුවද මෙහිලා තිබූ ගැටලුව වූයේ එලෙස ව්‍යාප්ත කළේ බටහිර අධ්‍යාපනය ක්‍රමයම වීමයි. මධ්‍ය මහා විද්‍යාල අනුසාරයෙන් ගමේ දූවා දරුවා ඉහළ නිලතල සඳහා පැමිණියේ දේශීය චින්තනයකින් නොවීමයි. යම් ලෙසකට අධ්‍යාපනය සඳහා තිබූ බාධා ඉවත් කිරීම මෙන්ම දේශීය බුද්ධිමතුන් බිහිකිරීම ප්‍රතිපත්තිය කොට අධ්‍යාපනය බටහිරින් නිදහස් කළ යුතුව තිබුණි. එදා නිදහස් වූයේ අධ්‍යාපනය අවස්ථාවන්ය. නමුත් අධ්‍යාපනයේ ගුණාංග නිදහස් වූයේ නම් ශ්‍රී ලංකාව අද පවා භුක්ති විඳින බොහෝ ගැටලු ඇති නොවන්නට තිබුණි. කෙසේ වුවද එතුමාණන් කළ කාර්යය පැසසිය යුතුව තිබේ.


එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් විසින් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමය ක්‍රමානුකූල සංවර්ධනයකට බඳුන් කරන ලද අතර යම්තාක් දුරකට ජනතාව අතරට තම ප්‍රදේශවල මූලික සේවා පාලනය කිරීමට වුවද බලතල ලබාදී තිබීම වැදගත්ය. මේ අනුව ඩොනමෝර් හෝ සෝල්බරි ආණ්ඩු ක්‍රමයන්හි ගුණයත් මේ තත්ත්වයට පදනම සැලසුවා යන්නට වඩා, ඒ ඒ අමාත්‍ය-වරුන්ගේ පෞද්ගලික දක්ෂතා මගින් මේ තත්ත්වයන් සාර්ථකවීම සිදුවූවාය යන්න නිවැරදි ප්‍රකාශයකි.

අපට මෙම විග්‍රහයේදී වඩාත් වැදගත් වන්නේ ඩොමීනියන් තත්ත්වය නොහොත් 1948 නිදහස තුළ තිබූ නිදහසට එරෙහිව වූ නෛතික විලංගු මොනවාද යන්න පරිස්සමින් අවබෝධ කොට ගැනීමය.

මින් ප්‍රධානතම තත්ත්වය වූයේ ශ්‍රී ලංකාවේ නීති පැනවීම රැජිනගේ පරමාධිත්‍ය බලයට යටත්ව සිදුවීමයි. එයට මූලිකම හේතුව වූයේ දිගින් දිගටම ව්‍යවස්ථා සංශෝධනයත් මෙන්ම සෝල්බරි ව්‍යවස්ථාවද රැජිනගේ පරමාධිපත්‍යය පිළිගෙන තිබීම යන කරුණයි. මෙහිදී වඩාත් නම්‍ය ප්‍රතිපාදනද ව්‍යවස්ථාවේ අන්තර්ගත වී තිබුණි. එනම් අපගේ පාර්ලිමේන්තුවට අවශ්‍ය නම් සෝල්බරි ව්‍යවස්ථා ඉවත් කොට නව ව්‍යවස්ථාවක් වුවද පැනවීමේ හැකියාව තිබීමයි. නමුත් නීති විශාරදයන්ගේ මතවාදය වූයේ එසේ නව ව්‍යවස්ථාවක් පැනවුවද එයට නීතියේ බලය (Rual of Law) හිමිවන්නේ නැවතත් රැජිනගේ පරමාධිපත්‍යය තුළින්ම වීම යනුයි. (The Severity of Queen) මේ නිසාම අවශ්‍ය වුවහොත් පනත් කෙටුම්පත් වුවද බ්‍රිතාන්‍ය සාමි මණ්ඩලයේ අවධානය පිණිස ඉදිරිපත් කිරීමේ හැකියාවේ සිට අප රටේ අධිකරණය විසින් දෙන නඩු විභාගයක අභියාචනාධිකරණ බලතල බ්‍රිතාන්‍ය සාමි මණ්ඩලය වෙතට යොමු-වීම වැළැක්විය නොහැකි තත්ත්වයක් උද්ගතව තිබුණි. ඒ වනවිටත් සුප්‍රිම් උසාවියේ තීන්දුවලට බ්‍රිතාන්‍යය වෙත අභියාචන කිරීමට නැඹුරු වන අවස්ථා දැකිය හැකිව තිබුණි. මේ තත්ත්වය පිළිබඳව දීර්ඝ ලෙස කරුණු අධ්‍යයනය කරනු ලැබූ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ජ්‍යෙෂ්ඨ අධිනීතිඥතුමාණන් විසින් මේ සඳහා විවිධ විවේචනයන්, නීති තර්ක ඉදිරිපත් කරන්නට විය. විශේෂයෙන් එතුමාණන් ඒ වනවිට සමාජවාදී චින්තනය ඉදිරියට ගෙනයාමත්, විශේෂයෙන් ඉන්දියානු නිදහස් සටනේදී ඊට සහයෝගයක් ලබාදෙමින් අධිරාජ්‍ය විරෝධී භූමිකාවේ පතාක යෝධයෙක් ලෙස නීති ක්ෂේත්‍රයේ හසල දැනුමකින්ද හෙබි පුද්ගලයකු වීම මෙහිලා කැපී පෙනුණි.

මේ අනුව 1970 වනවිට සමගි පෙරමුණ බිහිකිරීමටත් දායකත්වය සැපයූ එතුමාණන් සහ ඇන්. ඇම්. පෙරේරා මැතිතුමන් විසින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් මේ සඳහා විකල්ප වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්නට යෙදුණි. ඔවුන්ගේ තර්කය වූයේ බ්‍රිතාන්‍ය රැජිනගේ පරාමාධිපත්‍යය ජනතා පරමාධි-පත්‍යය වෙත සංක්‍රමණය කළ යුතු බවයි. (From Sovereighty of the Queen. To Sovereighty of the People's) මේ සඳහා නෛතික වූත්, උපාය මාර්ගික වූත් ක්‍රමවේදයක් ඉතා පරිස්සමින් භාවිත කිරීමේ අවශ්‍යතාවද පැන නැගී තිබුණි. මේ අනුව කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමාගේ උපදෙස් පරිදි 1970 මහ මැතිවරණයට ඉදිරිපත් වූ බණ්ඩාරනායක මැතිනියගේ සමගි පෙරමුණ ජනතාව වෙත ආයාචනයක් කිරීමට පෙළ ගැසුණි. ඉන් කියැවුණේ "ජනතා

පරමාධිපත්‍යය" යටතේ නව ව්‍යවස්ථාවක් පැනවීම සඳහා ජනතා වරම ලබාදෙන ලෙසයි. ඒ ආකාරයෙන්ම 1970 මැතිවරණයේදී සමගි පෙරමුණ විශිෂ්ට ජයක් ලබා බලය ලබාගති.



❒ ජනරජය බිහිකිරීමට නායකත්වය ලබාදුන් ලොව ප්‍රථම අගමැතිනිය ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සහ ජනරජය ව්‍යවස්ථාවේ නීති උපදේශක ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා.

## ලොව ප්‍රථම වරට සිදුවූ ව්‍යවස්ථා විප්ලවය

අනතුරුව සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය නෛතික උපදෙස් මත සියලු පත්වූ මන්ත්‍රීවරුන්ට ලිපියක් මගින් දැන්වූයේ ජනතා පරමාධිපත්‍යය අප රජයට ලැබී ඇති බැවින් ජනතා පරමාධිපත්‍යය මත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරිම සඳහා "නව රඟහල" වෙත පැමිණෙන ලෙසය. එම විශේෂ කැඳවීම එසේ සිදුවූයේ පාර්ලිමේන්තුවේදී මේ කටයුත්ත කළේ නම් නැවතත් ජනතා පරමාධිපත්‍යයට ඉහළින් බ්‍රිතාන්‍ය රැජිනගේ පරමාධිපත්‍යය අතැයි යන්න කිසියම් අයකුට සාධාරණ නෛතික තර්කයක් ගෙන ආ හැකි බැවිනි.

මේ වනවිට ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය විසින් 1972 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කොට අවසන් වී තිබුණි. මේ අනුව 1972 මැයි මස 22 දින කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහලේදී මැතිවරණයෙන් පත්වූ ජනතා නියෝජිතයන් එක්ව නව ව්‍යවස්ථාව සම්මත කරනු ලැබීය. 1972 නව ජනරජ ව්‍යවස්ථාව යන නමින් මෙය නම්කළ අතර එතැන් සිට ශ්‍රී ලංකාව ජනතා පරමාධිපත්‍යය විසින් පාලනය කරන 'ජනරජයක්' බවට පත්විය.

## 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මුල් පිටු ත්‍රිත්වය

# ශ්‍රී ලංකා

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් පන්සිය පසළොසක් වූ වෙසක් මස දසවක් දා

හෙවත්

වර්ෂ එක්දහස් නවසිය සැත්තෑ දෙකක් වූ මැයි මස විසි දෙවන සඳු දින ශ්‍රී ලංකාවාසී ජනතාවගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය විසින් සම්මතකොට පණවා ප්‍රතිෂ්ඨාපනය කරන ලද

**ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නොයෙල් තිත්තවැල්ල,
ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
සම්පාදක මණ්ඩලයේ ලේකම්.

1972 මැයි මස 22 වනදා,
කොළඹ දී ය.

# ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

## සවස්ති

ශ්‍රී ලංකාවාසී වූ අපි ජනතාව කෙරෙත් ම ලබාගත්තා බලයත් අධිකාරයත් ඇත්තා වූ ද ශ්‍රී ලංකාවෙහි මූඛ්‍ය නීතිය බවට පත්වන්නා වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පණවමිහ සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් හා නත්වැදූරුම් නිදහස ද ඇතුළු සමාජවාදී ප්‍රජාතන්ත්‍රයක අරමුණු සාක්ෂාත් කරගැනීමට ඇප කැප වූ නිදහස් ස්වෛරී ස්වාධීන ජනරජයක් ශ්‍රී ලංකාවේ පිහිටුවමිහ යන දෘඪතර අධිෂ්ඨානයෙන් යුක්තව අප විසින් පිහිටුවා ගන්නා ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය මගින් ක්‍රියාකරමින් නිදහස් ස්වාධීන ජනතාවක් වශයෙන් අපට ආවේණික වූ බලය මෙහෙයවා ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් පන්සිය පසලොසක් වූ වෙසක් මස පුර දසවක් නම් තිථිය ලත් මෙ දවස හෙවත් වර්ෂ එක්දහස් නවසිය සැත්තෑ දෙකක් වූ මැයි මස විසි දෙවන සඳු දින එසේ වූ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මතකොට පණවා ප්‍රතිෂ්ඨාපනය කරමිහ.

I වන පරිච්ඡේදය

### ජනතාව රජය සහ පරමාධිපත්‍යය

1. ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන ජනරජයකි. — *ශ්‍රී ලංකා ජනරජය.*

2. ශ්‍රී ලංකා ජනරජය ඒකීය ජනරජයකි. — *ඒකීය රජයක් බව.*

3. ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. ඒ පරමාධිපත්‍යය අත්හළ නො හැක්කේ ය. අන්සතු කළ නො හැක්කේ ය. — *ජනතාවගේ පරමාධිපත්‍යය.*

4. ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මකවන්නේ තෝරා පත් කරගනු ලබන ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත ජාතික රාජ්‍ය සභාවක් මගිනි. — *ජාතික රාජ්‍ය සභාව.*

5. ජාතික රාජ්‍ය සභාව ජනරජයේ උත්තරීතර ආයතනය වන්නේ ය. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරන්නේ ද රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනාධිපතිවරයා සහ අමාත්‍යමණ්ඩලය මගින් ක්‍රියාත්මකකරන්නේ ද නීතිය අනුව ජාතික රාජ්‍ය සභාව විසින් ම ක්‍රියාත්මකකළ හැකි ස්වකීය බලතල හා වරප්‍රසාද සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය නීතියෙන් ප්‍රතිෂ්ඨාපිත අධිකරණ සහ වෙනත් ආයතන මාර්ගයෙන් ක්‍රියාත්මකකරන්නේ ද ජාතික රාජ්‍ය සභාවයි. — *ජනරජයේ උත්තරීතර ආයතනය.*

ඉහත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උපුටා ගැනීම්වල වැදගත් වචන කීපයකි. ඉන් ප්‍රධාන වන්නේ "සමාජවාදී ප්‍රජාතාන්ත්‍රික අරමුණු" යන වචනයයි. සමාජවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය එකිනෙකට වෙනස්ව විග්‍රහ කළ යුතු වචන දෙකකි. ඉන් චින්තන සැමදෙනාටම සමාන මෙන්ම යම් ප්‍රමාණයක පාලනයකට නතුවන බවක් ඉඟි කරන අතර ප්‍රජාතාන්ත්‍රික යන වචනයේදී ආර්ථික, දේශපාලන හා සිවිල් පූර්ණ නිදහස් භුක්ති විඳීමක් කියැවේ. නමුත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිපත්තිය ලෝකයටම ආදර්ශ සපයමින් මේ වචන දෙක එක් කරමින් සුබසාධක රාජ්‍යයක මූලික ලක්ෂණය ඉඟි කරන්නට යෙදීම මෙහිලා අතිශය වැදගත් කරුණකි. දැඩි ප්‍රජාතන්ත්‍රවාදය තුළ ධනවාදයට විශාල ඉඩක් තිබෙන අතර ඉන් විශාල පිරිසකගේ අයිතීන්වලට යම් බලපෑමක් වන අතර සම්පත් සමානව නොබෙදේ. නමුත් රාජ්‍ය ප්‍රතිපත්තිය එසේ නොව සමාජවාදී යන අංශයෙන් එම විෂම චක්‍රය ඉවත් කොට සම්පත් හා සේවා හැකිතාක් සමානව බෙදීයාමට ඉඩ සැලසීමක් ඉඟි කරයි. මෙලෙස යම්

කිරීමට සමගි පෙරමුණු රජය සාධාරණ සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීමට සමගි පෙරමුණු රජය උත්සාහ කිරීම ඉතා වැදගත්ය.

අනෙක් පසෙකින් ප්‍රධාන ලෙස සාකච්ඡා කළ යුත්තේ ජනතා පරමාධිපත්‍යය පිළිඳවය. 1972 මෙම ක්‍රියාමාර්ගය නිසා 1505 සිට යටපත්ව තිබූ ශ්‍රී ලාංකික ජනතාවගේ නීතිමය බලය නැවතත් ස්ථාපිත වූ බව පැවැසිය හැක. එසේම එතැන් සිට තවදුරටත් ශ්‍රී ලංකාව ඩොමීනින් රටක් නොවූ අතර බ්‍රිතාන්‍යය සමඟ නෛතිකව පරමාධිපත්‍යයෙන් සම්පූර්ණයෙන් මිදුණු රටක් විය. ලාංකික ජනතාවගේ ස්වාධීනත්වය, ස්වඅභිමාය එතැන් සිට ක්‍රියාත්මක කළ හැකිවූහ. එවකට ලෝකයේ පැවති ධනවාදී කඳවුර මෙන්ම සමාජවාදී කඳවුරට නොබැඳී මධ්‍යස්ථව සිටීමට තිබෙන අවස්ථාව පුළුල් වූහ.

1972 මැයි 22 පනවන ලද ව්‍යවස්ථාවට අවනත වන බවට සියලු දෙනා දිවුරුම් දෙන ලදී. අගමැතිගේ නාම නියමයෙන් නාමික ජනාධිපති පත්වූ අතර එවකට අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව මැතිඳුන් ප්‍රථම ජනාධිපති ධුරයට පත්කරන ලදී. ජනාධිපති අගමැති, ඇමැතිවරු ඇතුළු ජාතික රාජ්‍ය සභාවේ සියලු මහජන නියෝජිතයින්ද, ලේකම්වරුන්ද ඇතුළු රාජ්‍ය නිලධාරීන්ද, පොලීසිය ඇතුළු ත්‍රිවිධ හමුදාද, අගවිනිසුරුතුමා ඇතුළු සියලුම විනිසුරුවන් හා අධිකරණ නිලධාරීන්ද, සියලුම රාජ්‍ය සේවකයින්ද නව ව්‍යවස්ථාව ආරක්ෂා කරන බවට දිවුරන ලදී. මෙහි විශේෂත්වය එදින සියලුම පාසල්වල රැස්වීම් පවත්වා දෙපාර්තමේන්තු, පෞද්ගලික ආයතනවල පවා ජනතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනත වන බවට දිවුරුම් දීමයි. එතැන් පටන් ශ්‍රී ලංකාවේ උත්තරීතර ආයතනය වූයේ ජාතික රාජ්‍ය සභාවයි. මෙයට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරන යන බල ත්‍රිත්වයම ගොනුවූ අතර ජාතික රාජ්‍ය සභාව රටේ නීති සකස් කළ අතර නීති ක්‍රියාත්මක කිරීම සඳහා අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය, පොලීසිය හා ත්‍රිවිධ හමුදා ක්‍රියා කරන්නට යෙදුණි. ජාතික රාජ්‍ය සභාව වෙත පරමාධිපත්‍ය බලය ගොනුවූ අතර ඉන් ලබාදුන් අධිකරණ බලතල ක්‍රියාත්මක කරන ලද්දේ ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රමුඛ අධිකරණය විසිනි. ඇමෙරිකානු ආණ්ඩු ක්‍රමයේ දක්නට ලැබුණු

"සංවර හා තුලන" (Cheek & Balance System) ක්‍රමය වෙනුවට 1972 ජනරජ ව්‍යවස්ථාවේ තිබුණේ බලය එක් ආයතනයක් වෙත ගොනුවීමේ ප්‍රවණතාවකි. ඒ ජාතික රාජ්‍ය සභාව වෙතටයි.

1947-1972 සිට ක්‍රියාත්මක වූ සෝල්බරි ව්‍යවස්ථාවේ පනවා තිබූ විධිවිධානයනට අනුකූල නොවන ලෙස සහ එහි ප්‍රකාශ කොට තිබුණු ආකාරයට ක්‍රියා නොකරීම තුළ නව ජනරජ ව්‍යවස්ථාව අනීතික බවත් එය ඉවත් කරන ලෙසත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා එවකට විපක්ෂ නායක ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නෛතික බව සොයන නඩු විභාගයේදී මතුවූ පක්ෂ, විපක්ෂ නීති තර්ක විග්‍රහ කළ අවසන් නඩු තීන්දුව වූයේ මැතිවරණයකට ඉදිරිපත් වන පක්ෂයක් ජනතාවට තමන් ව්‍යවස්ථාව වෙනස් කිරීමට අවශ්‍ය බලය ඉල්ලා ඒ පිළිබඳව ජනතවගේ කැමැත්ත ලබාගනී නම්, එය ජනතාව අනුමත කරන ලදුව පිළිගැනීමට සිදුවන බවයි. මේ සියල්ලටම වඩා වැදගත් වන්නේ ජනතාවගේ තීන්දුව බවත් මෙම ව්‍යවස්ථාවට ජනතා අනුමැතිය පළවී ඇති හෙයින් ඒ පිළිබඳව ඊට ඉහළ අධිකාරියක් නොමැති නිසා අධිකරණයට මේ පිළිබඳව සාකච්ඡා කළ නොහැකි බවයි. එසේම වැඩිදුරටත් එසේ ව්‍යවස්ථාවක් පැනවූ පසු එයට මහජනතාව අවනතව සියලුම පුරවැසියන් ඒ යටතේ දිවුරා අවනත වීම ප්‍රකාශයට පත්කිරීමත්, රටේ හමුදාව සහ සෙසු නිලයන් එය පිළිගැනීමත්, රාජ්‍ය සේවකයින්ගේ පිළිගැනීමත් ආදී වශයෙන් අවනත වීම ප්‍රකාශයට පත්කිරීම තුළද මෙයට විරුද්ධව ජනතාව නැගී නොසිටීම යන කරුණ මතද ව්‍යවස්ථාව නීතිමය රාමුවක් මත ස්ථාපිත වූ බව අධිකරණය පිළිගන්නා බව ප්‍රකාශ කෙරුණි. මේ අනුව වඩාත් ඓතිහාසික තීන්දුවක් දුන් ශ්‍රේෂ්ඨාධිකරණය කියා සිටියේ මෙය ව්‍යවස්ථා විප්ලවයක් බවයි. (Constitutional Revelution) අධිකරණයේ අදහස වූයේ ජනතාව පොදුවේ මෙයට පක්ෂවීම හා විරුද්ධව සැලකිය යුතු සමාජ කණ්ඩායමක් ඉදිරියට නොඒම තුළ එවන් විප්ලවීය ක්‍රියාමාර්ග පවා නීතිගතවන බවයි. මෙසේ අධිකරණය ලබාදුන් එම තීන්දුව ප්‍රකාර 1972 ජනරජ ව්‍යවස්ථාව ශ්‍රී ලංකා සමාජවාදී ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලෙසට බලාත්මක වන ලද්දේය.

මෙයට සමගාමීව මහාචාර්ය මලලසේකරයන්ද ඉතා දක්ෂ ලෝකපූජිත කාර්යයක් සංවිධානය කළේය. එනම් ලෝක බෞද්ධ

සම්මේලනයක් ශ්‍රී ලංකාව තුළ සංවිධානය කිරීමයි. මේ සඳහා රටවල් 80 ක් පමණ සම්බන්ධ කරගැනීම සහ ඒ අය 1972 මැයි 22 දින දක්වා ශ්‍රී ලංකාවේ රඳවා ගැනීම සහ ලංකාවේ නව ජනරජය පිළිබඳව ක්ෂණික අදහස් ජාත්‍යන්තරය වෙත ලබාදීමද මෙහි ප්‍රධාන අරමුණක් වූයේය.

දෙවැනි අරමුණ ථෙරවාදී බුදු දහමේ කේන්ද්‍රය ශ්‍රී ලංකාවටබවට ජාත්‍යන්තරව තිබූ මතය වඩාත් තහවුරු කිරීමයි. මේ අනුව මෙම ජාත්‍යන්තර සම්මේලනය පැවැත්වූයේද 1972 මැයි 20-22 දක්වාය. 22 දින කැලණි රජමහා විහරයේදී සියලු රාජ්‍ය අමුත්තන් බෞද්ධ පිංකමකට සහභාගි කරගැනීමෙන් සම්මේලන කටයුතු අවසන් කිරීමට යොදා ගැනුණි. මහාචාර්ය ගුණපාල මලලසේකරන ශ්‍රී ලංකාවේ කීර්තිය ලෝකයට ගෙනයාමට මෙන්ම බුද්ධදහම ප්‍රචරය කිරීමට සහ වඩාත් ශ්‍රී ලාංකිකයන් තුළ ප්‍රතිපත්තිගරුක ලක්ෂණ ඇති කිරීමට ක්‍රියා කළ අග්‍රගණ්‍ය මහා පඬිරුවනකි එකල දේශපාලනය තුළ මෙම චරිත පවා දේශීය ස්වාධිපත්‍යය වෙනුවෙන් තම ජාතික වගකීම රජය සමග ඉටුකළේ මේ ආකාරයෙනි. මෙම කටයුතු සඳහා ගරු අගමැතිතුමියගේ උපදෙස් පරිදි එකල රාජ්‍ය සභා නායක අමාත්‍ය මෛත්‍රිපාල සේනානායක හා සංස්කෘතික ඇමැතිතුමාගේ මාර්ගයෙන් පූර්ණ රාජ්‍ය අනුග්‍රාහකත්වය අදාළ සමුළුව වෙත ලබාදීම හා කටයුතු සංවිධානය සිද්ධව තිබුණි. මෙ තුළින් පෙනුණේ පොදුවේ සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය කොතරම් නව ක්‍රමවේදයට අනුකූල ආකාරයට සිය යුතුකම් හා වගකීම ඉටුකළාද යන්නයි.

මේ වනවිට ලෝකයටම අලුත් අත්දැකීමක් වූ ව්‍යවස්ථා විප්ලවය පිළිබඳ හොඳ චිත්‍රයක් ජාත්‍යන්තරව ලබාදීම ඉතා අතවශ්‍ය කරුණක් විය. විශේෂයෙන්ම බලගතු බ්‍රිතාන්‍ය අධිපතීත්වයෙන් සම්පූර්ණ-යෙන් මිදීමත්, නොබැඳිව සිටීම හා රට අභ්‍යන්තරයේ ගනු ලබන නව පාලන ක්‍රම ජනාධිපති, ජාතික රාජ්‍ය සභාව ආදිය පිළිබඳව සහ ජනතාව එහිදී ක්‍රියාකරන ආකාරය ජාත්‍යන්තර ප්‍රජාවට ඇස් ඉදිරිපිටදී දැකගැනීමට සැලැස්වීම මහාචාර්යතුමාගේ එම ප්‍රථම අරමුණු යටතට ගොනුවූ බව පෙනේ. මෙය වූ කලී රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ගයකි.

These books have been collected / purchased and donated by the Association of Sri Lanka Lawyers in The UK to the KURUNEGALA Public Library. UBALAGAMA - JAYA PHIRANA - WJIJESUNDERA COLLECTION.

You should not be in possession of this book outside the premises of the library. It would amount to an act of theft if you remove this book from the library. There are no exceptions.

# 2


# ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංකේත හා ජනරජ ලාංඡනය

## ❒ රාජ්‍ය සංකේතවල ස්වභාවය හා විකාශනය

ප්‍රාථමික යුගවල සිට මිනිසා තම කණ්ඩායම් හඳුනා ගැනීම උදෙසා විවිධ සංකේත යොදාගත් බව පැහැදිලි කරුණකි. විශේෂයෙන් හිරු, සඳු, දේව, යක්ෂ හා ස්වභාවික ක්‍රියාවන් හා බැඳුණු විශ්වාස හා සම්බන්ධයෙන් සංකේතද, විවිධ ගෝත්‍රික කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා වූ සංකේතයන්ද වසර දහස් ගණනකට පෙර සිටම භාවිත වූ බවට සාක්ෂි එමටය. මේ යටතේ මොහන්දජාරෝ-හරප්පා, යුප්‍රටීස්-ටයින්ග්‍රීස් හා නයිල් ගංගා නිම්න මිටියාවත්වල තිබූ මුල් ජනාවාසවලින්ද මීට සාක්ෂි ලැබී තිබේ. මෙහිදී සූර්ය දෙවියන් පිළිබඳ විශ්වාසය පිළිබඳ කරුණු ලැබේ. සූර්ය දෙවියන් නමස්කාරය පිළිබඳව ආදිවාසි මානවයන් භාවිත කළ ඉපැරණි සංකේත මහා බ්‍රිතාන්‍යයේ Wiltshire හි Stonehenge වලදීද හමුවේ.

එසේම අතිශයින්ම ඉපැරණි යයි කිව හැකි සුවිශේෂ සංකේතයක් අනුරාධපුරයේ රන්මසු උයනෙන්ද හමුවේ. එම සංකේතයට සමාන අනෙක් සංකේතය ඇත්තේ ඊජිප්තුවේ පිරමීඩවල බව පුරාවිද්‍යාඥයින් සොයාගෙන තිබේ. මෙම සංකේතයන් දෙක පමණක් ලෝකයේ විශේෂ ස්ථාන දෙකක සටහන් කර තිබීම විශ්වය හා සම්බන්ධ කිසියම් අද්භූත සන්නිවේදන ක්‍රමෝපායයක් සඳහාද? යන සැකයක් පවතී.

මහජන පුස්තකාලය සේ.
විමර්ශන අංශය
මහ නගර සභාව
කුරුණෑගල



❒ ආදිවාසික යුරෝපීයයන් හිරු දෙවි වන්දනාව සඳහා යොදාගත් බවට විශ්වාස කෙරෙන, දැනට මහා බ්‍රිතාන්‍යයේ Wiltshire පිහිටි Stonehenge නම් මුල්කාලීන සංඛේත.

ශ්‍රී ලංකාවේද මුල් යුගවල තිබූ සංඛේතයන් ලෙස බෞද්ධ සංඛේත හඳුනා ගැනේ. විශේෂයෙන්ම බුද්ධාගම ස්ථාපිත වන්නට ප්‍රථම රාජ්‍යත්වය සංඛේත වන්නට ඇත්තේ රජතුමාගේ පේරස් මුදුවෙන් වන්නට ඇත. ඒ හා සම්බන්ධ සාක්ෂි හමු නොවුණත් චන්ද්‍රගුප්ත



❒ ඊජිප්තු පරමඩ අතරින් සොයාගත් රජ පවුලට සූර්ය දෙවියාගෙන් වරම් ලබා ආශිර්වාද ලබාගන්නා අවස්ථාව දැක්වෙන කැටයමක්.




❒ රන්මසු උයනේදී හමුවන විශේෂිත සංකේත.

මෞර්ෂ ආදී ඉන්දියානු රාජ්‍ය පරම්පරාවල සිය වෙළෙඳ ආධිපත්‍යය විසිරුවා හරිනු ලැබූ දේශයන්හි ඔවුන්ගේ කාසිවල රාජ්‍ය සංකේතය යොදා තිබේ. මෙම කාසි මෙන්ම ඉපැරණි රෝම, අරාබි, චීන කාසි ලංකාවෙන් හමුවීම හා එම කාසි ආශ්‍රිතව විවිධ සංකේත යොදා තිබීම මෙහිලා සඳහන් කළ යුතු සුවිශේෂ ලක්ෂණයකි.

දුටුගැමුණු රජතුමා[1] විසින් භාවිත කළා යැයි සැලකෙන දුටුගැමුණු කොඩිය ආදිය හැරුණු කොට අපට එදා සිට හමුවන්නේ බෞද්ධ සංකේතයන්ය. විශේෂයෙන්ම බුදුන් වහන්සේ නියෝජනය කිරීම

[1]දුටුගැමුණු කොඩියේ සිංහයා අසිපතත් රැගෙන ඇති අතර ඇඟ රැලි සහිතය. මෙයට හේතුව ඌ වේගයෙන් ඉදිරියට ඇදෙන බව පෙන්වීමට කලාකරු ගත් උත්සාහයයි. මෙය ඉතා විශ්මයජනක ප්‍රකාශනයක් සහිත සංකේතයකි.

[2]සංඛ-පද්ම යනු යම් බහිරව රූප විශේෂයකි. එක් රූපයක ශීර්ෂයේ හක් ගෙඩියක්ද, අනෙක් රූපයේ නෙළුම් මලක්ද සිටින සේ නිර්මාණය කර ඇත. ඉපැරණි යුගයේ නීතිරීතිවලට අනන්‍යතාව ප්‍රකාශ කිරීම, රාජ්‍ය නීතිය ඉදිරියේ දිවුරීම ආදී කටයුතු සඳහා මෙම රූපය යොදාගෙන තිබේ. මේ අනුව එය හුදු බහිරව රූපයක් නොව දඬුවමට හා නීතියට අවනත භාවය ප්‍රකාශ කෙරෙන සංකේතයක් ලෙස භාවිත කළ බව පෙනේ.




❒ මුල්කාලීන සිංහ හා ස්වස්තික ලාංඡනයයි.(ක්‍රි.පූ. 2 ක්‍රි.ව. 7 අතර)

උදෙසා බෝපත්‍ර, ශ්‍රීපාද ලාංඡනය, චක්‍රය, පුන්-කලස ආදී සංකේත විද්‍යාමාන වන අතර පූජනීය හා රාජ්‍ය ස්ථාන-යන් හා වැව්, පොකුණුවල ආරක්ෂාව සඳහා නාග සංකේතයන් ඒ හා බැඳුණු මුරගලේ සංකේතයන්, සංඛ හා පද්ම රූප අන්තර්ගත සංකේතයන්ද මෙහිලා සඳහන් කළ යුතුය. අනුරාධපුර, පොළොන්නරුව ආදී ප්‍රදේශවල නටබුන් පරීක්ෂා කිරීමේදී අපට පෙනී යන්නේ නිරන්තරයෙන් සිංහ රූපය සංකේතයක් ලෙස යොදාගත් බවකි. දුටුගැමුණු කොඩියේ සිට සිංහල හා බෞද්ධ රාජ්‍යය පිළිබඳ කිසියම් සංකේතාත්මක ප්‍රකාශයක් මේ තුළ ගැබ්වී ඇති බව පැහැදිලිය.



❒ ඉපැරණි සිංහ සංකේතයක්.

රාජ්‍ය ගොඩනැගිලි-වල ආරම්භයේදී මෙන්ම රාජ්‍ය ආසනයට පිටුපස සිංහ සංකේතයක් යොදා ඇති බව පොළොන්නරුව මහා පරාක්‍රමබාහු රාජ්‍ය හොජ්ජංග ශාලාවේදී සහ නිශ්ශංකමල්ල රජතුමාගේ රාජ්‍ය සභා මණ්ඩපයේදී අපට හමුවේ. විශේෂයෙන්ම ''සිංහගිරිය'' - සීගිරිය ලෙස ප්‍රකට වූයේද මේ සිංහ සංකේතය නිසාය. ශ්‍රී ලංකාවේ ඉපැරණි පුරාවෘත්ත තුළ සිංහබාහු - සිංහසීවලී කතා පුවත විශිෂ්ට වේ. සිංහලයා මෙසේ සිංහයාගෙන් පැවත එන අභීත ශ්‍රේෂ්ඨ ජාතියක්ය යන්න ඉඟි කිරීම මෙහි උත්සාහය වන්නට ඇත. කෙසේ හෝ වේවා ''සිංහයා'' අප ජාතික කොඩියට, රාජ්‍ය ලාංඡනයට අන්තර්ගත වූයේද ශ්‍රී ලාංකික බව නියෝජනය කිරීමට ඉතිහාසයේ සිට මේ දක්වා යෙදූ ශ්‍රේෂ්ඨතම සංකේතය ලෙස මෙය පිළිගැනෙන නිසාය. කෙසේ හෝ බුදුපියාණන් වහන්සේගේ මහා සිහනාද සූත්‍රය සූත්‍




❒ ශ්‍රී වික්‍රම රාජසිංහ මහරජුගේ පේරස් මුද්ද සහ ඉන්දියානු පාලකයින් විසින් පාවිච්චි කළා යැයි සැලකෙන ලාංඡනයක් ලෙස සීල් තබන ලද මුද්දක්. (ලියකියවිලි ජාතික කෞතුකාගාරයේ අනුග්‍රහයෙනි.)

දේශනාවලදී අතිශය වැදගත් වන අතර එම බෞද්ධ ආභාෂය අශෝක රජතුමාගේ අශෝක කුළුණට ආරෝපණය කළ සිව්දිසාව බලා සිටින සිංහ රූපය මගින් සංඛේතවත් කර තිබුණි. සත්‍ය වූ



❒ යාපහුව සිංහ රුව. සිංහ රූපය මුල්කාලීන සංඛේතයකි. තේජවන්ත බව, අභීත බව, දැඩි බව හා ස්ථාවරත්වය ආදිය මෙයින් කියැවුණි.



❒ දුටුගැමුණු රජතුමා විසින් පාවිච්චි කළා යැයි සැලකෙන රාජ්‍ය සංඛේතය වන්නේ ඉර-හඳ සහ කඩුවක් ගත් සිංහයාය. මෙය යුද භූමියේ ප්‍රධාන ධජය ලෙස භාවිත කර තිබේ.

ධර්මය ලොව සිව් දෙසට විහිදුවා හැරුණ අභිමානයක් ඇති භාරතයේ ලාංඡනයක් ලෙසට ප්‍රකටය. එසේම බෞද්ධ ගොඩනැගිලිවල මකර තොරණට යෙදූ සිංහ පා ශක්තිමත් ධනාත්මක ඉදිරි ගමනක් ප්‍රකාශ කෙරේ.

මීට අමතරව බෞද්ධ ධර්මතාවය චක්‍රාකාරව සංඛේතවත් වන්නේ ධර්ම චක්‍රයෙනි. මෙය මංගල ලකුණුවලත්, භාරතයේ ධර්මාශෝක ලාංඡනයේත්, අද වර්තමානයේ භාරතයේ ජාතික කොඩියටත් අන්තර්ගත වී තිබේ. අපේ ශිලා ලේඛනයන්වලත් බෞද්ධ කලාශිල්පවලත්, බුද්ධ ධර්මය සංඛේතවත් කිරීමෙහිලා ධර්ම චක්‍රය යොදා ඇත.

මෙයට අමතරව ලොව්තුරා බුදුන් වහන්සේ සංඛේතවත් කිරීම උදෙසා ''නෙළුම් මල'' නොහොත් පියුම ශ්‍රී පතුල්, බෝකොළ,* ඡත්‍රය, පුන්කලස යොදාගත් බවට හේතු සහගත සහිතව පෙන්වාදිය හැකිවේ. නමුත් පූර්ණ, ඝටය, පුන්කලස පසුකාලයේ සෞභාග්‍යයේ


---

*දෙගල්දෙරුව විහාර සිතුවමක ඇත්තේ බෝඅත්ත දෙසට මාර සේනාවක් ඊතල විදින අතර ඒවා නැවත ඔවුන් දෙසටම හැරී එයි. ඉන් බුදුන් වහන්සේ සංඛේතවත් වන බව පැහැදිලිය.



❒ මුල්කාලීන බෞද්ධ සංඛේත වශයෙන් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පතුල සහ මංගල ලකුණු මේ ආකාරයෙන් භාවිත වුණි.

සංඛේතයන් බවට පැහැදිලි විය. නමුත් දන්ත ධාතූන් වහන්සේ බුදුරුව වෙනුවට යොදාගත් අවස්ථා තිබේ. එය ඉතා සීමිතවය. ශිලා ලේඛනවල ධර්ම චක්‍රය ඉර-හඳ ආදිය භාවිත කොට තිබෙන්නේ ඉර හඳ පවතිනා තුරු ධර්මය රැකෙන බව ප්‍රකාශ කිරීමටය. ඉර හඳ සංඛේතයන් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රාදේශීය කොඩි සඳහාද යොදා තිබීම විශේෂත්වයකි. දුටුගැමුණු රජුගේ කොඩියේද ඉරහඳ සංඛේතවත් කර තිබීම සුවිශේෂ වේ.



❒ මුල්කාලීන පෙන පහේ නාග සංඛේතය. මෙය ආරක්ෂාව සඳහා පිහිටුවන ලදී.

''නාග'' සංඛේතය ආරක්ෂාව සඳහා යොදා තිබෙන බව පෙනේ. පෙන තුන, පහ, හත වැනි සංඛේතවත් නාගයින් කලාකරුවා මේ සඳහා යොදාගෙන තිබේ. විශේෂයෙන්ම ජලයට සම්බන්ධ ස්ථානවල මෙම නාග සලකුණ දක්නට තිබේ. අනුරාධපුරයේ කුට්ටම් පොකුණ



❐ සංඛ සහ පද්ම බහිරව සංඛේත. ආරක්ෂාව, නීතිය ඉදිරියේ දිවුරුම් දීම ආදියේදී මෙම සංඛේත භාවිත වුණි.



❐ බෞද්ධ ගොඩනැගිලිවල ආරක්ෂාව සඳහා යොදාගත් දොරටුපාල සංඛේතය.

මෙහිලා වැදගත්ය. එසේම මිහින්තලයේ නාග පොකුණ වැදගත් වේ. සැම බෞද්ධ සිද්ධස්ථානයකටම ඇතුල් වන ස්ථානයේ ඇති මුරගල තුළ ''නාග'' සංඛේතය යොදා තිබෙන්නේ සියලුම නිදන් වස්තුවල සහ පූජනීය ස්ථානවල ආරක්ෂාව සඳහා මෙසේ නාග සංඛේතය භාවිත වී තිබෙන බව පැහැදිලි කරුණකි. මුචලින්ද නාග දරණයේ සිට බොහෝ බෞද්ධ කතා වස්තූන්වල ''නාගලෝකය'', ''නාග මාණික්‍යයන්'' වැනි දෑ බහුලව හමුවීම බෞද්ධයා තුළ මහත් ගෞරවයක් සහිත භක්තිය හා බිය මුසුවූ ගතියක් මෙම නාග සංඛේත සඳහා ඇත්තේය.



❒ සශ්‍රීකත්වයේ සංකේතය, පූර්ණ ඝටය, පුන්කලස. මෙහි උතුම් පූජනීයත්වය විදහා දැක්වීමට නෙළුම් මලක් සහ කඩා හැලෙන පොහොට්ටු යොදා තිබේ.

ලොව මවිත කළ හැකි කලා කෘතියක් ලෙසින් එහි පුන්කලස, නෙළුම් මල් ආදිය මෙන්ම බහිරව රූපද ස්ථානගත කර ඇත. ආරක්ෂාව, කලාව, සෞභාග්‍යය ආදිය මෙතරම් උසස් ආකාරයට විකාශනය වන වෙනත් කලා නිර්මාණයක් නොමැති තරම්ය.

අනුරාධපුරයේ සිට ''සංඛ'', ''පද්ම'' සංකේතයන් මිනිසුන් තුළ ආගම, ධර්මය, නීතිය, චාරිත්‍ර සඳහා අවනත භාවය ප්‍රකාශ කෙරෙන සංකේත වශයෙන් යොදාගෙන තිබේ. හක්ගෙඩියක් සිය ශීර්ෂ පළඳනවා කරගත් ''සංඛ'' බහිරව රූප විලාශයේ සංකේතයකි. ශීර්ෂයේ පියුමක් පළඳනාව කරගත් පද්මද බහිරව රූප සංකේතයකි. මෙම සංකේතයන් වර්තමානයේ පවා පොළොන්නරු ප්‍රදේශයේ පූජ්‍ය තත්ත්වයෙන් ගරු කරන බව පැහැදිලිය. තීන්දු ලබාදීම සමඟ සම්බන්ධ වන භූත, යක්ෂ හා දේව විශ්වාස සමඟ ''සංඛ හා පද්ම'' සම්බන්ධයක් ඇත.

වී කරල් සමඟ යොදාගත් සෞභාග්‍යය සංකේතවත් වූ පුන්කලස පූර්ණ ඝටය නෙළුම් මල් සමඟද ඉතා අලංකාර කලා



❒ 18 වන සියවසේ කන්ද උඩරට මහවාසල නිල මුද්‍රාව.



❒ පාරිශුද්ධත්වයේ බෞද්ධ සංකේතය සුපිපි නෙළුම. සියලුම ගෘහ නිර්මාණ, කණු ආදියට මෙම නෙළුම් පෙත්තේ නැමීම පාදම සඳහා යොදා ඇති බව පරීක්ෂාවෙන් බලන්නෙකුට වැටහේ.

කෘතියක් ලෙස භාවිත වී තිබේ. බත, බුලතින් මෙන්ම ජලයෙන් වැව් පිරී ඇති බවත් ස්වයංපෝෂිත සමාජ ක්‍රමය පිළිබඳ ඉඟිත් මෙහි තිබේ. කුට්ටම් පොකුණේ මේ හා සම්බන්ධ ඉතා අලංකාර පූර්ණ ඝට අටක් පමණ ස්ථානගත කර තිබේ. විශේෂයෙන් නෙළුම් මලේ පෙත්තේ හැඩය ගත් වේදිකාවක් මත පූර්ණ ඝටය තිබීම සෞභාග්‍යයේ සදාචාරාත්මක අංශයද ප්‍රකාශ කරන බව දැකිය හැක. රුවන්වැලි සෑ මළුවට ඇතුල්වන පියිකාවේ හතර දිශාවන්වල ස්ථාපිත කර ඇති පූර්ණ ඝටයන්ද මෙහිලා ඇති විශිෂ්ට කලා නිර්මාණයන්ය. පොළොන්නරුව බද්ධසීමා ප්‍රාසාදයේ සීමා කුළුණු මතද ඉතා අලංකාර පුන්කලස් කීපයක් තිබේ. මේවායේ ඉතා අලංකාර ගැට සහිත රෙදි කඩක් බැඳ තිබීම ඉතා විශිෂ්ට කලා නිර්මාණයකි. සියල්ලටම වඩා මුරගල්වල අතෙහි ස්ථාපිත කර තිබෙන පුන්කලස් ඉතා ඉසුරුමත් ලෙස සංඛේත කර තිබේ. කෙසේ වුවද මුරගල්වල විකාශනයේදී මුල්කාලීන ලෙස මෙම පුන්කලස පමණක් යොදා ඇති තැන් එමටය. මේ අතර රිටිගල පිහිටුවා ඇති සීමා මාලක ප්‍රධානය. තවද සක්මන් මළු අවසනදී සීමානියමය පවිත්‍ර භාවය හා යසඉසුරු බව පෙන්වීමට යෙදෙන්නට ඇත.


මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනය සමඟ නිර්මාණය වූ බුදු පිළිමය මේ සියල්ල පරදවා ලොව්තුරා බුදුපියාණන් වහන්සේගේ නවඅරහාදී බුදු ගුණ රළු ගල් කුලක් මත ඉතා සීරුවෙන් අතිශය සෞම්‍ය ලෙස හා ශෝභමාන ලෙස විද්‍යාමාන කිරීමට හෙළ කලාකරුවා සමත් විය. සමාධි පිළිමය, තොළුවිල පිළිමය ආදියෙහි ඇති අති සියුම් කාරුණික, මෛත්‍රී සහගත බව මෙන්ම අවුකන පිළිමය, ගල්විහාර පිළිම වහන්සේලා තුළ ඇති අතිශය යථාර්ථවාදී උසස් කලා ලක්ෂණ සමස්ත බුදු දහම සම්පිණ්ඩනයක් බඳු සංඛේත බවට පත්වී තිබේ. මේ සම්බන්ධයෙන් සිය අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ ශ්‍රීමතාණන් හෙළ කලාකරුවාගේ මෙම විශ්මිත නිර්මාණ පෙළ ''කලාත්මක භාවනාව'' යන වචනයෙන් හඳුන්වා දෙයි. බුදුන් වහන්සේගේ අනුපමේය මහා කරුණා ගුණය ඇතුළු විවිධ ගුණ ධර්මයන් පරදුක්ඛ දුක්ඛිත, සමාධි, ධම්මචක්ක, අභය ආදී මුද්‍රාවලින් සංඛේතවත් කර තිබේ.

සෑම බෞද්ධ ස්ථානයක් කරා සතර දිසාවෙන් පිය නංවන ගිහි, පැවිදි, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස සිය රාගාදි ක්ලේශයන් සමනය කොට හංසයන් සේ තැන්පත්ව, පිවිතුරුව නිර්වාණය වෙත ප්‍රවිශ්ඨ වීම සඳහා ආර්ය අෂ්ඨාංගික ගමන් මාර්ගයේ ගමන් ගැනීමට බුදු කුටියට ප්‍රවිශ්ට වන බව සංඛේතවත් කිරීමට බෞද්ධ ගොඩනැගිලිවලට ඇතුල් වන ස්ථානයේ පිහිටුවා ඇති සඳකඩ පහන, පියගැට පෙළ ආදියෙන් සංඛේතවත් වන බවද සඳහන් කළ හැකිය. මෙහි වඩාත් වැදගත් අංගය වන්නේ මකරාගේ මනෝමූලික රූප නිර්මාණයයි.

| | |
|---|---|
| ගජේන්ද්‍ර හස්තං කෘතපාද | සිංහම් |
| වරාහ කර්ණං හනුමන්ත | නේත්‍රම් |
| කරවාල දන්තං හදමත්‍ය | දේහම් |
| විචිත්‍ර පත්‍රම් - මකර ස්ව | රූපං |

ශක්තිමත්ම සත්වයා වන ඇතාගේ සොඬද, සිංහයාගේ ශකිත්මත්ම පාදයත්, කිඹුල් දත්, වඩාත්ම පෙනෙන නේත්‍ර ඇති වඳුරු ඇස්, හොඳින් ශබ්ද ඇසෙන ඌරාගේ කන්ද, නම්‍යතාවය හොඳින් ඇති මාළු ඇඟද, විචිත ශාක වල්ගයද යොදමින් අති සංකීර්ණ ශක්තිමත්ම බුද්ධිගෝචර නිර්මාණය මගින් බෞද්ධයාගේ බුද්ධි මහිමය හා මානසික ශක්තිය අර්ථවත්ව සංඛේත කර තිබෙන බව පැහැදිලි වේ.


මේ සියල්ලට අමතරව ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය යුගය වනවිට රාජ්‍ය මුද්‍රාව ලෙස පේරස් මුද්ද යොදාගෙන ඇත. විවිධ කොම්බු, සන්නස්, ප්‍රකාශන, ආඥා ආදියට එම මුද්‍රාව රාජ්‍ය සංඛේතය ලෙස භාවිතයට ගෙන තිබේ. හින්දු සහ මලබාර් රාජ්‍ය පරම්පරාවන් බෞද්ධ සංඛේතවලට වඩා රාජ්‍යත්වය-දේවත්වයට ආරූඪ කොට ක්‍රියා කළ බව පෙනේ. ඉතිහාසයේ අපට හමුවන එකම සිංහාසනය හා ඔටුන්න මෙලෙස දේව නියෝජිත රජුගේ විරාජමානවීම ප්‍රකාශයට පත්කරන සංඛේතය විය. විශේෂයෙන්ම මැණික් ඔබ්බවා රං කම්වලින් නිර්මිත මෙහි බටහිර රාජ්‍යයන්ගෙන් හමුවන ඊට සමාන සංඛේත ස්වරූපයක් විද්‍යාමාන වේ.



❒ රිටිගල සන්නසේ ඇති රාජකීය අත්සන.

මීට අමතරව පැරණි සිංහල රාජාණ්ඩු ක්‍රමයේදී ඉහළ රාජ්‍ය නිල කාර්යයන්වලදී රජවරු භාවිත කළේ ශ්‍රී යන සංඥාත්මක අක්ෂරයයි. එදා "නෛකශ්‍රීයෙන් විරාජමාන" වූ යන යෙදීම බුදුන් වහන්සේ සඳහාද ඇතැම් විට "විරාජමාන වූ ශ්‍රී" රාජෝත්තමයාණන් වහන්සේ යන යෙදීම් භාවිත වූ බව ප්‍රකටය. කෙසේ වුවද මහාචාර්ය රැල්ෆ් පීරිස් සිය සමාජ සංවිධාන ග්‍රන්ථයෙන් පෙන්වා දෙන පරිදි රජතුමාගේ නියෝගවලදී මෙන්ම රටට විශිෂ්ට සේවයක් කළ විවිධ පුරවැසියන් වෙත ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීමේදී සන්නස කාඹන් පත්වල ලියූ විට ඒ නමින්ද ඒවා පුස්කොළ පොත්වල ලියූ විට "කුඩපත" යන නමද භාවිත වූ බව කියැවේ. කුමන ආකාරයට භාවිතාවට ගනු ලැබුවද මේවා රාජ්‍ය නියෝග වන අතර නීත්‍යානුකූලභාවය අදාළ "ශ්‍රී" මගින් හඳුනාගත හැකි බව පෙනේ. මේ අනුව 1514-1547 අතර මහනුවර රජ කළ දෙවැනි ජයවීර (වික්‍රමබාහු රජුගේ පුත්‍ර) රජු විසින් නිකුත් කළ "ඔලුපැලියාවේ සන්නස" මේ යටතේ හමුවන ප්‍රථම සන්නසයි. එහි රජු හා ප්‍රාදේශීය පාලකයින් නියෝජනය සඳහා වෘත්තය හා අඩකවය යොදා අත්සන් ලෙස සංඥිත කළ බවත් පසුව 1635-1687 අතර මහනුවර රජ කළ රාජසිංහ රජු විසින් නිකුත් කළ රිටිගල සන්නසේ ශ්‍රී අක්ෂරය මෙසේ සටහන්ව ඇත. මේ ආකාරයට විග්‍රහ කළ විට ක්‍රි.ව. 13-14

සියවස්වලට පසුව ශ්‍රී අක්ෂරයද රාජකීය සංකේතයක් ලෙස භාවිත වන්නට ඇත. මෙහි වඩාත් වැදගත් වන්නේ 1718 දී රඹේමුල්ලේ විහාරයට ඉඩම් පූජා කිරීමට යොදාගත් සන්නසේ ඉර-හඳ ලාංඡනය සමඟ ශ්‍රී අක්ෂරය භාවිත කර තිබීමයි.



❒ ඉර-හඳ ලාංඡනය සමඟ ඇති රාජකීය අත්සන.

1505 පෘතුගීසීන්ගේ පෘතුගීසීන්ගේ පාලන සමයේදී පලිහ, කුරුසය සමඟ ඔටුන්න සහිත ලාංඡනයත් සිය රාජ්‍යත්වය සංකේත කිරීමට යොදාගෙන තිබුණි. මෙම පෘතුගීසි ලාංඡනය දැනටමත් කොළඹ කොටුවේ ජනාධිපති මන්දිරය අසබඩ ස්ථානයක ආරක්ෂිතව තිබේ. පාලනය, ආගම, විනය, දණ්ඩනය ආදී සියල්ල එම සංකේතයන්ගෙන් ඉදිරිපත් කෙරේ. නමුත් පෘතුගීසි බලකොටු ආශ්‍රිතවද විවිධ ලාංඡන තිබුණි. මැණික්කඩවර පෘතුගීසි



❒ පෘතුගීසි බලකොටු ලාංඡන. මෙය මැණිකඩවර පෘතුගීසි බලකොටුවෙන් ලබාගන්නා ලදී. (ඡායාː කෞතුකාගාරය අනුග්‍රහයෙනි.)




❒ ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගමේ ප්‍රධාන ලාංඡනය. (ඡායාරූපය ජාතික ලේඛනාගාරයේ අනුග්‍රහයෙනි.)

බලකොටුව නියෝජනය කරන ලද ලාංඡනය මෙහිලා සුවිශේෂ උදාහරණයකි.

ලංකාවේ බොහෝ ලාංඡන දක්නට ලැබෙන කාලසීමාවක් ලෙස ලන්දේසි යුගය පෙන්වා දිය හැක. ලන්දේසීන් විසින් පාලනය කළ පරිපාලන ප්‍රදේශ (Commandements) හඳුනා ගැනීම සඳහා වෙන්වූ ලාංඡන නිර්මාණය කොට තිබේ. මේවායේ ප්‍රධාන මධ්‍යස්ථානය වූ කොළඹ දිසාව සඳහා වූ ලාංඡනයේ පමණක් ඔටුන්න දක්නට ලැබීම විශේෂිතයි. නමුත් සෙසු ප්‍රාදේශීය ලාංඡන සඳහා එම ප්‍රදේශයට සම්බන්ධ සංකේතයන් යොදා තිබේ. එසේම එම ලාංඡන මුදුනේ VOC යන අකුරු තුන දක්වා තිබේ. ඉන් ප්‍රකාශ වන්නේ පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගමයි.

## VEREENIGDE OOST INDISCHE COMPAGNIE

ඉහත ආකාරයට ප්‍රධාන අකුරු තුනෙන් එම වචනය නිර්මාණය කර තිබේ. මේ අනුව හැම ලියවිල්ලකටම සහ ලන්දේසි භාණ්ඩ සඳහාද මෙම වාක්‍යය අන්තර්ගත කොට තිබේ. එසේම ලන්දේසි පල්ලි ආශ්‍රිතවද මෙම ලාංඡනය යෙදී තිබීම වැදගත්ය. ගාල්ල, පිටකොටුව ආදියේ ඇති කොටුබැම්ම, පල්ලි මෙහිලා උදාහරණයන්ය.

පෘතුගීසි, ලන්දේසි පාලනය පසුකොට ඉංග්‍රීසි පාලන කාලය වනවිට බොහෝ දේශීය රදළ පන්තියේ අය ලාංකික වුවද ඔවුන්ගේ නම්, ගම්, ආගම, චර්යාව ආදී සියල්ලම බටහිර ගැති භාවයන් පෙන්නුම් කරන්නට තරම් සමත් වී තිබුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ "බටහිර අධ්‍යාපනයෙන්" සන්නද්ධ වී බටහිරකරණය වීමයි. විශේෂයෙන් ආගම පවා කතෝලික, ක්‍රිස්තියානි වීම තම සමාජ න්‍යාය පෙන්නුම් කරන ලද්දක් ලෙස සැලකුණි. තවද සිය භාෂාව බවට පත්වූයේ ඉංග්‍රීසියයි. තමන්ගේ හා තම දරුවන්ගේ බටහිර අධ්‍යාපනයත් තමන් ලත් තාන්න මාන්න හා වරප්‍රසාද නිසා බටහිරට වන්දනාමාන කරන ප්‍රභූ පැලැන්තියක් ලෙස සකස් වූ පිරිසක් විය. ලංකාවේ ඉඩම් හිමිවූ වරප්‍රසාද පන්තිය වූයේද ඔවුන්මය.

අනෙක් අතට සාමාන්‍ය පොදු සිංහල, බෞද්ධ ජනතාව ද්‍රවිඩ ජනතාව අතිශයින් දුක් පීඩා විඳින දිළිඳුකම, අසරණකම හා




❒ ඉංග්‍රීසි යුගයේ රාජ්‍ය ලාංඡනය.

සමාජයෙන් කොන්වීමේ තත්ත්වය උරුම කොට ජීවත් වූ පිරිසක් විය. ඔවුන් තුළින් විටින් විට අධිරාජ්‍ය විරෝධී නායකයින් පැන නැගුණි. පසුකාලයකදී බිහිවන පොන්නම්බලම් අරුණාචලම්, පොන්නම්බලම් රාමනාදන්, චෙල්වනායගම් ආදී මහතුන් එයට උදාහරණ වේ. විවිධ කැරලි කෝලාහල, ඉල්ලීම්, උද්ඝෝෂණ ඒ තුළින් ඉදිරියට පැමිණියේය. එසේම මේ සියල්ල දරුණු ලෙස මැඩලීමට බ්‍රිතාන්‍යයන් පියවර ගති. මේ සියල්ලට නායකත්වය දුන් බෞද්ධ භික්ෂුවද අධිරාජ්‍යවාදීන්ගේ සතුරු ඉලක්කයක් බවට පත්විය. එසේම බෞද්ධ භික්ෂුවගේ එම කාර්යභාරය උන්වහන්සේලාගෙන් ඉවත් කොට රටේ අපේකම නැති කිරීම සඳහා විවිධ උපක්‍රම යෙදීමට ඉංග්‍රීසීන් පසුබට වූයේ නැත.


මෙයට ප්‍රථම එනම් 1798 පමණ සිට බ්‍රිතාන්‍යයන් විසින් සිය රජුගේ (ජෝර්ජ් රජු) ඔටුන්න ශීර්ෂය සමඟ රාජ්‍ය ලාංඡනය ලෙස යොදා ගත්තේය. ඉන්පසුව මහ රැජිනගේ (වික්ටෝරියා) ඔටුන්න සහ රුව සිය ලාංඡනය සඳහා යොදාගති. විශේෂයෙන්ම ඉංග්‍රීසි මුද්දර සහ වෙනස් මුද්‍රා පරීක්ෂා කරන විට මෙය හොඳින් වටහා ගත හැකිවේ. එකල ස්ථාපිත කරනු ලැබූ ලියුම් පෙට්ටිවලද එම මුද්‍රාව දකගන්නට හැකි විය.

ඉන් අනතුරුව 1948 දී නිදහසින් පසු අපගේ සංකේතය වෙනස් ආරක් ගති. පලාපෙතිවලින් වටවූ ශ්‍රී වික්‍රම රාජසිංහ දිවයිනේ අන්තිම රජුට අයත් ඔටුන්න එම ලාංඡනය විය. ඊට පහළින් ද්‍රවිඩ, සිංහල, ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් Ceylon ලෙස ලියා තිබුණි. විශේෂයෙන්ම පාරිශුද්ධත්වය සංකේතවත් කරන පලාපෙති මෙම

ලාංඡනයට යෙදී තිබීම වැදගත් ලක්ෂණයක් ඉඟි කරනු ඇත. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ඔටුන්න රැගත් ලාංඡනය 1948-1972 දක්වා පැවතුණි.

## ❒ අභිනව ජනරජය සඳහා ලාංඡනයක් නිර්මාණය කිරීමේ කාර්යය

ඉහත පරිච්ඡේදයේ සඳහන් ආකාරයට ව්‍යවස්ථා විප්ලවයක් තුළින් බිහිකළ නව ව්‍යවස්ථාවට අනුව එය ක්‍රියාත්මක වන දිනය නිල වශයෙන් තීරණය වූයේ විශේෂ කැබිනට් සාකච්ඡා කීපයකට පසුය. මේ අනුව 1972 මැයි මස 22 වෙනි දින සිට නිල වශයෙන් මෙය ක්‍රියාත්මක වන බව ප්‍රකාශයට පත්කරන්නට යෙදුණි. මේ කටයුත්ත සමස්ත ජාතියටම ඉතා වැදගත් වූ බැවින් මේ සඳහා රාජ්‍ය මට්ටමෙන් උත්සවයක්ද සංවිධානය කළ යුතු විය. මේ සමස්ත කටයුතු සඳහා ඉතා කෙටි කාලයක් තිබූ අතර එවකට පාර්ලිමේන්තු කතානායක ධුරන්දර (නව ව්‍යවස්ථාව අනුව ජාතික රාජ්‍ය සභාව) නීතිඥ ස්ටැන්ලි තිලකරත්න, අමාත්‍යවරුන් වන මෛත්‍රීපාල සේනානායක, ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක, ටී. බී. ඉලංගරත්න, රත්නසිරි වික්‍රමනායක යන අය ගරු අග්‍රාමාත්‍යතුමියට මෙන්ම නව ව්‍යවස්ථාවේ නිර්මාතෘ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිඳුන් සමඟ අදාළ කාර්යයේ ප්‍රධාන චරිතයන් ලෙස වගකීම උසුලනු ලැබීය.




❒ 1948-1972 ලාංඡනය

කෙසේ හෝ මාස කීපයක් ඇතුළත ජනරජය බිහිවීමත් සමඟ භාවිත කිරීම සඳහා නව රාජ්‍ය ලාංඡනයක අවශ්‍යතාව ගරු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පෙන්වා දුනි. මෙහි කාර්යය හා වගකීම් එවකට සංස්කෘතික අමාත්‍යවරයා වෙත පැවරුණු අර අග්‍රාමාත්‍යතුමියගේ මඟ පෙන්වීම යටතේ එතුමාණන් විසින් ''ජනරජ ලාංඡන කමිටුවක්'' පත් කරන්නට යෙදුණේ එවකට සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා ලෙස කටයුතු කළ ගරු නිශ්ශංක විජේරත්න මහත්මාගේ සභාපතිත්වය යටතේය. ඒ සඳහා පත්වූ සෙසු සාමාජිකයන් වූයේ,

මහාචාර්ය සෙනරත් පරණවිතාන,
මැකී රත්වත්ත,
නන්දදේව විජේසේකර,
එච්. ආර්. ප්‍රේමරත්න,
ආචාර්ය රෝලන්ඩ් ද සිල්වා යන අයයි. පසුව පත්කළ සෙසු නිල ලාංඡන සකස කිරීමේ කමිටුවේ, මහගමසේකර, එච්. ආර්. ප්‍රේමරත්න, අමරවංශ දේවරාජ, නිමල් කේ. පතිරණ (ලේකම්) ලෙස ක්‍රියාකරන ලදී.

මොවුන් පත්වූ විගස පුවත්පත්වල දැන්වීමක් ප්‍රසිද්ධ කරමින් ශ්‍රී ලංකාවට සුදුසු ලාංඡනයක් නිර්මාණය සඳහා ජනතා අදහස් හා නිර්මාණ භාරගැනීමත් සිදුකරන ලදී. කෙසේ හෝ ජනරජ උත්සව-යටද එතරම් කාලයක් නොවූ හෙයින් සති කීපයක් තුළ අවසන් තීරණ ගැනීමේ අවශ්‍යතාවක්ද කමිටුව ඉදිරියේ තිබුණි.

නියමිත දිනය වනවිට සෑහීමකට පත්විය යුතු තරම් ලාංඡන නිර්මාණ සටහනක් කමිටුවට ලැබී නොතිබුණත් ලාංඡනයේ අන්තර්ගතය විය යුතු සංකේත මොනවාද යන්න පිළිබඳ නිවැරදි අදහසක් ජනතා අදහස් තුළින් හා විද්වත් මතිමතාන්තර තුළින් කමිටුව සතුවී තිබුණි.

කාලය පිළිබඳ අර්බුදයකද හිරවී සිටි කමිටුව මේ සඳහා හැකි ඉක්මනින් පුද්ගලයෙක් තෝරා ඔහු වෙත උපදෙස් ලබාදී ලාංඡනයක් නිර්මාණය කරගැනීම වෙත අවධානය යොමුවී තිබුණි. මේ සඳහා තෝරාගැනීමේ ප්‍රශ්නයක් ඇති නොවූයේ කමිටුවේ සභාපති නිශ්ශංක විජේරත්න මහතාත්, මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාත්,

ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතාටත් මැනවින්ම සුදුසු පුද්ගලයා කවුද යන්න පෞද්ගලිකවම වැටහීමක් තිබීමයි. ඒ අන් කවරකු වත් නොව 1942 සිට පුරාවිද්‍යාවේ සැලසුම් ශිල්පී ලෙස කටයුතු කරමින් සිටින ඇස්. ඇම්. සෙනෙවිරත්න මහතායි.

සෙනෙවිරත්න මහතා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේන්තුවට ඇතුල් වීමටත් පෙර සිට ගරු නිශ්ශංක විජේරත්න මැතිඳුන් එතුමාගේ කලා හැකියාව පිළිබඳ මනා වැටහීමක් ලබා තිබුණි. ඒ සෙනෙවිරත්න මහතා මෙන්ම එතුමාත් එකම ගමෙහි වැසියන් වීමයි. දූලිවල ග්‍රාමයේ එවකට ගම්මුලාදෑනිව සිටි එස්. එම්. ටිකිරිබණ්ඩා නිලමෙතුමා සෙනෙවිරත්න මහතාගේ පියාණන් වූ අතර, ගමේ ප්‍රභූ පවුලක් නියෝජනය කළ නිශ්ශංක විජේරත්න මහතා විසින් බොහෝ සමිති සමාගම්වලදී, පන්සල් උත්සව, තොරන් හා නොයෙක් පෞද්ගලික කලා නිර්මාණ පවා සෙනෙවිරත්න තරුණයා ලවා කරවා ගැනීම හා ඒවා මහත් සේ ඇගයීමට පුරුදු වූ අයකුද වීමයි. මේ අනුව නිශ්ශංක විජේරත්න මැතිඳුන් සිංහල ආර්ය සමාජයේ ලාංඡනය පවා නිර්මාණය කරගනු ලැබුවේ සෙනෙවිරත්නයන් ලවායි. එය ඒ වනවිට වසර තිස් ගණනක දැන හඳුනා ගැනීමේ ප්‍රථම නිර්දේශය වූ බව ඉතා පැහැදිලිය.

මෙය මනාව සනාථ වන ප්‍රධාන කරුණක්ද මේ අතර තිබේ. ඒ 1952 වසරේදී එවකට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේ ජ්‍යෙෂ්ඨ සිවිල් නිලධාරියකු වූ නිශ්ශංක විජේරත්න මහතාය. එතුමාගේ පෞද්ගලික ආරාධනයෙන් අදාළ දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා "කොන්සියලර්" මුද්දරය නිර්මාණය කළේද සෙනෙවිරත්න මහතා විසිනි. විදේශිකයකු සඳහා වීසා නිකුත් කිරීමේදී මෙම මුද්දරය එහි ඇතුළත් කිරීම සිදුවන අතර මේ අනුව අදටත් භාවිත වන්නේ එයයි. මේ සියල්ල නිර්දශ කමිටුවේ සභාපතිවරයා විසින් අදාළ කාරණය සෙනෙවිරත්නයට භාරදීමට බලනොපෑවා යයි කීමට නොහැක.


දෙවෙනි නිර්දේශය කමිටුවෙන් ලැබුණේ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් මගිනි. එවකට සෙනෙවිරත්නයන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වූයේද ශ්‍රී ලංකාවට අමිල ජාතික සේවයක් කළ

අප්‍රමාණ දෙස් විදෙස් ඇගයීම් සඳහා භාජනය වූ ඒ මහා යුග පුරුෂයාය. එතුමා එවකට පුරාවිද්‍යා කොමසාරිස් ලෙස කටයුතු කරන ලදී. පරණවිතාන ශූරීන් සෙනෙවිරත්නයන් කෙරෙහි කොතරම් පැහැදීමක් තිබුණේද යත් තමා සම්පාදනය කළ පුරාවිද්‍යා ග්‍රන්ථවලට අවශ්‍ය චිත්‍ර නිර්මාණයන් සඳහා තෝරාගනු ලැබුවේ සෙනෙවිරත්නයන්ය. එපමණක් නොව සෙනරත් පරණවිතාන ශූරීන් පුරාවිද්‍යා රාජකාරී සඳහා කොළඹින් බැහැර ස්ථාන සංචාරයන් සඳහාද බොහෝවිට තමා සමඟ රැගෙන ගිය නිලධාරියා වූයේද ඇස්. ඇම්. සෙනෙවිරත්නයන්ය. විවිධ පුරාවිද්‍යා ස්ථානයන්වල පරණවිතානයන් දුටු විශේෂ ලක්ෂණ එතුමාට අවශ්‍ය ලෙසටම කටු පෑනෙන් සෙනෙවිරත්න පරිමානානුකූල රේඛා සටහනක් නිවැරදිව ලබාදෙන බවට එතුමා තුළ තිබුණේ දැඩි විශ්වාසයකි. මෙනිසා මහාචාර්ය පරණවිතානයන්ගේ නිර්දේශය වූයේද සෙනෙවිරත්නයන්ය.

තෙවැනි නිර්දේශය නිකුත් කරනු ලැබුවේ ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතායි. එවකට එතුමා සහකාර පුරාවිද්‍යා කොමසාරිස් (වාස්තු විද්‍යා) ධුරය දරන ලද අතර සෙනෙවිරත්න මහතා ඇතුළු සමස්ත සැලසුම් ශිල්පී අංශයම භාර වූයේ රෝලන්ඩ් සිල්වා මහතාටය. තම අංශ ප්‍රධානියා ලෙස සෙනෙවිරත්න මහතා මේ වනතුරුත් එතුමාට දක්වන්නේ අතිශයින්ම ළෙන්ගතු වූ ගෞරවයකි. අදාළ වාස්තු විද්‍යා අංශ ප්‍රධානියා මෙන්ම රෝලන්ඩ් සිල්වා මහතා වරලත් වාස්තු විද්‍යාඥයකු විය. එසේම මොරටුව සරසවියේ වාස්තු විද්‍යා අංශයේ කථිකාචාර්යවරයකු ලෙසටද ක්‍රියා කළේය. එවකට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ජාතික වශයෙන් ලැබෙන සියලුම සැලසුම් නිර්මාණ හා වෙනත් නිර්මාණයන්ද පුරාවස්තු සටහන් ලබාගැනීම හා පුරාවිද්‍යා ප්‍රකාශන සඳහා අවශ්‍ය චිත්‍ර නිර්මාණයන්ද, සංරක්ෂණ සැලසුම් නිර්මාණයන්ද සිදුකලේ මෙම වාස්තු විද්‍යා අංශයෙනි. 1972 වනවිට ශ්‍රී මහබෝධි රන්වැට නිර්මාණය සෙනෙවිරත්න මහතා සිදුකලේ මෙම අංශය තුළ සිටයි. එසේම 1958 කතරගම කිරිවෙහෙර ප්‍රතිසංස්කරණ සැලසුම, මිහින්තලයේ දාගැබේ සැලසුම, කොළඹ විශ්වවිද්‍යාලයේ ලාංඡනය, ජාතික ලේඛනාගාරයේ කෞතුකාගාර ලාංඡනය, ජාතික සැලසුම් ශිල්පීන්ගේ ලාංඡනය, 1967 කැනඩාවේ පැවැති EXPO

ප්‍රදර්ශනය සඳහා සංස්කෘතික අමාත්‍යංශ ප්‍රදර්ශන කුටිය සැලසුම් කිරීම, පුරාවිද්‍යා භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා සූදානම් කිරීම හා පුරාවිද්‍යා ප්‍රකාශන සඳහා සැලසුම් නිර්මාණය මේ අතර කැපී පෙනෙයි. එසේම ජනාධිපති මන්දිරයේ සේවක නිල ඇඳුම් නිර්මාණයද විය.


එපමණක් නොව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ලාංඡනය පවා නිර්මාණය කළේ සෙනෙවිරත්න මහතායි. මෙම නිර්මාණ තුළින් සෙනෙවිරත්න තුළ සිටි නිර්මාණකරුවා සියල්ලටම වඩා දැන හඳුනාගෙන අදාළ රාජකාරී සෘජුවම ඔහුට භාරකිරීම සිදුකළේ රෝලන්ඩ් සිල්වා මහතා විසිනි. එබැවින් එතුමාට මේ සම්බන්ධයෙන් තිබුණේ අපමණ වූ විශ්වාසයකි. සෙනෙවිරත්නයන් ලවා ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයද නිර්මාණය කරගත යුතුය යන තෙවැනි නිර්දේශයට පදනම සකස් වූයේ මෙලෙසටය.





☐ 1950 දී සෙනෙවිරත්න මහතා විසින් එවකට ආගමන හා විගමන අධ්‍යක්ෂ ලෙස සිටි නිශ්ශංක විජේරත්න මහතාගේ ඉල්ලීමකට අනුව අඳින ලද කොන්සියුලර් මුද්දරයයි. මෙය විදේශිකයෙක් ශ්‍රී ලංකාවට පැමිණෙන විට ඔවුන්ගේ ගමන් බලපත්‍රවල ලංකාවේ වීසා බලපත්‍රය ලෙස මේ වනතුරුත් පාවිච්චි වන්නකි.



❒ 1942-49 වකවානුව වනවිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සිටි සියලුම නිලධාරීන් හා සේවක මණ්ඩලය ඡායාරූපයේ දැක්වේ. මෙහි මූලාසනයේ මහාචාර්ය සෙනරත් පරණවිතාන ගුරින් සිටී. සද්ධාමංගල කරුණාරත්න, ටී. දේවේන්ද්‍ර වැනි විශිෂ්ටයින්ද සිටී. දෙවෙනි පේලියේ දකුණුපස සිට තෙවැන්නා සෙනෙවිරත්න මහතාය.




❒ මහාචාර්ය සෙනරත් පරණවිතාන ගුරින්ගේ දෙවිනුවර උපුල්වන් දේවාලය පිළිබඳ ග්‍රන්ථයට මෙම චිත්‍ර සටහන් සහ එහි දොර උළුවස්ස සෙනෙවිරත්න මහතා විසින් 1953 දී අඳින ලදී.



MEMOIRS OF THE
ARCHAEOLOGICAL SURVEY OF CEYLON


VOLUME VII

THE KOṬAVEHERA
AT DEDIGAMA

BY
C. E. GODAKUMBURA
M.A., Ph.D., D.Lit. (London)

PUBLISHED BY
THE DEPARTMENT OF ARCHAEOLOGY
COLOMBO, CEYLON

❐ 1969 දී ආචාර්ය චාල්ස් ගොඩකුඹුරේ මහතා විසින් සම්පාදිත දැඩිගම කොටවෙහෙර ග්‍රන්ථයට එම ප්‍රදේශයෙන් හමුවූ සියලු පුරාවස්තු ඉතා සූක්ෂමව සෙනෙවිරත්න මහතා විසින් අදාළ ග්‍රන්ථය සඳහා අඳින ලදී. සුප්‍රසිද්ධ ඇති පහන මෙහි තිබේ. සෙනෙවිරත්න මහතා විසින්ම අදාළ .... වගකීම භාරගත් අතර පුරාවිද්‍යාවට වසර 100 ක් පිරීම නිමිත්තෙන් පුරාවිද්‍යා චක්‍රවර්ති උපාධිය සමග මෙහි අනුරුවක්ද එතුමාට ප්‍රදානය කරන ලදී.




❐ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශයට පත්කරනු ලැබූ 'සිංහල උළුවච්'
ග්‍රන්ථයේ චිත්‍ර කිහිපයක් හැර සියලුම දොර උළුවච් අඳින ලද්දේ සෙනෙවිරත්න
මහතා විසිනි. මෙහි දැක්වෙන රිදී විහාර උළුවස්ස ඇත් දළවලින් නිර්මිතයි.
එහි ඉඩ ඉතිරි කර ඇත්තේ එවකට එම ඇත්දත් කැටයම් කොටස් සොරුන්
විසින් ගලවාගෙන ගොස් තිබූ හෙයිනි. දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශිත
'කලා පෙළ' ග්‍රන්ථ සියල්ලටම වගේ සෙනෙවිරත්න මහතාගේ නිර්මාණ
ලබාදුනි. ඉන් ප්‍රධාන වන්නේ 'සිංහල උළුහච්' ග්‍රන්ථයත්, 'තිවංක පිළිමගේ'
සිතුවම් ග්‍රන්ථයත්ය.

ඉහත කමිටු කැඳවීම පරිදි සෙනෙවිරත්නයට කඩිනමින් උපදෙස් රාශියක් ලැබුණි. එනම් ලාංඡනය තුළ අනිවාර්යයෙන් අන්තර්ගත විය යුතු සංකේත මොනවාද යන්නයි. කෙසේ හෝ හදිසි කටයුත්තක් ලෙස ඉතා කෙටි කලකින් අදාළ මුල් සටහන සෙනෙවිරත්න මහතා කොමිටුව වෙත ලබාදිය යුතු ලෙසද වාචික නියෝග නිකුත් විණි.

ශ්‍රී ලංකාවේ සම්පූර්ණයෙන් පරිවර්තනීය සිදුවීමක් වූ ජනරජය සඳහා ඉතා කෙටි කාලයක් තිබූ හෙයින් සමස්තයක් ලෙස රජයේ සියලු අමාත්‍යංශ, දෙපාර්තමේන්තුවලට ඉතා වේගයෙන් ඇතැම් කාර්යයන් සිදුකිරීමට සිදුවිය. මෙකල රජයේ ජ්‍යෙෂ්ඨ සිවිල් නිලධාරියකු ලෙස සේවය කළ නිශ්ශංක විජේරත්න මැතිතුමාගේ පෞද්ගලික ලේකම්වරයාව සිටි නිමල් කේ. පතිරණ මහතා 1986 නොවැම්බර් මස කල්පනා සඟරාවට ප්‍රකාශයක් කරමින් මෙකල රාජ්‍ය දෙපාර්තමේන්තු ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ මෙසේ අදහස් ප්‍රකාශ කර සිටී:

''බොහෝ කටයුතු කඩිනමින් කළයුතුව තිබිණි. ඉන් සමහරක් කෙරුණේ විජ්ජා මෙනි. නියෝග වැඩි ප්‍රමාණයක් වාචික ඒවා විය. කැඳවීම් මෙන්ම පැවරීම්ද වැඩිපුරම දූරකතනයට සීමාවිය. ලියා ඉල්ලා ගත යුතු දේ හමුවී ලබාගැනුණි. ලිඛිත නියෝගයක්, දැන්වීමක් කෙරුණා නම් ඒ ඉතා කලාතුරකිනි.''

ලාංඡනය නිර්මාණය කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය තුළද දක්නට ලැබුණේ ඉහත කී ස්වභාවයන්ය.

එතැන් සිට එය කැබිනට් අනුමැතිය ලබාගැනීම සඳහා ගතවූ කාලය තුළ යම් හිමිනමක් එහි තම අත්සන සටහන් කිරීමට ගත් උත්සාහය වැළකී ගොස් ඇත්තේ සෙනෙවිරත්න මහතා විසින් කමිටුව වෙත කෙටි කාලයක් තුළ ලබාදුන් ''කටු සටහන'' සංශෝධනයන්ට යටත්ව මුල් වටයේදී නැවත ඇඳීමට සිදුවීම නිසාය. එසේ නොවන්නට තම නිර්මාණයේ අයිතිය තමාට අහිමි වන්නට තිබුණු බව සෙනෙවිරත්න මහත්මා ඉතා කනගාටුවෙන් සැමවිටම සිහිපත් කරන්නෙකි. එවකට පුරාවිද්‍යා නියෝජ්‍ය කොමසාරිස් ධූරය දැරූ රෝලන්ඩ් සිල්වා මහතා මේ සිදුවීම පිළිබඳව හොඳින් දන්නා අයෙකි.

කෙසේ හෝ ඉන් අනතුරුවද ඇතැම් ප්‍රධානීන්ටද වුවමනා වූයේ අදාළ ස්වාමීන් වහන්සේගෙන් වර්ණ සංකලනයක් පිළිබඳව හෝ සෘජු උපදෙස් ලබාගැනීමටය. එවකට සංස්කෘතික අමාත්‍යංශයේ බෞද්ධ කටයුතු පිළිබඳ උපදේශකත්වයක් දැරූ උන්වහන්සේ අදාළ කටයුත්තට උපදෙස් දීම පිණිස පැමිණි විට ඉතා නිහතමානීව ඒ

යෙනේ,

මේ අවසන් වතාවේ කරදර කිරීමට ලැබීම ගැන කණගාටුයි. එහෙත් ගරු අග්‍රාමාත්‍ය තුමිය ඉතා කැමැත්තෙන් සිටිනවා අවසන් කළ රාජ්‍ය ලාංඡනය දකින්න. 1972 මැයි මස 12 වෙනි දින පෙ.ව.රු. 10.30 ට එතුමිය ඔබේ ලාංඡනය තෝරා ගන්න. වෙනස්කම් කිහිපයකට යටත්ව. එවඑවීවා මොනවා දැයි ලාංඡන සැලැස් මෙම සටහන් කර ඇත.

එච්.ආර්. ප්‍රේමරත්න මහතා පෙ.ව. 9.45 ට පමණ ඔබ හමුවී ඒ වෙනස් කළ යුතු කොටස් සාකච්ඡා කරයි. අද රෑට නිම කොට හෙට පෙරවරු 7.45 ට රැගෙන ආ යුතුය.

කළු සුදු සැලැස්ම රාත්‍රියට නිම කොට සිංහයත් පලාපෙතින් පමණක් පැන්සලෙන් තිබිය යුතුයි. වර්ණ ගැන්වීම පෙරවරු 7.45 සිට 10.30 දක්වා කාලය තුළ නිම කොට අතිගරු අග්‍රාමාත්‍ය තුමියට පෙන්විය හැකියි.

කරදර කිරීම ගැන කණගාටුයි.

ස්තුතියි.

මෙයට,

රෝලන්ඩ් සිල්වා

1972.05.11

❒ සෙනෙවිරත්න මහතා ඉදිරිපත් කළ ජනරජ ලාංඡනයේ මුල් සටහන අගමැතිනිය පිළිගත් බව ආචාර්ය රෝලන්ඩ් සිල්වා සෙනෙවිරත්න මහතාට දන්වා එවීමට භාවිත කළ ලියුම.

සඳහා සෙනෙවිරත්න මහත්මා සූදානම් වුවද, ලාංඡනයට වරණ යෙදෙන ආකාරය දුටු උත්වහන්සේද කියා සිටියේ ඉතා හොඳින් එම කටයුත්ත සෙනෙවිරත්න මහතා විසින් සිදුකරන බවයි. මෙලෙස කළු සුදු සංශෝධිත සටහනට හා එයට අනුකූලව වර්ණද, සංකලන සටහන්ද වශයෙන් නිවැරදි අවසන් පිටපත් සකස් කළ සෙනෙවිරත්න මහතා විසින් ජනරජ ලාංඡන කමිටුවට එය යොමුකරන ලදී. එය නියම ආකාරයටම සිදුවී ඇති බව පිළිගත් කමිටු සාමාජිකයින් වන නිශ්ශංක විජේරත්න, එච්. ආර්. ප්‍රේමරත්න, රෝලන්ඩ් සිල්වා සහ දොස්තර මැකී රත්වත්ත යන මහතුන් ඒ මොහොතේදීම සෙනෙවිරත්න නිර්මාණකරුවාද සමඟ අරලියගහ මන්දිරයට යනු ලැබුයේ ගරු අග්‍රාමාත්‍යතුමියට එය පෙන්වා අනුමැතිය ලබාගැනීමටය. ලාංඡනය දුටු අග්‍රාමාත්‍යතුමිය එය ප්‍රශංසාවට ලක් කළ අතර සෙනෙවිරත්න මහතා ලවාම ඔහුගේම අත් අකුරින් මෙම "සැලැස්ම ශ්‍රී ලංකා ජනරජයේ ලාංඡනය වශයෙන් අනුමත කරමි" කියා ලියවා ගත් අතර එතුමිය සිය අත්සන යෙදුවාය. පසුව 'අග්‍රාමාත්‍ය' යන වචනය හා දිනය සටහන් කරගනු ලැබුවේද සෙනෙවිරත්න මහතාගේම අත් අකුරිනි. මේ සියල්ල නිමවූ විගස අගමැතිනිය ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතාට උපදෙස් ලබාදුන්නේ මෙසේය:


"මේකෙම වම් පැත්තෙ නිර්මාණ ශිල්පියාගෙ නමත් එක්ක අත්සන දාලා මුල් පිටපතක් හැටියට ජාතික ලේඛනාගාරයට යවන්න."

"නමුත් මම කොහොමද මෙච්චර ලොකු දෙයකට මගේ අත්සන හරි හරියට වම් පැත්තෙ දාන්නෙ රටේ රාජ්‍ය නායිකාව එක්ක. ඉතින් මං කළේ එහා පැත්තෙ,

අඳින ලද්දේ,
ඇස්. ඇම්. සෙනෙවිරත්න,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ 7. කියලා ලිව්වා. එච්චරයි. අන්න ඒ පිටපත තමයි කොයි කාටත් බලාගන්න රාජ්‍ය ලේඛනාගාරයේ තියෙන්නෙ."

එසේ ඉතා නිරහංකාරව ප්‍රකාශ කළේ ඒ පුංචි මිනිසාය. නමුත් රටට, ජාතියට මෙන්ම මෙම ග්‍රන්ථ කර්තෘ වන මටත්, මාගේ ජීවිතයටත් ඒ පුංචි මිනිසා ශ්‍රේෂ්ඨ වීරවරයෙකි. ඒ අන් කවුරුවත්

විමර්ශන අංශය
මහ නගර සභාව
කුරුණෑගල



❒ ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ මුල් පිටපත. රාජ්‍ය ලේඛනාගාරයේ සුරක්ෂිතව තැන්පත් කර තිබේ.

සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
MINISTRY OF CULTURAL AFFAIRS
212, බෞද්ධාලෝක මාවත
212, Bauddhaloka Mawatha

03559
04743
04300
32324
85888
85794

කොළඹ 7 / Colombo 7 } 1972 ජූලි මස 11 දින.

ඇස්.ඇම්.සෙනෙවිරත්න මහතා,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
සර් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 7.

නව ජන රජයේ සිල ලාංඡනය.

ඉහත සී ලාංඡනය නිර්මාණය කිරීම සඳහා ඔබගේ ... සේවය ගැන අපග කෙටි සලකන අතර, එහේ හෘදයාංගම ස්තුතිය ඉතා ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

පං/ලේ.

❒ ජනරජ ලාංඡනය නිර්මාණය කිරීමෙන් පසු සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් ලෙස නිශ්ශංක විජේරත්න මහත්මා කළ කාර්යයට ස්තුතිය පුද කරමින් එවන ලද ඇගයීම් ලිපිය.

නොව ඇස්. ඇම්. සෙනෙවිරත්න නම් වූ සැබෑ කලාකරුවාණන්ය. ඒ සැබෑ මිනිසාය.

ඒ වනවිට 1972 මැයි 12 ද වී තිබුණි. ජනරජ උළෙල සඳහා තිබුණේ තවත් දින 10 ක් පමණි. මේ අනුව ඉතා ඉක්මනින් ක්‍රියාත්මක වූ සංස්කෘතික අමාත්‍යතුමාත්, රාජ්‍ය පරිපාලන කටයුතු පිළිබඳ අමාත්‍යතුමාත්, එහි පිටපත් රාජ්‍ය මුද්‍රණාලය මගින් මුද්‍රණය කොට රටපුරා කච්චේරි, දෙපාර්තමේන්තු, අමාත්‍යංශ හා පළාත් පාලන ආයතනවලට යැවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නට යෙදුණි.

එම වැඩ කොටසේ කළයුතු වගකීම් භාරයන් පැවරුණේ ද රෝලන්ඩ් සිල්වා මහතා මගින් සෙනෙවිරත්න මහතාටය. විශේෂයෙන් එවකට රජයේ කර්මාන්ත ආයතන මගින් පාර්ලිමේන්තුව, උසාවිය හා ජනාධිපති හා අග්‍රාමාත්‍ය යන කාර්යාල ප්‍රධාන කාර්යාල සඳහා අවශ්‍ය ලාංඡනයේ පිටපත් ලීයෙන් වර්ණ ගන්වාලිය හැකි පරිදි සකස් කෙරුණි. මේවාට නිවැරදිව වර්ණ ගැල්වීම හා ඇඳීම භාරවූයේද සෙනෙවිරත්න මහතාටය. ඒ අනුව ඔහු අදාළ සියලු පිටපත් සඳහා

මගේ අංකය: සං.අ/3/101

පුරාවිද්‍යා කොමසාරිස් තුමා,

<u>තිල ලාංඡන සකස් කිරීම</u>

ඔබ දෙපාර්තමේන්තුවේ එස්. එම්. සෙනෙවිරත්න මහතා විසින් සැලසුම් කරනලද, රාජ්‍ය තිල ලාංඡන සකස් කිරීමේ කමිටුව මගින් අනුමත කර ඇති පහත සඳහන් ලාංඡන එකකින් පිටපත් 8 බැගින් මුද්‍රණය කරවා ගැනීම සඳහා සෙනෙවිරත්න මහතාට අවශ්‍ය පහසුකම් සලසා දෙන මෙන් කරුණාවෙන් ඉල්ලමි.

1. ශ්‍රමසේවක තිල ලාංඡනය. ✓
2. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ලාංඡනය. ✓
3. ඓතිහාසික අත්පිටපත් කොමිෂමේ ලාංඡනය. ✓
4. මාපන ලාංඡනය. ✓
5. බොත්තම් සඳහා සකස් කරනලද ලාංඡනය. ✓
6. තරාදි පඩි සඳහා සකස් කරනලද ලාංඡනය. ✓

මේ සඳහා ලැබෙන සහාය ඉතා අගයකොට සලකමි.

මෙයට,
විශ්වාසී,

ලේකම්,
තිල ලාංඡන සකස් කිරීමේ
කමිටුව.

පිටපත:- එස්. එම්. සෙනෙවිරත්න මහතාගේ අවධානයට.

" කරුණාකර 23 වන සඳුදා කාර්යාල වේලාව තුළ මේවා සකස්කර ලැබෙන්නට සලස්වන්න.

7. [illegible]
8. [illegible]

☐ තිල ලාංඡන සකස් කිරීම් කමිටුවේ ලේකම් නිමල් කේ. පතිරණ මහත්මා විසින් ජනරජ ලාංඡනයෙන් පසු සෙනෙවිරත්න මහතා නිර්මාණය කළ සෙසු ලාංඡන පිළිබඳව පුරාවිද්‍යා කොමසාරිස්තුමා වෙත එවන ලද ලිපිය.

1973 ජනවාරි මස 23 දින.

එම්. ආර්. ප්‍රේමරත්න මහත්මා,

මහගම සේකර මහත්මා,

අමරවංශ දේවප්‍රිය මහත්මා,

නිල ලාංඡන සකස් කිරීමේ කමිටුව


ඊළඟ සැසියේ කමිටුවේ රැස්වීම 73.1.26 (සිකුරාදා) දින පස්වරු 2.30 ට සංස්කෘතික අමාත්‍යාංශයේදී පැවැත්වේ.

මෙදින වැදගත් තීරණ කිහිපයක් ගැනීමට ඇති බැවින් නොවරදවා ම සහභාගි වන්න.


නිමල් ජේ. පතිරණ
නිල ලාංඡන සකස් කිරීමේ
කමිටුවේ ලේකම්.

❒ ජනරජ ලාංඡනය නිර්මාණය කළ පසු එයට අනුකූලව සෙසු දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ ලාංඡන සකස් කිරීමට පත්කළ නිල ලාංඡන අනුකමිටුවේ කැඳවීම් ලිපියක්.

තිසි වර්ණ යෙදීම දිවා රෑ නොබලා තම නිවසේ සිට විශාල පිරිසකගේද ආධාර උපකාර ඇතිව සියතින්ම සිදුකරන ලදී. එසේ නිර්මාණිත "ලී මුවා" වර්ණ ලාංඡනයක් රජයේ කර්මාන්ත ශාලාවේ ප්‍රධානියා විසින් සෙනෙවිරත්න කලාකරුවටද පිරිනමන ලදුවෙන් පුරා වසර 38 ක් පුරා එය තවමත් එතුමා සන්තකව සුරක්ෂිතව තබාගෙන සිටී. එම ලාංඡනයේ විශාල පරිමාණයෙන් දෙකක් නිර්මාණය කළ අතර එහි උස අඩි 7 කට ආසන්න බව එතුමා පවසයි. ඉන් එකක් දැනට පරණ පාර්ලිමේන්තුවේ පඩි පෙළට ඉහළ දක්නට (දැන් ජනාධිපති කාර්යාලය) ලබෙන අතර, අනෙක පසුව 1976 දී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ එල්වන ලදුව එයද එම ස්ථානයේ ඉතා අභිමානවත් ලෙස දක්නට ලැබේ. මේ අනුව




❒ පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ලාංඡනය සහ කෞතුකාගාර ලාංඡනය.



❒ දැනට භාවිත වන මන්නාරම් දිසා කොඩිය. මන්නාරම නව දිස්ත්‍රික්කයක්
බවට ප්‍රකාශයට පත්කළ සැණින් එවකට දිසාපතිතුමාගේ ඉල්ලීම පරිදි
සෙනෙවිරත්නයන් විසින් නිර්මාණය කරන ලද්දකි. මෙහි ඇති ගස (බෙයාර්
බොබ්) මන්නාරමේ සහ අප්‍රිකානු කොංගෝ වනාන්තරයේ පමණක් දක්නට
තිබෙන්නකි. නැව වටකොට තිබෙන්නේ මුතු වැලකිනි. මුතු බෙල්ලන්
දෙදෙනකුද කොඩියේ දක්වා තිබේ. මුතු අස්වැන්න ඉතා සරුසාර ප්‍රදේශයකි
මන්නාරම.





❒ උපකුලපති මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න මහතාගේ ඉල්ලීමකට අනුව සෙනෙවිරත්න මහතා විසින් අඳින ලද කොළඹ විශ්වවිද්‍යාල ලාංඡනය.

මේ සියල්ලෙහි සෙනෙවි-රත්න මහතාගේ දහඩිය සමඟ ගිය ආත්මීය කුසල-තාව මුසුව පවතින බව පෙන්වාදීම අතිශයෝක්ති-යක් නොවේ.

මෙම ලාංඡන නිර්මාණයෙන් පසුව ඉතා අභිමානවත්ව මැයි 22 දින ජනරජ උත්සවය පවත්වා එතැන් සිට නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන ලදී. රටේ ජනාධිපතිවරයාගේ සිට සියලුම රාජ්‍ය නිලධාරීන් නව ව්‍යවස්ථාව යටතේ දිවුරුම් දී සිය රාජකාරි ආරම්භ කරන ලදී. එතැන් සිට ශ්‍රී ලංකාවේ සියලු කාසි, නෝට්ටු, මුද්දර, වීසා, ගුවන් බලපත්‍ර, හඳුනාගැනීමේ කාඩ්පත්, පොලීසි, උසාවි ඇතුළු සියලු වලංගු සීල්, නිල ඇඳුම්, ත්‍රිවිධ හමුදා නිල ඇඳුම් ආදී මෙකී නොකී සියල්ලෙහි




❒ තම වෘත්තිකයන්ගේ සංගමයට අඳින ලද ලාංඡනය.



❒ සම්පත් බැංකුවට අඳින ලද ලාංඡනය.




❒ කොළඹ තරුණ බෞද්ධ සමිති ලාංඡනය.

නව ලාංඡනය ඇතුළත් කිරීම දක්නට ලැබුණි. මේ සමඟම වාගේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශයට තවත් රාජකාරියක් පවරන ලදී. එනම් අප ජාතික කොඩියේ සිංහයා වටකොට තිබූ සලකුණ (පුටු කකුල් 04 ක් වැනි) ඉවත් කොට ඒ වෙනුවට බෞද්ධ සලකුණක් වන 'බෝපත්‍ර' 4 ක් අන්තර්ගත කිරීමයි. මෙයත් ලාංඡන කමිටුවේම නිර්දේශයක් විය. මෙම කාර්යයට දෙපාර්තමේන්තු ප්‍රධානීන් තෝරා ගත්තේද ඇස්. ඇම්. සෙනෙවි-රත්නයන්ය. මේ අනුව යෝජිත බෝපත්‍ර 4 නිසිපරිදි අන්තර්ගත කොට ජාතික කොඩියේ වෙනස්කම් කිරීමේ ගෞරවයත් ඔහුට හිමිවේ. එතැන් සිට අද දක්වා භාවිත වන මෙම ශ්‍රී ලංකා රාජ්‍යයේ ප්‍රධාන සංඛේත ද්විත්වය තුළ පවා සිය නිර්මාණ කුසලතාව දායාද කිරීමට ඒ පුංචි මිනිසා භාග්‍යසම්පන්න වී සිටී.



❒ ශ්‍රී ලංකා ජාතික කොඩියෙහි මුලදී තිබූ රැජිනගේ සිංහාසනයේ කකුල් හතර අයින් කොට ඒ සඳහා බෝපත්‍ර හතරක් ඇඳින ලද්දේ සෙනෙවිරත්න මහතා විසිනි.

ජනරජ උත්සවයෙන් පසු අග්‍රමාත්‍යතුමියගේ උපදෙස් පරිදි සංස්කෘතික ඇමැතිතුමා විසින් රාජ්‍ය නිල ලාංඡන අතුරු කමිටුවක් පත්කරන ලදී. මෙම කමිටුව පත්කරනු ලැබුයේ ජනරජ ලාංඡනයට අනුකූලව සෙසු දෙපාර්තමේන්තු, සංස්ථා හා වෙනත් රාජ්‍ය ආයතනවල ලාංඡනවලට සංශෝධන ඇත්නම් ඒවා සඳහා නිර්දේශ නිකුත් කිරීමට හා සංශෝධන රහිතව ඇතැම් ලාංඡන සුදුසු නම් නැවත පිළිගැනීම සඳහා වන නිර්දේශ නිකුත් කිරීම සඳහාය.

එම කමිටුව මෙසේය:

1. රජයේ වැඩ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ එච්. ආර්. ප්‍රේමරත්න මහතා (සභාපති)
2. නිමල් කේ. පතිරණ - සංස්කෘතික ලේකම්තුමාගේ පෞද්ගලික ලේකම්. (කමිටු ලේකම්)
3. මහගමසේකර කලාකරුවාණන්
4. ලේඛනාගාර අධ්‍යක්ෂ අමරවංශ දේවරාජ මහතා
5. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ උපදේශක මාපලගම විපුලසාර හිමි


මේ අනුව ක්‍රියාත්මක වූ කමිටුව සමහර ආයතනවලින් ඉදිරිපත් වූ ලාංඡන සංශෝධන රහිතව ඒ හැටියට පිළිගත් අතර සමහර ලාංඡන වෙනස් කිරීමට තීරණය කරන ලදී. මේ සියලු සංශෝධනයන් සිදුකිරීමට පවරනු ලැබුවේ සෙනෙවිරත්නයන් විසින්ය. මේ සම්බන්ධයෙන් 1972 ජූලි මස 11 වෙනිදින සංස්කෘතික අමාත්‍යංශ ලේකම්වරයාගෙන් සෙනෙවිරත්න මහතාට ලිපියක් ලැබුණි.

These books have been collected / purchased and donated by the Association of Sri Lanka Lawyers in The UK to the KURUNEGALA Public Library. UDALAGAMA - JAYAPHIRANA - WIJESUNDERA COLLECTION.

You should not be in possession of this book outside the premises of the library. It would amount to an act of theft if you remove this book from the library. There are no exceptions.

## ❐ ජනරජ ලාංඡනයේ අන්තර්ගත සංකේතවලින් ඉදිරිපත් වූ අදහස් හා ඇතිවූ ගැටලු

1. ඉහළ ධර්ම චක්‍රයඃ ශ්‍රී ලංකාව වනාහී රාජ්‍ය විසින් බුදුදහම ආරක්ෂා කළ යුතු රාජ්‍යයක් බව ව්‍යවස්ථාවෙහි, ii පරිච්ඡේදය වගන්තියේ සඳහන්ය. බුදුන් වහන්සේ වදාළ ධර්මය වනාහී ආගමක් නොවන බව ධර්මාශෝක රජතුමන්ද වටහා ගත් නිසාවෙන් එතුමාණන්ගේ සිංහ සංකේතයට එය යොදා ගැනුණි. අද ඉන්දියානු රාජ්‍ය ලාංඡනයෙහිද මෙම ධර්ම චක්‍රය අන්තර්ගතය. එසේම ජනරජ ලාංඡනය බිහි කරද්දී රාජ්‍ය නායිකාවද එය එසේම වටහාගෙන ඇති බව හැඟුණි. ඇයගේ



විශේෂ ඉල්ලීමට මෙම සංකේතය යෙදීමට උපදේශක කමිටුව හරහා නිර්මාණකරුවාට උපදෙස් ලැබිණි.

බුදුන් වහන්සේ විසින් සිය අති ඉන්ද්‍රිය ඥානයෙන් ලෝකයේ පැවැත්ම ක්‍රියාත්මක වන ආකාරය විනාශය, ජීවියාගේ පැවැත්ම හා

එහි නියමයන් වටහාගෙන එය නැති කිරීමේ ක්‍රමය චතුරාර්ය සත්‍යය මගින් අප වෙත දේශනා කිරීම බුද්ධ ධර්මය ලෙස හැඳින්වීම වඩාත් උචිතය. මෙහි ඇති විශේෂත්වය නම් සංසාර චක්‍රයක ජීවී, අජීවී ලෝකය ඇතිවීම නැතිවීම යන මූලධර්මය මත ගමන් කරන බව පෙන්වා දීමයි. උන්වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනයට පදනම් වූයේද 'ධම්මචක්ක' පවත්වන සූත්‍රයයි. ඇතිවීම-නැතිවීමට පදනම් වන තෘෂ්ණාව තුරන් කිරීමෙන් පමණක් ලබාගන්නා නිර්වාණය දකින තුරු එම චක්‍රයෙන් පිට යා නොහැකි බව අප වෙත මනාකොට තේරුම් කළේ උන්වහන්සේය. මේ සඳහා ආර්ය අෂ්ඨාංගික මාර්ගයත් අප වෙත ලබාදුණි. එය ධර්ම චක්‍රයේ ඇති රේඛා 8 න් නිරූපණය වේ. මේ අනුව සමස්ත බුද්ධ දේශනාවම කැටි කිරීමේ හැකියාවක් ධර්ම චක්‍රයට ඇත. මෙය බෞද්ධයාගේ සංකේතයයි. බෞද්ධකම යනු උපතින් ලද්දක් නොව බුද්ධිමත්ව ලෝකයේ නියාම ධර්මයන් නිසි ලෙස පසක් කරගත් අයගේ ආර්ය චර්යාව බව හැඳින්වීම වඩාත් උචිතය. ශ්‍රී ලංකාව වනාහි එම ආර්ය චර්යාව මනාකොට දකින ගිහි-පැවිදි උතුමන් විසින් ආරක්ෂා කරන රටක් බව පෙන්වීමට මෙම සංකේතය යොදාගෙන ඇති බව කීම වඩාත් උචිතය.

2. මැද - **කඩුවක් අතින් ගත් සිංහයා:** සිංහ ලාංඡනය වනාහී ඈත අතීතයේ පටන් වීරත්වය දැක්වීමට යොදාගත් සලකුණකි. විශේෂයෙන් ඊජිප්තුව, සිරියාව, රෝමය, මොහෙන්දජාරෝ, හරප්ප ශිෂ්ටාචාරවලත් විවිධ වීරත්වය දක්වන සංකේතයන්ට මෙය භාවිත කර තිබේ. අපගේ ආර්යයන්ගේ උපත සිංහයාගෙන් පැවතෙන්නේ යැයි සිංහබාහු-සිංහසීවලී කතාවෙන්ද පෙන්වා දේ. මේ අනුව සිංහයාගේ ප්‍රධානත්වය, මූලිකත්වය මනුෂ්‍යයා ඈත අතීතයේ සිට වැදගත් ලෙස භාවිත කොට ඇත. විශේෂයෙන් රජුන්ගේ ආසනය පවා සිංහාසනය වූ අතර එහිද අත් පා සිංහයාගේ අඟපසඟවලින් නිර්මාණය කර තිබූ බවද පෙනෙන්නට ඇත. විශේෂයෙන් ලංකාවේ දුටුගැමුණු රජතුමා සිංහල ලාංඡනය සිය රාජ්‍ය සංකේතය ලෙස නිල ලෙස භාවිතයට ගෙන ඇති බව පැහැදිලිය. කෙසේ හෝ ඊට ප්‍රථම බෞද්ධ කලා ශිල්පවල මූලිකත්වයක් සිංහයාට හිමිවූ බව පෙනේ. සිංහ පාවලට යොදාගත් අතර මකර තොරණේ මකරයාටද තිබුණේ සිංහ පාදයන්ය. කෙසේ හෝ 'සීගිරිය'

සිහගිරිය සිංහ කට නිර්මාණයේ මූලික කේන්ද්‍රීය ලක්ෂණයක් ලෙස කිව හැක. අපගේ සිංහයාගේ සංඛේතය මගින් ශ්‍රී ලාංකික බව මනාව පෙන්නුම් කරනු පෙනේ. ජාතික කොඩිය හා ජනරජ ලාංඡනය යන ද්විත්වයම එකක් ලෙස එකිනෙකට සම්බන්ධ සේ සැලකෙන්නේ මෙම සංඛේත-යෙන් බවද පෙන්වා දිය යුතුය. මේ අනුව ''ශ්‍රී ලකා රාජ්‍යය'' සිංහයාගෙන් නිරූපණය වන බව කීම වඩා උචිතය. කෙසේ වුවද සිංහලයා සිංහයාගෙන් නිරූපණය වන බවද පසක් වේ.

## ඉර-හඳ

සමස්ත ලෝකයේම පැවැත්ම සංඛේත වන්නේ ඉර හඳ ද්විත්වයෙනි. මුල්කාලීනව සිට ලෝකය මෙම සංඛේත සැලකුවේ දෙවියන් ලෙසටයි හෝ නිර්මාණයේ සංඛේත ලෙසටයි. ඊජිප්තුවේ සූර්යයා මූලික දෙවියන් ලෙස සැලකූ අතර බොහෝ ආගම්වල චන්ද්‍රයා සිය සංඛේතය ලෙස යොදා ගැනේ. ඉන්දියාවේ සූර්ය දේව වන්දනාව බොහෝ සෙයින් පැවැත්ම උදෙසා කෘතගුණ සැලකීමක් ලෙස සැලකේ. ශ්‍රී ලංකාවේ අප පොහෝ දිනය සනිටුහන් කරනු ලබන්නේ පූර්ණ චන්ද්‍රයාගෙනි. සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සිදුවන සංක්‍රාන්තිය රාශි දොළහ ආශ්‍රයෙන් ද්‍රවිඩ-සිංහල අප සියල්ලෝම අවුරුදු දිනය ලෙස සලකා සමරති. ලෝකයේ ඉපැරණිම ශාස්ත්‍රයක් වන ජ්‍යොතිෂයේද ''සූර්යයා'' රවිගෙන් සංඛේතවෙත් කෙරේ. මේ සියල්ල මගින් ලෝකයේ පැවැත්ම සංඛේතවත් කරන මෙම වස්තූන් ද්විත්වය තුළ සමස්ත ස්වභාව ධර්මතාව කේන්ද්‍රගත වී ඇති බව නූතන විද්‍යාවෙන්ද අප මනාකොට ඉගෙන ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ ඉපැරණි රජවරු තම කොඩි, සේසත්, විහාර හා රාජ්‍ය ගොඩනැගිලි ආදිය සඳහාද මෙම සංඛේතය භාවිත කොට තිබේ. මේ මෙයින් අපට ''චන්ද්‍ර-සූර්ය'' මාසය පැමිණ ඇත.

ඉර-හඳ කොඩි සඳහා බොහෝ සෙයින් යොදු ගැනුණි. මෙහි සැබෑ අර්ථය ඉර-හඳ පවතින තුරු එම නියෝජනය ස්ථාවරව පවතින බවයි. ශ්‍රී ලංකා රාජ්‍යයද එසේය. විවිධ ආක්‍රමණ එල්ල වුවද රාවණා රජුට පෙර සිට අද මේ දක්වාද අඛණ්ඩව ශ්‍රී ලංකා

රාජ්‍යය පවතී. එබැවින් අප ලාංඡනය අරභයා මෙම සංකේතය ඉර-හඳ පවතින තාක් කල් දිවයින පවතින බවට වන මෙම ප්‍රකාශනය තීව්‍ර කිරීමට යොදා ඇත.

## සිංහයා වටකොට ගත් - පලාපෙති

නෙළුම් මල වනාහි සිද්ධාර්ථයන්ගේ උපතත් සමඟම බෞද්ධ අපේ පූජනීයම පුෂ්පයයි. මෙනිසාම අද ලොව පාරිශුද්ධත්වයේ සංකේතය ලෙසටද මෙය භාවිත වනු පෙනේ. මෙනිසාම බුද්ධ රූපය නෙලන, අඹන සෑමවිටම නෙළුම් මල එය නිරූපණයට කලාකරුවා නැඹුරු වී තිබේ. බුදු පිළිමය නිර්මාණයට ප්‍රථම බුදුන් වහන්සේ වෙනුවට යොදන ලද සංකේතයන් වූ 'චක්‍රය' පාද ලාංඡනය, ධර්ම චක්‍රය, බෝගස සහ පියුමද විය. ශ්‍රී ලංකාවේ අතිශය ඉපැරණි සියලු මෝස්තරයන්ට නෙළුම් මල් පෙත්ත යොදා ගැනුණි. පලා පෙති මෝස්තරය බිහිවූයේ එලෙසිනි. එසේම පලා පෙති හැඩය සියලුම විහාරාරාමවල ගල් කුළුණුවල අවසන් හැඩය ලෙසට භාවිතයට ගෙන තිබෙන බව කිව හැක. එසේම සඳකඩ-පහන, මුරගල සහ විවිධ මෝස්තර රටා හැඩ ගැසුණේ පලාපෙති අනුසාරයෙනි. මේ අතර, විහාරාරාම දොර උළුවහු විශේෂය. පැරණි අත්තනගලු විහාරයේ එකිනෙකට වෙනස් නෙළුම් මල් ප්‍රමාණයක් මගින් නිර්මිත උඩුවියනකි. මේ අනුව නෙළුම් මලෙහි පෙත්ත මගින් කලාකරුවා දක්වන ලද මනස්කාන්ත රූප විඥානය විශ්මයජනකය. දේශයේ පිරිසිදු පැවැත්ම ඉන් ඉඟි කෙරේ. සියල්ලෙහි අවසන් ප්‍රකාශය පාරිශුද්ධ බවයි.

## පලාපෙති සහ සිංහයා වටකොට ගත් වී කරල්

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටකි. ප්‍රධානම ආහාරය හා භෝගය වන්නේ 'වී' ය. ගොයම, කුඹුර, වී කරල, බැත, සහල යන අංග කෙරෙහි ශ්‍රී ලාංකික ජන ජීවිතය කොතරම් බැඳුණේද යත් සෑමවිටම 'බත්පතට' වැඳ නමස්කාර කොට අනුභව කිරීමේ පුරුද්දක් අපේ

හෙළ ගැමියාගේ තිබුණි. තවමත් පැරැන්නන් තුළ එම චාරිත්‍රය දක්නට ලැබේ. කෙසේ හෝ බත් ඇට පැගීම පවා පව් සිදුවන බව සැම මවකම තවමත් තම දරුවන්ට කියාදෙන පාඩමකි. ''අලුත් සහල් මංගල්‍යය'', මෙය එදා සිට පැවත එන ඉතා උතුම් සිරිතකි. මෙහිදී ගොවියා තමා ලබාගත් මුල්ම අස්වැන්නෙන් අග්‍ර කොටස ලොව්තුරා බුදුහිමියන් උදෙසා වෙන්කොට එය දළදා සමිඳු ප්‍රමුඛ පූජනීය ස්ථානවලට ගෙන ගොස් පුද පූජා කිරීමේ උත්සවය තවමත් අප දේශයේ පවතින්නකි. මෙය පසුව දෙවියන් උදෙසාද පිරිනැමේ. මෙහිදී ශ්‍රී ලාංකික හින්දු ජනතාවද මේ ආකාරයටම එම චාරිත්‍රය සිදුකිරීම දක්නට ලැබේ. එසේම තම නිවසට එන අමුත්තාට සිදුකරන ඉහළම සංග්‍රහය බත්පතක් උයා කන්න දීමය. මෙම ඇගයුම් තවමත් නාගරික වශයෙන් පවා හෙළයා සතුව තිබීම අපේ පුණ්‍යවන්ත භාවයකි. කුමන සුබ කටයුත්තක් සිදුකළද බත සහ කිරි මිශ්‍ර කොට තනාගන්නා කිරිබත අපට ඇති අතිවිශිෂ්ටම ආහාරයයි. මේ සැමට මූලික වන්නේ වී ඇටයයි, වී කරලයි.

සිංහල බෞද්ධ ජනතාව වැඩි දෙනා වාසය කිරීම පමණක් නොව කිසිදු ජාති භේදයකින් තොරව ගොවි ජනතාව වශයෙන් තම මූලිකම කෘෂිභෝගය ලෙස වී කුඹුරු කරමින් ජීවත් වන ලාංකික ජනතාවට බුදුන් වහන්සේ ජාතිභේද, ආගම් භේදයකින් තොරව එකසේ වැදගත්ය. සිද්ධාර්ථයන්ගේ ඥාති පරපුරේ මූලික වගකීම වූයේද ගොවිතැන ආරක්ෂා කිරීමයි. මේ බව වප්මඟුල් උත්සවයෙන් අපහට කියා දුණි. මේ අනුව ආර්ය ජනතාවට ගොවිතැන ජීවිතය හා සමාන වන අතර බෞද්ධයාට මෙය සුවිශේෂ වැදගත්කමක්ද උසුලයි. කෙසේ හෝ ගංගා ජලය ඍජුව පරිහණය කළ ශිෂ්ටාචාර බොහෝ වැනසෙද්දී ගංගා ජලය හා වැසි ජලය වැව්වල තැම්පත් කොට ඉර හා ගැටෙන්නට සැලැස්වූ මහා කෘෂිකාර්මික වැව් පද්ධතියක් තිමවා මුළු ලොවම මවිත කළ ශ්‍රේෂ්ට ලාංකික මුතුන් මිත්තන් මේ සියල්ල කිරීමට පෙළඹවූ කාරනය වූයේද ''වී ගොවිතැන'' බව අමුතුවෙන් කිවයුතු නොවේ. මේ හෙයින් අපගේ ජනරජ ලාංජනයේ වී කරල් අන්තර්ගත කිරීම කොතරම් වටිනා දෙයක්ද යන්නත් ඉන් කියැවෙන යථාර්ථය හා එහා සුවිශේෂ නියෝජනය තුළ තොකරම් අපේ අනන්‍යතාව ගැබ් වන්නේද යන්නත් පැහැදිලිය. ස්වයංපෝෂිත ලාංකික සමාජය මින් ප්‍රකාශ කෙරේ.

## ඉරහඳට මැදිවූ සිංහයා සහ පලාපෙති යටින් පිහිටුවන ලද වී කරලේ ආරම්භය - පුන්කලස.

පුන්කලස නොහොත් පූර්ණ ඝටයද අප ලාංකික සමාජයේ කැපී පෙනන වස්තුවකි. බුදුරජාණන් වහන්සේට ඇති ගෞරවය හේතුවෙන් මුල් කාලයේ උන්වහන්සේගේ පිළිම වෙනුවට නොයෙක් සංකේත පමණක් භාවිත වූ බව අප මුල් පරිච්ඡයේදී සඳහන් කරන්නට යෙදුණි. මෙම සංකේතවලින් එකක් "පූර්ණ ඝටය සහ නෙළුම් මල්". මෙම පූජනීයත්වයේ සංකේතයම ඉතා මනාව දොරටුපාල රූපවල අත්වලට ස්ථාපනය කොට ඇත්තේ අතිශයින් සිත්ගන්නා ආකාරයට බව පැහැදිලිය. පිරිත් මණ්ඩපයේ පැන් කළය හා මණ්ඩපය සිව්කොණේ තබා තිබෙන ඝටය හා පොල් මල්ද දේශීය ප්‍රබල කලා සම්ප්‍රදායයත් සමඟ උතුම් පූජනීය භාවයක් හා සශ්‍රීක බවක් අපට කියා දේ. මේ නිසාම සුබ නැකතට කිරි ඉතිරිවීම සඳහාද මෙම පුන්කලසේ හැඩය ඇති කලයක් යොදා ගැනෙන අතර දිය පිරි කලය සුබ ලකුණක් ලෙසටද පිළිගැනීමක් ජන සමාජය තුළ ඇත. එසේම කලය කේන්ද්‍ර කොට උපමා, උපමේය විශාල ප්‍රමාණයක්ද නිර්මාණය වී තිබෙන්නේද කලයේ ඇති එම සුවිශේෂත්වය නිසාය. ඉපැරණි කලා නිර්මාණ දෙස බැලීමේදී කුට්ටම් පොකුණේ පිහිටා තිබෙන පූර්ණ ඝටයේ ආභාෂය සෙනෙවිරත්න මහතා විසින් ජනරජ ලාංඡනයේ පූර්ණ ඝටය සඳහාද ලබාගෙන තිබේ. මෙම පුන්කලසේ ඇති විශේෂත්වයද එහි උඩ නෙළුම් මලක් පූර්ණ ලෙස පිපී තිබීම සහ නෙළුම් පොහොට්ටු කලය වටේට මනස්කාන්ත ලෙස ශිල්පියා විසින් අඹා තිබීමයි. සෙනෙවිරත්න මහතා විසින් එම ස්ථානයට දමූ පුන්කලසේ සිට වී කරල් ගමන් කරවීම සඳහා යම් ඉඩ ප්‍රමාණයක් ලබාදී තිබුණු අතර ඒ සඳහා කට ප්‍රමාණය පුළුල් වන ලෙස පුන්කලස නිර්මාණය කෙරුණි. නමුත් ඉහළ ඇති පලාපෙති පිහිටා ඇති වෘත්තය හා පුන්කලසේ කට අතර ඉඩක් ඉතිරි විය. මේ සඳහා සෙනෙවිරත්න මහතා යොදා ගත්තේද විකසිත වන නෙළුම් පොහොට්ටුවයි. මෙය තුන් පෙති මල ලෙසටද ඇතැම් ශිල්පින් ව්‍යවහාර කරන අතර ඇතැමුන් මෙය අන්නාසි මල ලෙසටද ප්‍රකාශ කරයි. කෙසේ හෝ මෙවැනි මල් ලියවැල් මෝස්තර සඳහාද යොදාගෙන තිබේ.

## පහළ ඉර හඳ හා පුන්කලස යටින් ඇති රේඛා ත්‍රිත්වය:

චෛත්‍යයක් දෙස බැලූවද පේසාවළලු මත එය ඉදිකොට ඇති බව පෙනේ. විශේෂයෙන්ම බෞද්ධ වෙහෙර විහාර පාදමේ මෙන්ම, කුළුණු හිස්වලටද මෙවැනිම බොරදම් මෝස්තර් භාවිත කොට තිබේ. මෙම රේඛාවන්වල අග ඇති නැම්ම මෙහිලා විශේෂිතය. නෙළුම් මලක පෙත්ත පහළට නැමූ විට පැත්තට පෙනෙන හැඩය මෙහිලා සැලකේ.

සිංහල මෝස්තර කලාවේ ඉතා සුවිශේෂ අවශ්‍යතාවක්ද මෙහිලා දිස්වේ. චෛත්‍යවල ත්‍රිවිධ රත්නය නියෝජනය වන අතර සෙසු ගොඩනැගිලි සඳහා 'මහී කාන්තාව' නියෝජනය වේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා මාතාවගේ භූමිය පිළිබඳ නියෝජිත ලක්ෂණයක් මෙන්ම එහි දෙපස හැඩය තුළ පූජනීයත්වයක් හා අපගේම අනන්‍යතාවක් ගැබ්වන ආකාරයට සෙනෙවිරත්න මහතා විසින් මෙය මෙසේ යොදාගෙන තිබේ.

## වර්ණ පිළිබඳව

රතු වර්ණය: සිංහල ජාතිය ප්‍රධාන ජාතිය ලෙස ජීවත් වන බවයි.

නිල් වර්ණය: අන්‍ය ජාතීන්ද ජීවත් වන බවයි.


කහ වර්ණය: සියලුම ජාතීන්, ආගම් සාමකාමීව සහජීවනයෙන් ජීවත් වන බවයි.

2. iii. සංකේත අරභයා ඇතිවූ ගැටලු

අ). **සිංහයාගේ ලිංගභේදය** - සාමාන්‍යයෙන් කලාකරුවා විසින් නිරූපණය කෙරෙන කේසර ඇති සිංහල රූපය වනාහී සිංහ දෙනුවන් නොවන බව සාමාන්‍ය දැනුමට හසුවන කාරණයකි. එසේම කලාකරුවා විසින් සිය නිර්මාණකරණයේදී අවධානය යොමු කරනු ලබන්නේ නොපෙනෙන භාවමය හැඟීම් හැකිතාක් පෙනෙන්නට සැලැස්වීම විනා පෙනෙන දේ මනාව පෙන්වීම නොවන බව කලාව ගැන සුළුවෙන් හෝ දන්නා

අය දනිති. නමුත් එකල පුවත්පත්වලට ලිපි සැපයූ එක් පිරිසක් කියා සිටියේ මෙහි නිරූපිත සිංහයා නපුංසක බවයි. නමුත් මෙහිදී සෙනෙවිරත්න කලාකරුවාණන්ගේ ප්‍රකාශය වැදගත් වේ. එනම් සිංහයාගේ පුරුෂ ලිංගේන්ද්‍රිය මනාව තමා සටහන් කර ඇති බවකි. එය මෙතරම් කුඩා ප්‍රමාණයේදී නොපෙනී යාම ගැනවත් තාක්ෂණ දැනුමක් විවේචකයින් සතුව නොතිබුණි. මේ අනුව එතුමා ආරාධනා කළේ අදාළ ලාංඡන ආකෘතියත්, විශාලනය කොට බලන ලෙසටයි. පසුව එම විවේචනය නිම විය.

ආ) ඉර/හඳ - පිහිට වූ තැන හා පැත්ත පිළිබඳ ගැටලුව නිර්මාණය වූ ලාංඡනයේ දකුණු පැත්තේ 'හඳ' සහ වම් පැත්තේ 'ඉර' ලකුණ යොදා තිබුණි. මෙහිදී මෙය කියවුණේ සඳ ඉර වශයෙනි. මෙය වැරදි බවත් ඉර දකුණු පැත්තට සහ සඳ වම් පැත්තට යා යුතු බවටත් විවේචන එල්ල විය. මෙහිදී දේශපාලන විවේචනයක් ලෙස ඇතැමුන් කියා සිටියේ කාන්තාව සඳ නියෝජනය


Monday "DAVASA"-June 5, 1972

1972 ජූනි මස 5 වෙනි

දවස

කෝළඹ 12,
තැ. පෙ. 1257
28689 - 23884
23864 - 23882

# ජනරජ සලකුණ

සමස්ත ජාතියේම බලාපොරොත්තු සපුරාලන අයුරින් නිම විය යුතු මේ රාජ්‍ය ලාංඡනය එක් එක් පුද්ගලයන්ගේ අපේක්ෂාවන්ට සපිලන අන්දමින් සකස් වීමට වගකිව යුතු පුද්ගලයන්ගෙන් ඉඩකඩ ලැබීම බලවත් වරදකැයි ද, දැන් දැන් පුවත් මගින් හා සෙසු ආරංචි මාර්ග වලින් ද ලැබෙන තොරතුරු අනුව රාජ්‍ය ලාංඡනයේ කිසියම් පුද්ගලයකු හෝ පුද්ගලයන් කීප දෙනකුගේ පෞද්ගලික සිතුම් පැතුම් ගැබ්ව ඇතැයි සැක කිරීමට සිදුවී ඇතැයි ද, ඉකුත් "ඒවිරිස" මගින් "ජනරජ ලකුණ" පිළිබඳ විවේචනයක යෙදුණු විද්‍යාලංකාර සරසවියේ කලා පීඨාධිපති මහාචාර්ය විමලානන්ද මහතා ප්‍රකාශ කර තිබුණි.

අප ජනරජ ලාංඡනයේ නිර්මාණාචාර්යයා කවරෙක් ද? ...

අගමැතිනියක් ඇති නිසා සඳට ප්‍රධාන කරන හෙයින් රටේ ස්ථානය ලබාදුන් බවකි. මෙම සියලු විවේචන නිර්මාණකරුවා ප්‍රතික්ෂේප කිරීමට යෙදුණි. මෙහිදී ඔහු පෙන්වා දෙනු ලැබුයේ ඈත අතීතයේ සිට පැමිණෙන සිංහල මාස ක්‍රමයයි. එනම් 'චන්ද්‍ර-සූර්ය' මාස ක්‍රමය හා ජ්‍යොතිෂයේ පවා කියැවුණේ සූර්ය-චන්ද්‍ර නොව චන්ද්‍ර-සූර්ය ලෙසටයි. මෙය සනාථ කිරීමට සෙනෙවිරත්නයන් විසින් ඉපැරණි විහාර සිතුවම් ආශ්‍රිත සිංහල 'කොඩි' ගෙනහැර දක්වන ලදී. මේ සියලු ධජයකම තිබුණේ 'චන්ද්‍ර-සූර්ය' ක්‍රමයටය. විශේෂයෙන් සෞම්‍ය දේ මුලට යෙදීම ලෝක චාරිත්‍රයක් ලෙසටද පෙන්වා දුන් ඔහු 'නෝනාවරුනේ-මහත්වරුනේ' කියා කෙරෙන ආමන්ත්‍රණ විධික්‍රමයද මෙයට සම්බන්ධ කොට පෙන්වා දුනි.

ඇ) පුන්කලස උඩ ඇති මල -

මෙම පෙති තුනේ මල පිළිබඳව කතුවරයා විසින් මේ පරිච්ඡේදයේ මුලදී පෙන්වා දුනි. (පිටු අංක 29) මේ අනුව අප සිංහල මෝස්තර කලාවට අයත් ප්‍රධානතම නෙළුම් පුෂ්පයේම එක් අවස්ථාවක් ලෙසට හෙළ කලාකරුවා විසින් නිර්මාණය කළ මෙම මල ලාංඡන සටහන් කුඩා වෙද්දී ඉංග්‍රීසි 'W' හැඩයට ඇතැමුන්ට පෙනෙන්නට වීම පිළිබඳව සෙනෙවිරත්න මහතා කරුණු පෙන්වා නොදුන් අතර ඔහු ප්‍රකාශ කර සිටියේ ලාංඡනය විශාලනය කොට එහි ඇති පුෂ්පය දැකබලා ගන්නා බව පමණි.

## ජනරජ ලාංඡනයේ සංක්ෂිප්ත අදහස

ඉර-හඳ පවතින තාක් කල් මේ මිහිකතේ පූර්ණත්වයෙන් හෙබි, සෞභාග්‍යයෙන් පිරි, ස්වයංපෝෂිත වූ සෞම්‍ය සංස්කෘතියෙන් යුක්ත, එඩිතර සිංහල ප්‍රෞඪ ජාතියක් අන්‍ය ආගමිකයන් හා අන්‍ය ජාතීන් සමඟ සහජීවනයෙන්, සහයෝගයෙන් හා සමානාත්මතාවෙන් සුසැදිව ශ්‍රී සද්ධර්මය රක්ෂා කරමින් මේ ලක් දෙරණේ ජීවත් වෙනවා යන වගයි.......


03

# ජනරජ ලාංඡනයේ නිර්මාතෘ ඇස්. ඇම්. සෙනෙවිරත්න නම් ඔහු

## ❒ රාජකාරී මට්ටමින් ඔහු කළ ජාතික සේවාවන්

**1942** සෙනෙවිරත්න මහතාට විශේෂිත විය. මුලින් ඒ. සී. බෙල් මහතාගේ බෙල් පාටිය නමින් හැඳින්වූ ඒ වනවිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නමින් හැඳින්වූ දෙපාර්තමේන්තු සේවයට පත්වීමක් ලැබීමයි. සම්මුඛ පරීක්ෂණයේදී තම චිත්‍ර සටහන් හා සහතික දෙස බැලූ මහාචාර්ය පරණවිතාන ශූරීන් ''ආ.... අපට මේ වගේ අය තමයි ඕන'' යනුවෙන් පැවසූ වදන් සෙනෙවිරත්න මහතාට හොඳින් මතකය. එසේ පවසන විටදීවත් තමා ඉදිරියේ සිටින එම අවුරුදු 20 ක තරුණයා තමාගේ හොඳම සේවකයකු හා හිතවතකු බවට පත්වේයැයි පරණවිතාන ශූරීන්වත් නොසිතන්නට ඇත.

1922 ජූලි මස 19 වෙනි දින කෑගල්ල කිවුල්පන නම්වූ ග්‍රාමයේ එවකට දූලිවල ගම්මුලාදෑනි තැම්පත් එස්. එම්. කිරිබණ්ඩා තිලමෙතුමාට හා ඩිංගිරි මැණිකේ කුමාරිහාමිට දාව මෙලොව එළිය දුටු ඇස්. ඇම්. සෙනෙවිරත්න පවුලේ වැඩිමලා වූ අතර බාල සහෝදරයකු හා සහෝදරියක් සිටි එම පවුලේ මව්තුමිය ඔහු ශිෂ්‍ය අවධියේදීම මියගියාය. සෙනෙවිරත්න සිය මූලික අධ්‍යාපනය ලැබුවේ දූලිවල සිංහල විද්‍යාලයෙනි. එය තම පියාණන් විසින්




❒ සෙනෙවිරත්න මහතා දිවි දෙවෙනි කොට සැලකූ මහාචාර්ය සෙනරත් පරණවිතාන ගුරුන් (ප්‍රථම ශ්‍රී ලාංකික පුරාවිද්‍යා කොමසාරිස් - 1869-1972)

පිහිටුවන ලද්දක් වන අතර පියාණන් ගෞරවාදරයෙන් ඇසුරු කළ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක ශ්‍රීමතාණන්ගේද උපදෙස් මේ සඳහා ලැබී තිබුණි. ඉන්පසුව සිය උසස් අධ්‍යාපනය සඳහා ඇතුළු වූයේ එවකට කිතුණු පල්ලියේ පාලනය යට-තේ පැවැති කෑගල්ල ශාන්ත මරියා පිරිමි විද්‍යාලයටය. කෑගල්ල, රඹුක්කන ප්‍රදේශයේ කුමන කලා කටයුත්තක් තිබු-ණද, කුමන තරගයක් තිබුණද කැපී පෙනුණු චරිතය වූයේ තරුණ සෙනෙවිරත්නයන්ය.

එවකට කෑගල්ල මන්ත්‍රීවරයාව සිටි එච්. එල්. රත්වත්ත මැතිතුමා සහ දුම්බර මන්ත්‍රීවරයාව සිටි ජේ. රත්නායක යන මැතිතුමන්ලා එක්වී සෙනෙවිරත්නගේ පියා සමඟ තිබූ රාජකාරි සම්බන්ධතා



❒ ඇස්. ඇම්. සෙනෙවිරත්න මහතා සහ මහාචාර්ය රෝලන්ඩ් සිල්වා මහතා.




❐ රජයේ හේවුඩ් ආයතනයේ ප්‍රධානී ලෙස ටී. යූ. ද සිල්වා ශූරීන් ක්‍රියාකරන කාලයේදී එතුමා විසින් ප්‍රකාශිත පැරණි සිංහල චිත්‍ර සැරසිලි මෝස්තර ග්‍රන්ථයට සෙනෙවිරත්න මහතා විසින් අඳින ලද චිත්‍ර සටහන් මෝස්තර.

මෙන්ම පෞද්ගලික හිතවත්කම්ද මත සෙනෙවිරත්නගේ කලා කුසලතා නංවාලීම සඳහා ඔහු කොළඹ ටෙක්නිකල් කොලීජියට ඇතුළත් කිරීමට පියවර ගති. එවකට ටෙක්නිකල් කොලීජියට අනුබද්ධව තිබූ පසුව රජයේ කලායතනය වූ (හේවුඩ්) දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ ලලිතකලා අංශය වූ මෙම ආයතනය තුළ චිත්‍ර කලාව, ඇඹීම හා සැලසුම් ශිල්පය යන සියලු පාඨමාලාවන් හොඳින් අධ්‍යයනය කිරීමට තරුණ සෙනෙවිරත්න සමත් විය. මේ වනවිට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබාගැනීමටත් ආසන්න තත්ත්වයක පරිසරයක් තිබුණි. කෙසේ නමුත් දෙස්-විදෙස් කලා සම්ප්‍රදායයන් මෙන්ම දෙස්-විදෙස් ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම පිළිබඳවද බොහෝ දැනුමක් තම ගුරුවරුන්ගෙන් ඉතා ගෞරවයෙන් ලබාගත් බව ඔහු කෘතවේදීව තවමත් සිහිපත් කර සිටී. කෙසේ හෝ මේ අතර දේශීය මෙන්ම විදේශීය කථිකාචාර්යවරුන්ද සිටි බව හෙතෙම පවසයි. මේ අය අතර සිටි ආචාර්යවරයකු වූ ටී. යූ. ඩී. සිල්වා මැතිතුමන් විසින් ප්‍රථම වරට ලංකාවේ මෝස්තර පිළිබඳව අධ්‍යයනය කොට සාරවත් ග්‍රන්ථයක් සම්පාදනය කළේ ය. ''සිංහල මෝස්තර'' නම් වූ එම ග්‍රන්ථයට චිත්‍ර සටහන් ඇඳීමට තෝරා ගත් කීපදෙනා අතර සෙනෙවිරත්න ශිෂ්‍යයා ප්‍රමුඛ විය.

මෙසේ සිය උසස් අධ්‍යාපනය නිමවා සිටි සෙනෙවිරත්න උත්සාහ කළේම පුරාවිද්‍යාවට ඇතුල් වීමටය. නමුත් බොහෝ වැඩිහිටියෝ කීවේ එය එතරම් නුවණට හුරු කටයුත්තක් නොවන බවයි. පුරාවස්තු හා නිදන් හැරීමට සම්බන්ධ වීම පවා ජීවිතයට අදෘශ්‍යමාන බලවේගවල (බහිරවයා) උදහසට භාජනය වන බවයි. එකල සමාජයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා එහි තත්ත්වය පිළිබඳ තිබූ ජනප්‍රිය මතය සිනාමුසු මුහුණින් සෙනෙවිරත්න හෙළි කළේ එසේයි. ''මගේ අධිෂ්ඨානය හරිගියා, මගේ සම්මුඛ පරීක්ෂණයේදී මේසයේ පුංචි මහත්තයෙක් ඉඳගෙන හිටියා. බලනකොට එතුමා තමයි 'සෙනරත් පරණවිතාන'. ඒ 1942. එදා මාව පුරාවිද්‍යාවට තෝරාගත්තෙ ආධුනික සැලසුම් ශිල්පි තනතුරටයි. වැටුප දිනකට රු. 2/- කයි.''

ප්‍රථමයෙන්ම පරණවිතාන ගුරුන් පවරන ලද රාජකාරිය වූයේ කුට්ටම් පොකුණ සංරක්ෂණය කිරීමයි. එවකට සැලසුම්



❒ සෙනෙවිරත්න මහතා පුරාවිද්‍යා නිලධාරීන් සමග සීගිරි නිරීක්ෂණ චාරිකාවක.

ශිල්පී කියා දෙපාර්තමේන්තුවට වී ඇඳ ඇඳ සිටිය නොහැකි විය. අදාළ වැඩ බිම්වලට ගොස් එහි කූඩාරම් ගසාගෙන කම්කරුවන්ද සමග අදාළ කාර්යයන් අධීක්ෂණය කරමින්, මනිමින් සැලසුම්




❒ අනුරාධපුර ගල්පාලම ප්‍රතිසංස්කරණය සඳහා අවගා දත්ත ලබාගැනීම.

පිළියෙළ කළ යුතු වූ අතර සමස්ත සංරක්ෂණ වගකීම් පවා දැරීමට සිදුවිය. මේ වනාහි අද දින 'Draftman' නොව අදාළ කටයුත්තේ සැලසුම් නිර්මාණවල සිට ප්‍රතිසංස්කරණ කටයුත්ත සැලසුම් කොට සිදුකිරීම දක්වා සමස්ත වගකීම භාරවූ බව එතුමා සිහිපත් කරයි. එතුමාගේම වචනයෙන්,

"මම එතනට යනකොට සම්පූර්ණයෙන් වල්බිහිවූ විශාල වෙළක් තිබුණෙ. දැන් වගේ නෙමෙයි ඝන කැලේ. පාරක්වත් නෑ හරියට. සත්තු සර්පයි, වල් අලි එමට. නමුත් අපි දෙයියො බුදුන් සිහිකරලා රට වෙනුවෙන් රාජකාරි පටන් ගත්තෙ. කිසිම දවසක එහෙම අතුරු ආන්තරා වෙලා නම් නෑ. කුට්ටම් පොකුණට අයිති ගල් ටික තිබුණෙ හරියට ගිනිපෙට්ටියක කූරු ටිකක් විසික් කළා වගේ හැමතැනම. ඉතින් මම අපේ කට්ටිය ලවා ටිකක් සුද්ද පවිත්‍ර කළා. ඊට පස්සෙ හැම ගලක්ම පාදලා, නොම්මර දාලා ඒවා මැන මැන වෙනම සටහන් ගත්තා. පස්සෙ මාස ගාණක් එහෙම කරලා ගල් ටික පරිස්සමෙන් ඉවත් කරලා පාදමේ ඉඳන් අදාළ සැලසුම් නිර්මාණයට අනුකූලව ගල් ටික අඩුක් කෙරෙව්වා. දැන් බලන්න ලස්සන. හැබැයි ගල් කීපයක් මදිව තිබුණෙ. සමහර ගල් ළඟ පාත ගම්වල ගෙවල්වලින් ගෙනිහිල්ලා. අපි ඒවා ගෙනාවා. නමුත් ගල් කීපයක් නම් අලුතින් හදලා තියන්න වුණා මට මතකයි. කොහොම හරි මාස කීපයකට පස්සෙ දැන් තිබෙන තත්ත්වයට කුට්ටම්පොකුණ සංරක්ෂණය කළා. මේ වැඩේ දිහා හොඳට පරණවිතාන මහත්තයා බලාගෙනයි හිටියෙ. ඒ සමඟම මගේ ආධුනික යන වචනය ඉවත් වෙලා එතැන් සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයකු ලෙස සැලසුම් ශිල්පී තනතුරට මට පත්වීම ලැබුණා."

මේ ආකාරයට මන්නාරම, ත්‍රිකුණාමලය, යාපනය, කිලිනොච්චිය, අම්පාර වැනි දුෂ්කර ප්‍රදේශවල සෙනෙවිරත්න මහතා රාජකාරි කළේ ඉතාමත් සතුටිනි. විශේෂයෙන්ම එකල එතුමාගේ ජීවිතයේ ප්‍රධානතම කටයුත්ත වූයේ ඒ දේව කාර්යයයි. බොහෝ විටක මාස ගණන් තම නෑදෑ හිතවතුන් දැකබලා ගැනීමට ඔහුට හැකිවූයේ නැත.

කෙසේ හෝ සෙනෙවිරත්න මෙකල සෞන්දර්ය ආයතනය වෙත යන දිනවල සිට දැන හැඳිනගත් දෙමටගොඩ ප්‍රදේශයේ




❒ රත්නපුර මහ සමන් දේවාලය සම්බන්ධ සෙනෙවිරත්න මහතා ඇඳින ලද සැලසුම.

එවකට ප්‍රසිද්ධ සමාජ සේවකයකු වූ ධර්මපාලතුමා සමග බෞද්ධ ධර්ම ප්‍රචාරක කටයුතුවලට පවා සම්බන්ධ වූ නිසා එතුමා විසින්ම ''ධර්ම'' යන නාමය ලද ධර්මසිරිවර්ධන මැතිඳුන්ගේ වැඩිමහල් දියණිය වූ ප්‍රේමා ධර්මසිරිවර්ධන මෙනෙවිය සමග අතිනත ගන්නටද යෙදුණි. ඒ වර්ෂ 1951 දීය.

මෙතැන් පටන් තම යුග ජීවිතය තුළ දූ-දරුවන් සමඟ පවා සෙනෙවිරත්න ගත කළේ සුළු කාලසීමාවක් පමණි. දරුවන් ලෙස අප සැම විටම අසා ඇති වචනය වූයේ ''තාත්තා සර්කිට් ගිහින්'' යන්න පමණි. පියාණන් බොහෝ කාලයකට දින කිහිපයක් හෝ නිවසේ රැඳී සිටියේ අසනීපයක් නම් පමණි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු සේවය හා කුඩාරම් ජීවිතය මැලේරියා උණ එතුමාට වැළඳීමට පවා හේතුවිය.

මෙ ආකාරයට විල්පත්තු කැණීම්වලදී විශේෂිත ආකාරයට තල දත් දෙකක් පිහිටි බුදු



UNESCO Office,
Ministry of Education &
Cultural Affairs,
Colombo 2.

I came to Ceylon from Rome at the request of the Ceylon Government and was engaged in the restoration work of the paintings at the historic Degaldoruwa Temple of Kandy. This project which was sponsored by the Archaeological Department of Ceylon was financed by the UNESCO. The restoration work that commenced on 2.2.1970 was completed on 7.4.1970.

I wish to place on record my highest appreciation of the services rendered by Mr. S.M.Seneviratna, the draughtsman of the Archaeological Department in carrying out my instructions in regard to this restoration work. I must also make special mention of Mr. Seneviratna's skill in cleaning the old paintings without erasing the very thin lines on them and touching of colour in places where the paintings had been obliterated. He also showed great talent in modelling up and touching colour to the broken fingers and other defaced areas in an "Uthpilmaya" of the temple.

His work of portrait painting and copying of Frescoes in true colour and other fine works of art are remarkable. The general and sectional plans of Degaldoruwa and sectional panels of restoration work drawn by him are also helpful to me to be submitted in my report to the UNESCO.

I also have had occassion to work with him in connection with the restoration work of the Sigiriya frescoes when the vandals destroyed it in 1968 and there too he displayed remarkable talent in work of this nature.

I hereby certify that Mr. Seneviratna has a deep understanding, skill and interest in restoration work of old paintings. He also has a fair knowledge of Chemicals used for this type of work. I wish him every success.

April, 1970.

(LUCIANO MARANZI)

❐ මරංසි මහතාගේ ලිපිය

පිළිමයක්ද හමුවිය. අනුරාධපුර, පොළොන්නරුව, සීගිරිය, මහනුවර, දැලිවල, කොටවෙහෙර, දැදිගම ආදී මෙකී නොකී බොහෝ කැණීම් හා සංරක්ෂණ කටයුතුවලට එතුමාණන්ගේ දායකත්වය ලැබුණි.

පුරාවිද්‍යා ජීවිතය තුළ ඔහු ඉතා ආදරයෙන් හා ගෞරවයෙන් තම සේවාව ලබාදුන් මූලික ස්ථානයක් ලෙස සීගිරිය සිහිපත් කරයි. ඔහුගේම වචනවලින් කතාවේ ඉතිරිය රසවත්ව අසමු:



❒ මරංසි මහතාගේ උපදේශකත්වයෙන් සෙනෙවිරත්න මහතා විසින් සංරක්ෂණය කළ සීගිරි චිත්‍රයක්.

''60 දශකයේ අග භාගයේදී සීගිරියේ සේවය කළ මුරකරු සම්බන්ධ පෞද්ගලික තරහක් හේතුවෙන් යමෙක් චිත්‍රවල තීන්ත ආලේප කරනු ලැබුවා. මෙහිදී සිදුවූ ජාතික ව්‍යසනයෙන් බිතුසිතුවම් බේරාගත යුතුයි යන සමස්ත ජාතියම එකම හඬින් කියා සිටි වේලේ රජයේ ආරාධනයෙන් එවකට ජාත්‍යන්තර කීර්තිධර සංරක්ෂණ ශිල්පියකු වූ ඉතාලි ජාතික ලුසියානු මරංසි මහතා ලංකාවට පැමිණියා. මරංසි මහතා සමඟ ලංකාවේ රාජා ද සිල්වා මහතා එක්වී තීන්ත යැවීම සඳහා රසායනික ද්‍රව්‍යයක් පිළියෙළ කරනු ලැබුවා.''

''ඊට පස්සෙ තමයි මේකෙ අමාරුම හරිය. ඒ කියන්නේ අර තද බුළගෙ පලංචි ගහගෙන සංරක්ෂණ කටයුතු කරන එක. අනෙක රසායනික ද්‍රව්‍ය පොඟවන්න ඕනේ පාන්වල. ඒ පාන් කුට්ටියක් එක සැරයයි බිත්තියේ තීන්ත උඩ තියන්න ඕන. එතකොට තීන්ත උරන ප්‍රමාණය ඉවත් කළ යුතුයි. නැවත අලුත් පාන් කුට්ටියක් පාවිච්චි කළ යුතුයි. දිනකට වර්ග අඩියක්වත් තීන්ත යවන්න බෑ.

මහජන පුස්තකාලය
විමර්ශන අංශය
මහ නගර සභාව
කුරුණෑගල

ඉතින් මම සැලසුම් ශිල්පියා කියලා බල බලා හිටියෙ නෑ. මම භාරගත්ත වැඩේ මරංසි මහත්තයා කියලා දීපු විදියට පලංචියේ ඉඳන් මාස හයක් එකදිගට වැස්ස, අව්ව, පින්න, දරුවෝ, මදුරුවෝ ආදි මොකක්වත් ගැන මම තැකීමක් කළේ නෑ. දිගටම ජාතිය වෙනුවෙන් මේ කටයුත්ත කළා. මේක නිසා මරංසියි, මායි හරියට මිත්‍ර වුණා. අවසානයේදී අපේ නිවසට පවා ඔහු පැමිණියා. සිංහල වචන කීපයක්ද ඉගෙන ගත්තා. ලංකාවේ කැම වර්ග මට කියලා හදවා ගෙන්න ගත්තා. මට මගේ සේවය ඇගයීමට ලක්කරලා ලිපි දුන්නා. එතුමා ඉතාලියට ගියාට පස්සෙ මට ලිපි එව්වා. ලස්සනම වැඩේ මරංසි මහත්තයා ලෝකයේ සංරක්ෂණ කාර්යය කිරීමේදී සිදුවූ පෞද්ගලික අත්දැකීම් පිළිබඳ පොතක් ලිව්වා. ඒකෙ සිගිරිය ගැන, ලංකාව ගැන ප්‍රධාන වශයෙන් ලියවී තිබෙනවා. එහි මා පිළිබඳවත් යම් ඇගයීමක් කිරීමට මා ගෞරවණීය මිතුරා පියවර ගෙන තිබුණා. මේ බව ඔහු මට දන්වා ලිපියක් එව්වා. පොතක් එවූ බව දැන්වූ නමුත් මේ වෙනකං නම් පොත මගේ අතට ලැබුණෙ නෑ. එය දෙපාර්තමේන්තු ලිපිනයටයි එවා තිබුණේ."

"මේ කාර්යයට පස්සේ ලංකාවේ බොහෝ විහාර සිතුවම් සංරක්ෂණය භාර කළේ මට. අද නිලධාරීන් තමන්ගෙ රාජකාරිය විතරයි කරන්නෙ. මා ගැන බැලුවොත් මා කළ යුත්තේ සැලසුම් ඇඳීමයි. නෑ, මම පුරාවිද්‍යාවේදී හැම වැඩක්ම කළා. අද මම සතුටු වෙන්නේ ඒ නිසයි. කම්කරුවගෙ කාර්යය පවා කරන හැටි මා ආදර්ශයෙන්, ආදරයෙන් ඔවුනට කියා දුන්නා. මේ සියල්ලෙහිදීම මා පිටුපස දැවැන්ත පුද්ගල රූප දෙකක් තිබුණා. ඒ මහාචාර්ය පරණවිතාන සහ ආචාර්ය රෝලන්ඩ් ද සිල්වා. ඒ අය නිසා රාජකාරි මට්ටමේ නිවැරදි තීරණ අරගෙන ක්‍රියාත්මක කරන්න මම බය වුණේ නෑ. අවශ්‍ය වන්නේ විෂය කරුණු හරිහැටි ආදේශ කිරීම පමණයි."

"මේ සියලු කටයුතුවලදී සමකාලීන බොහෝ නිලධාරීන් මා සමග මිතුරු වී සිටියා. ඔවුන් දැවැන්ත යුග පුරුෂයෝ. අත්සන, පෙත්සම ආදී අග්‍රගණ්‍ය නවකතා ලියූ හිටපු දිසාපතිවරයකු මෙන්ම අධ්‍යාපනඥයකුද වූ ලීල් ගුණසේකර මගේ කල්‍යාණ මිත්‍රයෙක්. ඔහු අනුරාධපුර උප දිසාපතිවරයාව සිටියදී එතුමා සමග මම

බොහෝ සමීපව වැඩ කිරීමට පටන්ගෙන තිබුණා. එතුමාගේ මංගල පෝරුව පවා නිර්මාණය වුණේ සම්පූර්ණයෙන්ම මගේ දෑතින්."

"කොහොම නමුත් ධර්මානුකූලව අමද්‍යප ප්‍රතිපදාවෙන් රාජකාරි කළ මාව ධර්මය විසින්ම ආරක්ෂා කළා. ධර්මය මට ආශිර්වාදයක් වුණා. මම හැමවිටම අපේ නටබුන් දැක්කේ පුරාවිද්‍යා වටිනාකම සමඟ එක්වූ පූජනීය වස්තූන් හැටියටයි. මම හිතන්නේ මගේ හදවතින්ම තිබූ කැපවීමේ රහස එය කියලයි. මට බොහෝ අවස්ථාවල බොහෝ දෙනා ඊර්ෂ්‍යා කළා. මගේ උසස්වීම්වලට කෙනෙහිලිකම් කළා. ඒ කිසිදෙයකින් මම සැලුණේ නැහැ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මයට අනුව අටලෝ දහමෙන් කම්පා නොවී සිටීමට මා සැමවිටම උත්සාහ කළා. කෙසේ හෝ මා විශ්‍රාම යන්නට පෙර 1978-79 දී ඉන්දියාවේ කපිලවස්තු නුවරින් ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා ලංකාවට වැඩමවීමට රජය තීරණය කළා. ඉතින් මගේ පින කියන්නේ ලංකාවට වැඩම කළ මොහොතේ පටන් ඒ ධාතූන් වහන්සේලා භාරවුණේ මට. ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකටම එය වැඩමවීමට සංස්කෘතික අමාත්‍යංශය කටයුතු කළා. ඉතින් මගේ භාරකාරත්වය යටතේ අදාළ දිසාවට ගියවිට ඒ දිසාවේ දිසාපතිවරයාට මම උන්වහන්සේලා භාර දෙනවා. එතැන් සිට නැවත මට භාර දෙනතුරු මහජන ප්‍රදර්ශන කාලයේදී දිසාපතිතුමාගේ වගකීමට එය යටත් වෙනවා. මේ ආකාරයට යාපනය, වව්නියාව, කිලිනොච්චිය ආදී ලංකාව පුරා හැම දිසාවකටම මම ගියා. අවසානයේ ඉන්දියාවේ කපිලවස්තු නුවරට ගොස් රජයේ නියෝජිත කණ්ඩායමක් හැටියට එය ඉන්දියාවට භාර දුන්නා. ඒ වෙලාවෙ මගේ ඇස් දෙකෙන් කඳුළු කඩා වැටුණා. වෙන හේතුවකට නෙවෙයි, බුදුපියාණන් වහන්සේ මගෙන් වෙන්ව ගියා කියන හැඟීම මට දැනුණු නිසා."

"මම හරිම කැමතියි අනුරාධපුරයට. එතන මගේ ජීවතේ වගෙයි. පුරාවිද්‍යාවේ පත්වීම ලැබෙන්නට කලින් මම ශ්‍රී මහා බෝධීන් වහනසේ වැඳ පුදාගෙන කරන්නේ එකම ඉල්ලීමයි, එකම බාරයයි. ඒ පුරාවිද්‍යාවේ රස්සාව ලැබෙන්න කියලා. මම හිතන් හිටියෙ කම්කරුවෙක් ලෙස හරි ඒකට බැඳෙනවා කියලා. ඉතින් මගේ


වැඩේ හරිගියා. ඒ විතරක් නෙමෙයි. මගේ පත්වීම දීලා පළමු රාජකාරිය පැවරුවෙත් කුට්ටම් පොකුණ. මගේ වැඩේට පැහැදුණු මහාචාර්ය සෙනරත් පරණවිතාන ගුරින් කිව්වා, සෙනෙවිරත්න වගේ අය තමයි අපේ දෙපාර්තමේන්තුවට ඕනකරන සම්පත් කියලා නියත විවරණ දුන්නා හොඳ ගමනක් යන්නට. දෛවය, කුසලය, කර්මය කියන්නේ කොයිතරම් ඇත්තද? මට අදහා ගන්නා බැරි වුණා ශ්‍රී මහා බෝධිය වටා ඉදිකරන රන්වැටේ සැලසුම් සකස් කරන්න මට පැවරුව දවස. මගේ ඇස්වල කඳුළු කඩා වැටුණා මහ පොළවට. මහනුවර දෙගල්දොරුවේ තිබුණ බීරළුවල ආභාෂය අරගෙන මම ඉතා ඉහළින්ම කැපවීමෙන් අදාළ නිර්මාණය කළා. සියලු දෙනාම, විශේෂයෙන් එවකට ශ්‍රී මහා බෝධි භාරකාර නායක හාමුදුරුවෝ හරියට පැහැදුණා. **ඉතින් මගේ සැලැස්ම අනුව වෙනත් දක්ෂ ශිල්පියෙක් විසින් රන්වැට ඉදිකළා.** ඒ දවස්වල මම නැවතිලා හිටියෙත් පුරාවිද්‍යා සංචාරක බංගලාවේ. ඒක තියෙන්නෙ ශ්‍රී මහා බෝ මළුව ළඟමනේ. ඉතින් උදේට ගිහින් බුදුහාමුදුරුවන්ට වඳිනවා කියලා හිතාගෙන හොඳින් වැඳුම් පිදුම් කරලා වැඩේ පටන් ගන්නවා. මගේ නළල තියලා ශ්‍රී මහා බෝ හාමුදුරුවන්ට කොතෙකුත් වඳින්න ඇති වැඩේ යනකොට. මම හිතන්නෙ රාජ්‍ය නායකයකු, භාරකාර හාමුදුරුවරු ඇරෙන්න එතරම් වාරයක් උන්වහන්සේව වන්දනා කරගන්න කාටවත් ලැබුණා කියලා මම හිතන්නේ නැහැ. ඉතින් මගේ වාසනාව, පින්වන්තකම ගැන මටත් පුදුමයි. ඒ තමයි මගේ ජීවිතයේ ගොඩාක් සතුටු වෙච්ච කාලසීමාව. ඉතින් අනුරාධපුරේ සියලු උත්සව, විශේෂයෙන්ම ජාතික පොසොන් උත්සවය මිහින්තලාව කේන්ද්‍ර කොට සංවිධානය කරන්නට මම ගොඩක් වැඩ කළා. හැම වසරකදීම වගේ මුල්කාලීන දිසාපතිවරු ගොඩක් උදව් කළා. ඒ වගේම මට මගේ හොඳම කල්‍යාණ මිත්‍රයා ලීල් ගුණසේකර මැතිතුමා හමුවන්නේ පණස් ගණන්වල පොසොන් උත්සවය සංවිධානය කරන කාලෙදිමයි. ඒ විතරක් නෙමෙයි මිහින්තලේ හිටපු නායක හාමුදුරුවරු සියලු දෙනා මට හරි කාරුණිකව සැලකුවා. හරිම ආදරෙයි. මම කෑවද, බීවද කියලා නිතර හොයලා බැලුවා. පසුකාලීනව මම මිහින්තලා දාගැබ ප්‍රතිසංස්කරණ සැලසුම් ඇන්දා. ඒ විතරක් නෙමෙයි, ඔය දැනට ශ්‍රී මහා බෝධියේ

සිට රුවන්වැලි මළුව දක්වා පාර ආලෝකවත් කරලා විධිමත් කරන්න මම සැලසුම් භාර දුන්නා. විශේෂයෙන් වීදි ලාම්පුව නිර්මාණය කළේ කොරවක් ගලේ ස්වභාවයට. මුළු අනුරාධපුරයටම වීදි ලාම්පු ඉස්සර සවි කළා. දැන් ඒවා නෑ. නමුත් මම නිර්මාණය කළ කණු තමයි තවමත් ඒ පාරෙ මැද තියෙන්නෙ."

"ඉතින් මට කියන්න තියෙන්නෙ අනුරාධපුරෙන් හමා එන සුළඟත් මට සැපයි කියන එක විතරයි. වැවයි-දාගැබයි පිළිබඳ කලාත්මක සිතුවිලි ජනිත වෙන හොඳම දර්ශන තලයක් තියෙන්නෙ අනුරාධපුරේ කියලයි මම තාම විශ්වාස කරන්නෙ."

කෙසේ නමුත් සෙනෙවිරත්න මහතා මහාචාර්ය සෙනරත් පරණවිතාන, ජී. සී. සේත්තියාරි, මහාචාර් චාල්ස ගොඩකුඹුරේ, ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න, ආචාර්ය රෝලන්ඩ් ද සිල්වා යන පුරාවිද්‍යා කොමසාරිස්වරු යටතේ සේවය කොට හසල අත්දැකීම් ලැබූවෙකි. වසර 35 කට පමණ ආසන්න සේවා කාලයක් ඔහු ආධුනික සැලසුම් ශිල්පී, සැලසුම් ශිල්පී, ප්‍රධාන සැලසුම් ශිල්පී හා සහකාර පුරාවිද්‍යා කොමසාරිස් (වාස්තු විද්‍යා) යන ධුරයෙන් විශ්‍රාම ගියේ 80 දශකයේ මුලදී. ඒ වනවිට ඔහු පුරාවිද්‍යා දෙපාර්මේන්තුවට කළ සේවය අප්‍රමාණය. එතැන් පටන් මෙතුමා සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ අලාහන පිරිවෙන හා අභයගිරිය භාර ව්‍යාපෘති කළමනාකාර ධුරයට පත්කරන ලදී. මෙහි එවකට අධ්‍යක්ෂ ජනරාල් වී සිටියේද රෝලන්ඩ් ද සිල්වා මැතිතුමාය. වසර 2 ක පමණ සේවා කාලය තුළ මෙම ධුරයෙන් ඉල්ලා අස්වූයේ තම විෂය අත්දැකීම් තුළින් කරන සේවයට වඩා පරිපාලන හා මූල්‍ය කටයුතු ඇති බැවින්, මූල්‍ය හා පරිපාලන රෙගුලාසි තුළින් තෘප්තිමත් වීමට එතුමාණන්ට නොහැකි නිසාය.

මහාචාර්ය සෙනරත් පරණවිතා ශූරීන් හදිසියේ වියෝ වූයේ 70 දශකයේ මුල් කාලයේදීය. ඒ වනවිට ලංකාවේ තරුණ නැගී සිටීමක් නිසා දීප ව්‍යාප්තව භීෂණයක් මතුවී තිබුණි. ඒ දිනවල එතුමාගේ දේහය ජනතා ගෞරවය සඳහා ජාතික කලාභවන වෙත ගෙන ගොස් තිබුණි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අදාළ අවමංගල්‍ය කටයුතු සංවිධානය කළ අතර රෑ බෝවීමත් සමඟ රටේ ඇඳිරි නීතිය පැනවීම නිසා සැම සියලු දෙනාම නිවෙස් බලා පිටත්ව ගියේය. මේ අනුව







❒ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශිත තිවංක පිළිමගෙය ග්‍රන්ථයට සෙනෙවිරත්න මහතා විසින් අඳින ලද එහි රේඛා සිතුවම්.

පසුදින එළිවෙන තුරු දේහය තනි කළ නොහැකි විය. දශක ගණනාවක් තම ගුරු දේවයන් ලෙස සිටි මහාචාර්ය පරණවිතානයන්ගේ එම නිසල දේහය තනි කිරීමට සෙනෙවිරත්නයන්ට සිත් දුන්නේ නැත. එතුමා පහන් වනතුරු එහිම සිටින්නට විය. ඒ එතුමා සතුවූ කෘතවේදී මනුෂ්‍යත්වය නිසාය. නමුත් මෙය ලියන කතුවරයා ඒ වනවිට වසර 8 ක පමණ කුඩා දරුවෙකි. ඇඳිරි නීතිය පැනවීමත් සමඟ අප නිවසේ තත්ත්වය මට තවමත් මතකය. අම්මා ඇඬූ කඳුළින් යුතුව පියා එනතුරු බලා සිටින්නීය. ගුවන් විදුලියෙන් ත්‍රස්තවාදී ප්‍රහාර ගැන නිතර නිතර කියයි. අප සියලු දෙනා තුෂ්ණිම්භූතව බලා හිඳී. කිසිදු කෑමක්, බීමක් නැත. දැන් ඇඳිරි නීතිය දමා පැය කීපයකි. අම්මා අඬා වැළපෙමින් දුරකතනයක් තිබෙන තැනකට යාමට සූදානම්ය. නමුත් දුරකතනයක් තිබෙන්නේ මංසන්ධියේ කඩ කීපයක වන අතර ඒ සියල්ලද වසා තිබේ. නමුත් මිනී පෙට්ටි සාප්පුව තුළ පමණක් අයෙක් සිටින බව පෙනී එහි ගිය විට එහිද ලයිට් නිවා මිනිසුන් නිශ්ශබ්දව සිටි බව මට මතකය. දොර ඇරියේ නැත. යම් ලෙසකින් පොලීසියෙන් හෝ හමුදාවෙන් පැමිණියේ නම් අම්මා, මම සහ අයියා නීතිය කඩකළ අය ලෙසට යම් ක්ෂණික දඬුවමකට යටත් කරනු ඇත. එළිවෙනකං අපේ ගෙදර සියලු දෙනාගේ හදවත් තුළ තිබුණු ගින්දර මට හොඳින් මතකය. පසුවදා පාන්දර මගේ පියා නිවසට පැමිණි මොහොත අප දෙවියන්, බුදුන් දුටුවාක් මෙනි.

"මම පරණවිතාන මහත්තයගෙ මිනියට තනි රැක්කා". පියා ඉතා සැහැල්ලුවෙන් පිළිතුරු දී ස්නානය කරන්නට පටන් ගත් සැටි හොඳින් මතකය. පියාණන්ගේ ජීවිතය සැමවිටම ඉතා සැහැල්ලුවෙන් ගත කිරීමට හෙතෙම වගබලා ගත්තෙකි. මෙය විටක අපේ නිවසේ සාමයටත්, විටෙක ඒකපාර්ශ්වීය යුද්ධයකටත් බලපෑ ප්‍රධාන කාරණාවක් වූ බවත් සිහිපත් වේ.

## තාත්තා, අම්මා සහ මම

මා කුඩා කල වාහනවල ඇත ගමන් යාමට ඉතා කැමැත්තක් දැක්වූ අයෙකි. තාත්තා සමඟ 'සර්කිට්' ගමනට එක්වීමට නිවාඩු

කාලය එනතුර බලා සිටිමි. මේ අතර ඉඳහිට හිටපු පුරාවිද්‍යා කොමසාරිස් ආචාර්ය රෝලන්ඩ් සිල්වා මැතිතුමා නිල් පැහැති 'ෆෝඩ්' කාරයකින් තාත්තා රැගෙන යාමට රාත්‍රියේදී අප නිවසට පැමිණෙන්නේ ඉතා හදිසියෙනි. ඇවිත් සෙනේ, නුවර යංද? අනුරාධපුරේ යංද? මේ දැන් ආදි වශයෙන් ප්‍රකාශ කරන්නේ සිනාසෙමිනි. එවිටම පුතා හෙට ඉස්කෝලෙ නැනෙ, අපිත් එක්ක යං කියයි. මට ඊට වඩා රජකමක් නැත. තාත්තාට ප්‍රථම මා ඇඳගෙන අවසන්ය. අම්මාගෙන් අවසරය ගන්නට උත්සාහ නොකරන්නේ පුරාවිද්‍යා අධිකාරියෙන්ම අදාළ ඉල්ලීම සමඟ අවසරය මා ලැබූ නිසාවෙනි. ෆෝඩ් රිය ඉතා වේගයෙන් අදාළ ගමන යයි. එහි වේගය මට වඩා හොඳට තාත්තාට පුරුදුය. මම කරන්නේ ටිකක් හයියෙන් අල්ලාගෙන සිටීම පමණි. එසේම පාසලේ කුමන බාහිර කටයුත්තක් තිබුණත් මා ආචාර්ය රෝලන්ඩ් සිල්වා මැතිතුමා හමුවීමට යන්නේ අමාත්‍යංශ ඉහළ නිලධාරියකු ලෙසිනි. ගොස් පාසල් කටයුතු සඳහා විටෙක වාහන පවා ඉල්ලුවෙමි. මේවා තාත්තා දැනගන්නේ සියලු වැඩ නිමවූ පසුවය. කොමසාරිස්තුමාගේ පුතුන්ද අප පාසලේ ශිෂ්‍යයින් වීමද මට තරමක හයියක් ලෙස පැවතුණි. කෙසේ හෝ මා 9 වසර පන්තියේදී අප ප්‍රදේශයේ යහළුවන් සමඟ එක්වී නාට්‍යයක් සම්පාදනය කොට වේදිකා ගත කරන ලදී. 'සසර වසන තුරු මංමුලා නොවේවා' නාට්‍යයේ නමයි. දිනක් එය වේදිකා ගතවූයේ පන්සල් භූමියේය. රාත්‍රී 10 ට පමණ නාට්‍යය අවසන් වී තිබුණි. මා නිවසට යනවිට ආචාර්ය රෝලන්ඩ් සිල්වා මැතිතුමා අප නිවසේ තාත්තා සමඟ සාකච්ඡාවකි. එ පුරාවිද්‍යාව ගැන නොවේ. මාගේ අනාගතය ගැනයි. "පුතාගේ නාට්‍යය ඔක්කොම මම බලාගෙන හිටියෙ. මේක අධ්‍යක්ෂණය කළේ පුතා කියලා කෙනෙක් කිව්වා. සෙනේ පුතාගෙ කලා හැකියාව අති විශිෂ්ටයි. උදව් වෙන්න මටත් කියන්න ඕන දෙයක්." ඒ උතුම් මිනිසකුගේ ප්‍රකාශයයි. ඒ ප්‍රකාශය කළ උත්තුංග චරිතය අද දින අපව නිර්මාණය කළ චරිත වූ බව අවංකව කිව යුතුය. ලීල් ගුණසේකරයන් සහ මපියාණන් අතර තිබූ හිතවත් ලෙන්ගතුකම නිසා අප වාසය කරන නිවස පවා ඉදිකිරීමට තාත්තා උනන්දු කළ බව අප දනිමු. මම ඉපදීමට ප්‍රථම කුලී නිවසක පදිංචිව සිටි සෙනෙවිරත්න පවුලට ඉඩමක් මිලදී ගෙන ගෙයක් සාදන ලෙස කියා ඇත්තේ එතුමායි. "සෙනේගෙම ගේකට ඇරෙන්න මම නං කුලී ගෙවල්වලට ඔයාලව බලන්නවත් එන්නෙ නෑ". ඒ

උත්තුංග චරිතය මිනිසුන් නිර්මාණය කළ ආකාරයයි. තාත්තාගේ දුක්ගන්නා රාළ වූයේත් ඔහුගේ දුක්ගන්නා රාළ වූයේත් 'උඩුවර අත්කල්' ලෙස අප හඳුන්වන පුරාවිද්‍යා සහකාර කොමසාරිස්ව සිටි ජයන්ත උඩුවරයන්ය. ඔහු අපට ඉතාමත් ලෙන්ගතු, අහිංසක අයකු විය. එසේම අන්‍ය ආගමිකයකු වුවද කාඩිනල් කුරේ දේවගැතිතුමන්ද මපියාණන්ට බොහෝ හිතවත්ව සිටි අයෙකි. නිතර නිතර බිෂොප් මාලිගාවට තාත්තා ගිය සැටි මට මතකය. මමද තාත්තාත් සමග එහි ගොස් ඇත්තෙමි. විශාල චිත්‍ර එහි තිබූ අතර ඒවා සංරක්ෂණය කිරීමත් කාඩිනල් කුරේ ඇතුළු මුල්කාලීන බිෂොප්වරු කීපදෙනකුගේම රුව විශාල ප්‍රමාණයට ඇඳ දීමත් මපියාණන් අතින් සිදුවිය. මේ ආකාරයට කොළඹ මහ නගර සභාවේ දැනට එල්ලා ඇති විශාල ප්‍රමාණයේ පින්තූර ඇඳ දීමටත් මපියාණන් කටයුතු කළ බව මට මතකය. මේ සියලු දැවැන්තයන්ට අප සියලු දෙනාගේ ගෞරවය, ආදරය පුද දීමට මෙය අවස්ථාවක් කරගනිමි.

මෙතෙක් තාත්තා ගැන කළ සටහන අම්මගෙන් අවසන් වන්නේ නම් මැනැවැයි සිතේ. ඒ මේ කර්තෘවරයාගේ දැනුමට, ඉගෙනීමට මෙන්ම පොත්පත් ලිවීමේ හැකියාවට ප්‍රධාන දායකත්වයක් සැලසූ තැනැත්තිය අම්මා බැවිනි. ගුරුවරියක් වූ අම්මා අප පස්දෙනාට ඉගැන්වීම සඳහා කළ කැපවීම අනුපමේය වේ. අති උදාර වේ. පාසල් ගුරුවරියක් ලෙස ඇය ලත් වේතනයෙන් පස් දෙනකුගෙන්යුතු පවුලක් සකසා ගැනීම ඒ දිනවලදීද අති දුෂ්කර කර්තව්‍යයකි. තාත්තා සැමවිටම ජීවත් වූයේ වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි, පුරාවිද්‍යාවයි සමඟය. අම්මා ජීවත් වූයේ අප සමඟය. නිවසේ අඩුපාඩු, දරුවන්ගේ සැනසීම, අධ්‍යාපනය ආදී සියල්ලම මෙන්ම ආර්ථිකයේ සෑහෙන බරක්ද ඇය දරාගෙන ජීවත් වූවාය. තාත්තාගේ වැටුප නිවාස ණය සඳහා වාරික වශයෙන් කැපී ගිය අතර අපට හෙඳ නිවසක් නම් ඒ වනවිට දායාද වී තිබිණි. සර්කිට් ගියාම අවශ්‍ය වියදම් නිසාද තාත්තා නිවසේ වෙනත් ආර්ථික බර උසුලන්නෙක් බවට පත්වූයේ නැත. මේ තත්ත්වය නිසා ළමුන් පහක් හදාවඩා, උගන්වා පාසල් ගුරුවරියක් ලෙස ජීවත් වූ අම්මා විසින්ම කුස්සියේ ඉයුම් පිහුම්ද කළාය. ඇය කොළඹ යුගයේ දක්ෂ කිවිඳියක්ද වූවාය. කොළඹ අගනුවර තරුණ කවි සමාජයේ උප සභාපතිනිය ලෙස කටයුතු කළ ඇය සම්මානනීය 'හිඟන්නි' කවි පොතෙහි කර්තෘවරියද වූවාය. ඇය හිටිවන කවි

කියන විට ගෙදර අය වෙනුවෙන් එය අසන්නේ මමය. ඇගේ තනියට සෑම කවි මඩුවකටම වාගේ ආවේ ගියේ මා සමඟය. අවසනදී මමද කවි ලිවීමට පසුකාලයේදී ගීත විචාරයටද ආසා කරන්නකු බවට පත්විය. අම්මාගේ කවි ගුරු දේවයන් වූයේ සිරි අයියා (අධිනීතිඥ යූ. ඒ. එස්. පෙරේරා), එඩ්වින් කෝට්ටේගොඩ (රිදී සීනු ගායක) හා ලංකාවේ පොදු ජනයාට ඡායාරූප ශිල්පය දායාද කළ විල්සන් හැගොඩ ගුරීන් ආදීන්ය. මේ තත්ත්වය නිසා ඔවුන්ද මාගේ ආශ්‍රයට පත්වූයෙමි. පීටර් පෙරේරා, ටියුඩර් ප්‍රේමචන්ද්‍ර, පී. බී. අල්විස් පෙරේරා, කුඩලිගම ආදීන්ගේ කවි හා සාහිත්‍ය ප්‍රකාශන මා ප්‍රිය කළෙමි. මොවුන් අතර සිටි විල්සන් හැගොඩ ගුරීන්ගේ ඡායාරූප පන්තිවලට බැඳී ඡායාරූප ශිල්පය ප්‍රගුණ කිරීමට අපගේ පවුලේ සියලු දෙනාට හැකියාව ලැබුණු අතර අවසනදී මා හට එම සංගමයේ අධ්‍යක්ෂ (අධ්‍යාපන) ලෙසට වසර 10 ක් පමණ සේවය කිරීමට අවස්ථාව උදාවිය. එසේම දෙස් විදෙස් ඡායාරූප සම්මාන කිහිපයකටම හිමිකම් ලැබීමටත්, දෙස් විදෙස් ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශන කිහිපයක් පැවැත්වීමටත් මේ කර්තෘවරයාට හිමිකම ලැබුණේ ඒ අම්මා, තාත්තා නිසාය. බ්‍රහ්මාති-මාතා-පිතරෝ ලෙස ඔවුන්ව හඳුන්වා දීමට හැකිවන්නේද ඒ නිසාය.

"ඇස්. ඇම්. සෙනෙවිරත්න මහතා 1942 වර්ෂයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයට එක්වී 1979 වසරේදී විශ්‍රාම ගන්න ලදී. එතුමාණන් සමඟ සේවය කිරීමේ භාග්‍යය නොලදත් එතුමන් වැනි ශ්‍රේෂ්ඨ සේවාවන් කළ පිරිසකගේ ගුණ සුවඳ ඇති දෙපාර්තමේන්තුවක සේවය කිරීම ලැබීම භාග්‍යයක් සේ සලකමි. ඇස්. ඇම්. සෙනෙවි-රත්නයන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දායාද කළ බොහෝ දේ නිතර අප නෙත ගැටේ. එතුමා ශ්‍රී ලාංකික පුරාවිද්‍යා ක්ෂේත්‍රයට ඉටුකළ මෙහෙව සදානුස්මරණීය වේ."

ආචාර්ය සෙනරත් දිසානායක
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්,
2010 ජූලි 10

එදා සෙනෙවිරත්නයන් හෙබවූ ධූරයේ සිටින ඔහු 2010.06.30 දින එතුමා ගැන කරන ලද සටහන මෙසේය:

එදා පරිගණකය, ඡායා පිටපත්,
ෆැක්ස් යන්ත්‍ර, ජංගම දූරකථනය
පමණක් නොව
ට්‍රේසං කඩදාසි පවා නොතිබුණු
යුගයක....

දශක හතරකට ආසන්න
කාලයක් තිස්සේ
සෙනෙවිරත්නයන්
තම තියුණු පැන්සලෙන්
රළු කෙන්ට් කඩදාසි මත

නිවැරදිව, කලාත්මකව මෙන්ම
විද්‍යානුකූලව
සටහන් කළ අපේ උරුමයේ
සැලසුම් මෙන්ම
මල් ලියකම් දහසක්ය

අද.... නව තාක්ෂණයෙන්
සන්නද්ධ අප
යමක් හරිහැටි
කරන්නේ කෙසේදැයි?
දැනගන්නට ඇවැසි වූ විට
සෙනෙවිරත්නයන්ගේ
සැලසුම් ලාච්චුව
ඇද බලන්නේය.

**ප්‍රසන්න රත්නායක**
පුරාවිද්‍යා නියෝජ්‍ය අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)

ඉතිහාසය නිර්මාණය කරනු ලබන්නේ මිනිසුන් විසිනි. එසේ නොමැති වුවහොත් එය ස්වභාව ධර්මයේ සාමාන්‍ය සංසිද්ධියක් පමණි. අපගේ ඓතිහාසික වංශ කතාවේ 1972 ජනරජයක් බිහිවීම ඉබේ සිදුවූවක් නොවේ. ශ්‍රී ලාංකික ජනතාවගේ අඛණ්ඩ අරගලයක සාමකාමී අවසන් ජයග්‍රහණයකි. ඔවුන් ස්වකීය ජනතාවගේම රජයක් උදෙසා ලබාගත් මානසික නිදහසට භෞතික මෙවලම් මෙන්ම සංකේතාත්මක සංස්කෘතික අංගයන්ද අයත් විය.

මෙම සංකේතාත්මක සංස්කෘතක ප්‍රතිනිර්මාණය කිරීමේ භාග්‍යය සහ ඊට අදාළ උචිත අනුචිත, විවේක බුද්ධියත්, සුවිශේෂ පරිකල්පනයත්, ඊටම ගැලපෙන විෂය ශික්ෂණයත් ඇස්. ඇම්. සෙනෙවරත්න නමැති යුග පුරුෂයා සතුව පැවතිණි. එහි අග්‍රඵලය ශ්‍රී ලාංකික ජනරජ ලාංඡනය නිර්මාණය කිරීමයි. එපමණක් නොව ඔහුට අසුවූ සෑම නොනිමි දෙයක්ම විශිෂ්ට පුරාවිද්‍යාත්මක මෙන්ම කලාත්මක නිමි භාණ්ඩයක් බවට පත්විය. ලංකාවේ අස්සක් මුල්ලක් නැර තිබෙන පුරාවිද්‍යාත්මක ස්ථාන, නටබුන් ප්‍රතිනිර්මාණය කරමින ජාතියට අවශ්‍ය සංකේත නිර්මාණය කළ සෙනෙවිරත්න ශූරීන්ගේ පුරාවිද්‍යාත්මක හා කලා නිර්මාණවලින් අවම වශයෙන් කිහිපයක් ඕනෑම දිස්ත්‍රික්කයක දක්නට තිබේ. එයම ඔබ ජාතියට කළ මහත් වූ දායකත්වයට සාක්ෂි නොවන්නේද? අදට අසූ නවවැනි දිවිය සපුරන ඔබට ජාතියේ ප්‍රාර්ථනයෙන් දීර්ඝායුෂ ලැබේවා.

මහාචාර්ය එම්. එම්. ඩී. ආර්. හේරත්
සමාජ විද්‍යා අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

1972 රාජකීය මට්ටමින් අපි පොඩ්ඩක් අයින්වෙලා අර රිපබ්ලිකන් මට්ටමට බැස්සා. ඒ ඉතිහාසයේ පළමු වතාවට. ඒ අවස්ථාවේ ඒ මොහොත මතක් කිරීමට අලුත් පියවර තහවුරු කිරීමට ලාංඡනයක් නිර්මාණය කරන්නට සිද්ධවුණා.

ඒ අවස්ථාවේදී ඒ ලාංඡනය නිර්මාණය කිරීමට අප තෝරාගත්තේ කවුද? සෙනෙවිරත්න මහත්තයව.

ඉතාමත් අලංකාරයට, කාටත් ගැළපෙන ආකාරයට ඒක සම්පූර්ණ කරලා වෙලාවට බාර-දුන්නා. මැතිතිය ඒකෙ මේක අනුමතයි කියලා අත්සන් කරලා දිනේ දාලා මට කිව්වා ලේඛනා-ගාරයට භාර දෙන්න කියලා.

**(ජාතික රූපවාහිනියේ 2007 දී විකාශනය වූ "අපේ කාලේ අය" වැඩසටහනට ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතා විසින් කළ ප්‍රකාශයක්.)**

ආචාර්ය රෝලන්ඩ් සිල්වා
හිටපු පුරාවිද්‍යා කොමසාරිස්
මධ්‍යම සංස්කෘතික ත්‍රිකෝණයේ අධ්‍යක්ෂ ජනරාල්,
වර්තමාන - මොරටුව විශ්වවිද්‍යාලයේ කුලපති.

"සෙනෙවිරත්න මහතා සැමවිටම පුරාවිද්‍යා සේවක-යින්ට සැලකුවේ දරුවන්ට වගේ. අපි පුදුම ගෞරවයක් තිබුණේ. පුතේ කියලා තමාගේ සාක්කුවෙ ටොෆියක් තිබුණොත් අපිට දෙනවා. කම්කරුවො, මුරකරුවෝ විතරක් නෙමෙයි ප්‍රාදේශීය නිලධාරීන් එතුමා එනවා කිව්වාම හිටියේ හරි සටිතුන්. ඒ වගේ උත්තම පුරුෂයෙක් අපි අපේ සේවා කාලයේදී දැක නෑ. කිසිම විටක අපේ හිත රිදෙව්වෙ නැහැ. අපේ ප්‍රශ්න ගැන එතුමාට කිව්වු විට ඉතා ඉහළින්ම උපරිම මට්ටමින් ඒවාට විසඳුම් දුන්නා."

- ධර්මරත්න මහතා

ධර්මරත්න මහතා වසර 35 ක් දෙපාර්තමේන්තුවේ සේවය කොට පොළොන්නරුවේ පුරාවිද්‍යා නිලධාරියකු ලෙස විශ්‍රාම ගති.


| MONTH | DATE | DISCRIPTION OF WORK PERFORMED. |
|---|---|---|
| MAY | 21st | Left Colombo by 7.30 A.M. Train for Anuradhapura, and reached ~~at~~ A'pura at 1.45 P.M. At 3 P.M. took the bus for Mihintale and reached there by 3.30 P.M. |
| | 22nd | At 7.30 A.M. visited the working site at Maha Saya and found that the work has been stopped due to the heavy rush of Pilgrims to the Maha Saya and Vihara. Work has been stopped for a period of five days. |
| | 23rd | - |
| | 24th | - |
| | 25th | - |
| | 26th | - |
| | 27th | Sunday. |
| | 28th | Work started at Maha Saya. Took all the measurements in the centre Relic chamber and the Hatares Kotuwa. Relic chamber and one side of the Hatares Kotuwa remains to be cleared. At present labourers are clearing and leveling the Hatares Kotuwa. |
| | 29th | One side is to be cleared to bring down to the level of the upper ~~[illegible]~~ surface of the Dome. Officer from the contractors came to the site and wanted the labourers to dig five feet deep down from the top surface of the Dome. ~~[illegible]~~ According to the instructions received by/from A C(A) I objected to the Officer ~~[illegible]~~ giving such an order to ~~[illegible]~~ dismantle the Dome until fresh order were received from A C (A) till or A C(A) comes in person to make any arrangement. |
| | 30th | Went to the site. clearing, is taking place ~~[illegible]~~ and ~~[illegible]~~. By about 3.30 P.M. they completed clearing and levelled the top surface of the Dome. They have stopped work until A.C. (A)'s order to proceed with further dismantling. |
| | 31st | Went to the High Priest Mihintale and took down the detail notes of the Hatares Kotuwa finds. Measurement was also taken of all the objects. Received the Railway warrant along with a letter to return to Head Office. |
| JUNE | 1st | Left A'pura by (1.30 P.M.) Train for Colombo. |

[illegible signature] 17/11/[illegible]

[illegible signature] 12/6/[illegible]

[illegible signature] ... 1936.

❐ සෙනෙවිරත්න මහතා පිළියෙළ කළ මිහින්තලය සංරක්ෂණ අධ්‍යයන වාර්තා.



| MONTH | DATE | DISCRIPTION OF WORK PERFO[illegible] |
|---|---|---|
| APRIL | 22 | Left Colombo for Dädigama. |
| | 23 | Measurements were taken of the following Circumference of base moulding of the 1st [illegible] ~~at present ground level~~ and 3rd [illegible] |
| | 24 | measurements of small Dagaba portion in elevation of the ancien[illegible] wall in the main Dagaba. |
| | 25. | measurements of ~~[illegible]~~ the Kota Vehera in section of North south ~~[illegible]~~ direction. |
| | 26. | Sunday. |
| | 27. | Section of North east and south west direction |
| | 28. | detail measurements of newly conserved brick work in the main dome. |
| | ~~29~~. | Offsets were taken of the main dagaba under the direction of [illegible] in order to find the actual circumference and its radius |
| | 29. | Acty C.D came to check my drawings and necessary instruction was given for further detail work. Plotting of plan of the main Dägäba. Further detail measurements were taken of the old brickwork in elevation in the main Dome |
| | 30. | Plan and elevation of small stala dagaba. |
| May | 1 | Further measurements of the old brick work in Dome of the main Thupa. |
| | ~~2~~ | ~~Detail measurements of the old brickwork in Dome of main Dagaba~~ |
| | 2. | Detail measurements of conserved portions and preserved ancient bri[illegible]work at the main Dagaba and its broken lotus mo[illegible]ings |
| | 3. | Left for Colombo |

8/5

18.5.59

❒ දැඩිගම කොටවෙහෙර සංරක්ෂණ අධ්‍යයන වාර්තා.

## ඇස්. ඇම්. සෙනෙවිරත්න මහතා සිදුකළ ජාතික සේවාවන්ගෙන් බිඳක්....

1. කිරිවෙහෙර ප්‍රතිසංස්කරණ සැලැස්ම
2. ශ්‍රී මහා බෝධි රන්වැට සැලසුම
3. මිහින්තලේ නව දාගැබ සැලැස්ම
4. දැදිගම - කොටවෙහෙර සැලසුම්
5. මාතලේ නාලන්දා ගෙඩිගේ ප්‍රතිසංස්කරණ සැලසුම
6. දැදිගම කොටවෙහෙර සංරක්ෂණ සැලැස්ම හ කැණීම්වලදී හමුවූ නටබුන් පිළිබඳ විද්‍යාත්මක සටහන්.
7. අනුරාධපුර රුවන්වැලි මහා සෑයේ නව වාහල්කඩ සැලසුම
8. රුවන්වැලි සෑ මළුවට සණ්ඨාර කුළුන නිර්මාණය
9. මැදිරිගිරිය වටදාගේ සංරක්ෂණ සැලසුම
10. තිරියාය වටදාගේ සංරක්ෂණ සැලසුම
11. අභයගිරිය සංරක්ෂණ සැලසුම
12. ජේතවනාරාම සංරක්ෂණ සැලසුම
13. පඬුවස්නුවර සංරක්ෂණ සැලසුම
14. යාපහුව සංරක්ෂණ සැලසුම හා යාපහුව කෞතුකාගාර සැලසුම
15. සීගිරිය සංරක්ෂණ සැලසුම් හා කෞතුකාගාර සැලසුම්
16. පොළොන්නරුව වටදාගේ සහ අවට සංරක්ෂණ සැලසුම්
17. තිවංක පිළිමයේ සංරක්ෂණ සැලසුම් හා චිත්‍ර සංරක්ෂණය කිරීම හා පිටපත් කිරීම
18. ලුසියානු මරංසි මහතා සමඟ සීගිරි චිත්‍ර සංරක්ෂණය
19. ගල්විහාර බිතුසිතුවම් සංරක්ෂණය හා පිටපත් කිරීම
20. හිඳගල ලෙන්විහාර බිතුසිතුවම සංරක්ෂණය හා පිටපත් කිරීම

21. දෙගල්දොරුව චිත්‍ර සංරක්ෂණය හා පිටපත් කිරීම
22. මහනුවර දළදා මාලිගාවේ චිත්‍ර සංරක්ෂණය හා පිටපත් කිරීම
23. මහමෙව්නා උයන සංවර්ධන සැලසුම් (පළමු පියවර)
24. මුල්කිරිගල විහාර සිතුවම් පිටපත් කිරීම
25. දඹුල්ල ලෙන්විහාර බිතු සිතුවම් සංරක්ෂණය හා පිටපත් කිරීම හා සංරක්ෂණ සැලසුම්
26. මහනුවර මැදවල විහාර සංරක්ෂණ සැලසුම්
27. මහනුවර ලංකාතිලක විහාර සංරක්ෂණය
28. ඇම්බැක්කේ කැටයම් පිටපත් කිරීම
29. කුරුණෑගල කොළඹගම විහාර සංරක්ෂණ සැලසුම
30. කුරුණෑගල රිදී විහාර සංරක්ෂණය හා පිටපත් කිරීම
31. පුරාවිද්‍යාව මගින් ප්‍රකාශිත 'කලාපෙළ' ග්‍රන්ථ සඳහා චිත්‍ර ඇඳීම. මෙහිදී සිංහල උළුහව් ග්‍රන්ථය, තිවංක පිළිමගෙය යන ග්‍රන්ථ දෙක සඳහා වූ චිත්‍ර දෙකක් හැර අන් සියල්ල අඳින ලද්දේ සෙනෙවිරත්න මහතා විසිනි.
32. මහාචාර්ය සෙනරත් පරණවිතාන ගුරින්ගේ ග්‍රන්ථ සඳහා චිත්‍ර නිර්මාණ.
33. ආචාර්ය චාල්ස් ගොඩකුඹුරේ මහතාගේ ග්‍රන්ථ සඳහා චිත්‍ර නිර්මාණ.
34. Expo 67 කැනඩාවේ පැවැති පුරාවිද්‍යා ප්‍රදර්ශනය සඳහා චිත්‍ර නිර්මාණය කිරීම, පොළොන්නරුව පිළිම අනුරූ සකස් කිරීම සහ ප්‍රදර්ශන කෘතීන් රටපුරා එකතු කිරීම. (මෙම ප්‍රදර්ශනය සම්පූර්ණයෙන්ම සංවිධානය කළ සෙනෙවිරත්න මහතට ප්‍රදර්ශනය සඳහා කැනඩාවට යාමට අස්ථාව ලබා නොදුණි. ඒ වෙනුවට වෙනත් ඉහළ නිලධාරියකු ඒ සඳහා සිය පවුලත් සමඟ සහභාගි වන ලදී.)
35. ආගමන-විගමන දෙපාර්තමේන්තුවේ කොන්සියුලර් මුද්දරය
36. හෙන්රි ඔල්කට්තුමගේ මුද්දරය

37. දැලිවල කොටවෙහෙර කැණීම්වලදී හමුවූ ඡත්‍ර හතරක් ඇති රන් කරඬුව සහ සෙසු පුරාවස්තු විද්‍යාත්මක සටහන්
38. ජනාධිපති වීර පදක්කම්
39. ජනාධිපති කාර්යාලයේ සේවක නිල ඇඳුම
40. ග්‍රාමසේවක ලාංඡනය
41. ලේඛනාගාර ලාංඡන
42. කෞතුකාගාර ලාංඡන
43. කොළඹ විශ්වවිද්‍යාල ලාංඡනය
44. මන්නාරමේ දිසා කොඩිය
45. ශ්‍රී අසරණ සරණ සංඝරාජ අනුස්මරණ ශාලා සැලැස්ම - ගලගෙදර
46. ජෝන් ද සිල්වා සමරු රඟහල සැලැස්ම
47. මහනුවර වීර පුරන්අප්පු ස්මාරකය
48. තරුණ බෞද්ධ සමිති ලාංඡනය
49. දඹරාවේ සංඝරාජ ස්මාරකය - කොල්ලුපිටිය
50. සමස්ත ලංකා සැලසුම් ශිල්පීන්ගේ සංගමයේ සැලැස්ම
51. කොළඹ පුරහලේ ඇති ස්මාරකය
52. කැලණි විහාරයට වාහන ඇතුල් වන ස්ථානයේ ඇති තොරණ සැලසුම් කිරීම, කැලණි විහාර බිතු සිතුවම් සංරක්ෂණය කිරීම, පිටපත් කිරීම
53. ශ්‍රී ලංකා ජාතික කොඩියට බෝපත් 4 ක් සැලසුම් කිරීම
54. කොළඹ කලාභවනේ නව දොරටුව නිර්මාණ සැලසුම.
55. සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘති කළමනාකරු වශයෙන් පොළොන්නරුවේ ආලාහන පිරිවෙන් හා අනුරාධපුර අභයගිරි ව්‍යාපෘතිවල වසර දෙකකට පමණ ආසන්න කාලයක් සේවය කිරීම හ අදාළ සියලු සැලසුම් කටයුතු.
56. කපිලවස්තු ධාතු ප්‍රදර්ශනයේදී අදාළ ධාතු කරඬුව භාර නිලධාරී වශයෙන් දිවයිනේ නොයෙක් දිසාවල සංචාරය කිරීම.

57. ලන්ඩන්හි පැවති ලංකාවේ සංස්කෘතික ප්‍රදර්ශනයක් සඳහා අවශ්‍ය සියලු කටයුතු දේශීය වශයෙන් සූදානම් කර දීම. (ප්‍රදර්ශනය සඳහා වෙනත් නිලධාරියෙක් යවන ලදී.)

58. සීගිරි මාපාගල හා පොකුණුගල කැණීම්වලට අදාළ සැලසුම් හා චිත්‍ර නිර්මාණය කිරීම.

59. අනුරාධපුර රුවන්වැලි සෑ දාගැබෙහි බටහිර දොරටු ප්‍රති-සංස්කරණ සැලසුම් නිර්මාණය කිරීම.

60. බෙල්ලන බැඳි පැලැස්ස ප්‍රතිසංස්කරණ සැලසුම් කිරීම.

61. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු තහනම් ඉඩම්, ස්මාරක, කෞතුකාගාර (ජාතික ප්‍රාදේශීය) ආදිය සිතියම්ගත කිරීම.

62. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සමරු ස්ථම්භය සැලසුම් කිරීම.

63. සේරුවාවිල රජමහා විහාර චෛත්‍යයේ බිම් සැලැස්ම.

64. දඹුල්ල රිදී විහාරය, මුහුදු මහා විහාරය ආදී සංරක්ෂණ සැලසුම් ආදිය පිළියෙළ කිරීම සහ එහි පිහිටීම මෙන්ම හානිවූ ආකාරය පිළිබඳ පුරාවිද්‍යා රේඛා සටහන් පිළියෙළ කිරීම.

65. අවුකන පූජා භූමි සැලසුම නිර්මාණය.

66. අනුරාධපුර සංස්කෘතික මධ්‍යස්ථානයට අදාළ සැලසුම.

67. අනුරාධපුර සමාධි බුදු පිළිමයේ සැලසුම් (පුරාවිද්‍යා ග්‍රන්ථ සඳහා)

68. සීගිරියේ සෙනරත් පරණවිතාන අනුස්මරණ කෞතුකාගාර සැලසුම.

69. පලාබද්දල මහ සමන් දේවාලයේ සංරක්ෂණ සැලසුම්.

70. ත්‍රිකුණාමලය කන්දරොඩේ මාතොට විහාරවල සඳහන් චිත්‍ර ප්‍රකාශන හා සැලසුම්.

71. දෙහිවල ගල්කිස්ස මහනගර සභා ලාංඡනය.

72. කොට්ටාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා ලාංඡනය.

73. සම්පත් බැංකු ලාංඡනය.

74. ලංකා කලා සංගම් ලාංඡනය


75. කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලයීය බෞද්ධ සංගම් ලාංඡනය.

# ❒ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් පසු කළ සේවාවන්

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් සේම සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ අලහාන පිරිවෙන ව්‍යාපෘති කළමනාකාර යන ධුර දෙකින්ම විශ්‍රාම ගත් සෙනෙවිරත්නයන් යොමු වූ ප්‍රධානතම කාර්යය වූයේ ඒ වනවිටත් ඔහු සාමාජිකයකුව සිටි ජාතික කලා සංගමය මගින් පැවැත්වූ ළමා චිත්‍ර කලා පන්තියේ චිත්‍ර කලා ආචාර්යවරයකු ලෙස කටයුතු කිරීමයි. සෑම සති අන්තයකම ඉතාමත් ලැදියාවෙන් හා සතුටින් යුතුව කුඩා දූ දරුවන් සඳහා චිත්‍ර ඉගැන්වීමට ඔහුද අතිශයින් රුචියක් දක්වන්නට යෙදුණි. මේ යටතේ ළමා චිත්‍ර ප්‍රදර්ශන කීපයක්ම සෑම වසරකම වාගේ පැවැත්වීමට එතුමාට හැකියාව ලැබුණි. මේ අනුව 1983 වසරේ සිට 2003 පමණ වසර 20 ක් පමණ ශ්‍රී ලාංකික දරුවන් වෙනුවෙන් කලා සංගමය තුළ කටයුතු කරන ලදී. මේ කාලසීමාව තුළ ලංකා කලා සංගමයේ ප්‍රධාන ලේකම්වරයා හා උප සභාපතිවරයා යන ධුර ද්විත්වයම දැරූ අතර ලංකා කලා සංගමයේ වර්තමාන ලාංඡනය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේද සෙනෙවිරත්න මහතාටය. එසේම ලංකා කලා සංගමයට වසර 50 ක් පිරීම නිමිත්තෙන් නිකුත් කළ සමරු මුද්දරය නිර්මාණය කළේද ඔහුය. මේ ආදී වශයෙන්




❒ 1970 දී පමණ ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු විලියම් ගොපල්ලව උතුමාණන් අතින් චිත්‍ර සඳහා සම්මාන ලබාගැනීම.




❒ 1995 දී පවත්වන ලද සෙනෙවිරත්නයන්ගේ පුරාවිද්‍යා චිත්‍ර සටහන් ප්‍රදර්ශනයේ පෝස්ටරය.

තම ශ්‍රමයෙන් අනාගත පරපුරට තමා ලත් දැනුම ලබාදීමෙන් එතුමා කළ සේවය ඉමහත්ය. එසේම සමාජයේ දැනට මැති-ඇමැතිවරුන්ගේ දරුවන් මෙන්ම එතුමාගෙන් කලා අධ්‍යාපනය ලත් අය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හා ඉතා උසස් නිලතල දරණ අයද ඇති බව නිතර ඉතා සතුටින් මතක් කර දෙන එතුමා වඩාත් ආඩම්බර වන්නේ දැනටමත් ප්‍රවීණ ගණයෙහිලා සැලකිය හැකි තරුණ කලාකරුවන් කීපදෙනකුම එතුමා යටතේ ශිල්ප ඉගෙන ගත් බව පවසමිනි.

මේ අතරතුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වසර 100 ක් පිරීම නිමිත්තෙන් "පුරාවිද්‍යා චක්‍රවර්ති" අධි සම්මානය සඳහා කීපදෙනකු යෝජනා කරන්නට යෙදුණි. මහාචාර්ය සෙනරත් පරණවිතාන, චාල්ස් ගොඩකුඹුරේ, වල්පොල රාහුල හිමි, එල්ලාවල මෙධානන්ද සහ ඇස්. ඇම්. සෙනෙවිරත්න මේ අතර විය. දෛවයේ සරදමකට



❒ අමාත්‍ය මහාචාර්ය ඒ. වී. සුරවීර මහතා අතින් සෙනෙවිරත්නයන්ගේ සංඛ පද්ම ප්‍රදර්ශනය විවෘත වීම. මෙහි මහාචාර්ය ජේ. බී. දිසානායක සහ නියෝජ්‍ය අමාත්‍ය නාවලගේ බැනට් කුරේ මහතාද සිටී.




❒ සෙනෙවිරත්න මහතා විසින් අඳින ලද පොත් පිටකවරයක්.

මෙන් එම සම්මානය සඳහා ලබාදුන් තිළිණය වූයේ සෙනෙවි-රත්න මහතාගේ සේවා කාලය තුළදී කැණීම්වලින් සොයාගත්, එසේම එතුමා විසින්ම එහි සෑම සටහනක්ම පොත්පත්වලට ඇඳ තිබූ දැදිගම කොටවෙහෙරේ වායු බලයෙන් ක්‍රියා කරන ඇත් පහනේ අනුරුවකි. මේ සමඟම රජය විසින් කලාභූෂණ සම්මානයෙන් එතුමා පුදන ලදී.

1950 ගණන්වල සිට ශ්‍රී ලංකා ජාතික ඡායාරූප සංගමයත්, ලංකා කලා සංගමයත් යන ද්විත්වය සම්බන්ධයෙන් විශාල සේවයක් ජාතික මට්ටමෙන් සිදුකළ අග්‍රගණ්‍ය කලාකරුවකු වන ගරු



❒ සෙනෙවිරත්නයන් විශ්‍රාමික සුවයෙන් පසුවූ 1985 ට පසු කාලයක ලංකා කලා සංගමයේ ළමා චිත්‍ර පන්තියෙහි චිත්‍ර ප්‍රදර්ශනය. මෙහි ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වූ පැල්පොල විපස්සි ස්වාමීන් වහන්සේ පිරිස ඇමතීම ඡායාරූපයේ දැක්වේ. ලංකා කලා සංගමයේ එවකට සභාපති වෛද්‍ය රංජන් අබේසිංහ මහතාද මෙහි වෙති.

විල්සන් හැගොඩ සූරීන් හා ඩිස්ටන් ජයසූරිය මැතිඳුන් සෙනෙවිරත්න මහතාගේ ඉතා කුළුපග මිත්‍රයන් වූ අතර ඒ නිසාම මෙම සංගම් ද්විත්වයම 'අපේ' යන හැඟීම සෙනෙවිරත්න මහතා තුළ තවමත් තිබීම සහ දැනට ජීවතුන් අතර සිටින ජයසූරිය මහතා කෙරෙහි ඇති ලෙන්ගතුකම ඉතා විස්මියජනකය.

එසේම විටක රජය ජාතික කලාභවනේ ඇති ලංකා ජාතික කලා සංගම් කාර්යාලය ඉන් ඉවත් කිරීමට සැරසෙද්දී එයට විරුද්ධව අභීත හඬක් නැංවූ පිරිස අතර මේ තිදෙනාද, මාපලගම විපුලසාර හිමි, ජෝ දඹුලුගල සහ දොස්තර රංජන් අබේසිංහ යන මහතුන් සිටි බව බොහෝ දෙනාට අමතක වී තිබේ.

දැනට කලා සංගමයේ ජීවතුන් අතර සිටින කීපදෙනාගෙන් අග්‍රගන්‍ය සේවයක් කළ ඒ කලාකරුවාණන්ට අවසානයේදී සිදුකළේ කුමක්ද? වසර 2000 මුල් භාගයේ පත්වූ සභාපතිවරියක් එතුමාගේ ළමා චිත්‍ර පන්තිය නැවැත්වීමට කටයුතු කළ අතර කලා සංගමයේ

Telephone Nos.
Vice-Chancellor 08—88151
Office 08—88301—5 (five lines)
Registrar 08—88102
Bursar 08—88104

Our Ref.
Your Ref.

1942 - 1992
FIFTY YEARS OF UNIVERSITY EDUCATION
පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
பேராதனைப் பல்கலைக்கழகம், ஸ்ரீ லங்கா
UNIVERSITY OF PERADENIYA, SRI LANKA

පේරාදෙණිය
பேராதனை
Peradeniya

Date 1995.05.09.

"සබ පද්ම" පුරාවිද්‍යාත්මක රේඛා හා සිතුවම් ප්‍රදර්ශනය

අද දින ජාතික කලා සම්මානයේ විවෘත වන පුරාවිද්‍යා චිත්‍රවත්ති එස්.එම්. සෙනෙවිරත්න මහතාගේ කෞතුක චිත්‍ර ප්‍රදර්ශනය සඳහා මෙවැනි ලිපියක් එවීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

දශක පහකට ආසන්න කාලයක් ශ්‍රී ලංකාවේ සත් දෙසින් එකතු කරන ලද, ජාතික අනන්‍යතාවය පිළිබිඹු කරන නිර්මාණාත්මක හා පුරාවිද්‍යාත්මක එකපුද්ගල චිත්‍ර එකතුව මෙය බව මගේ හැඟීමයි. මහාචාර්ය සෙනරත් පරණවිතාන වැනි ශ්‍රේෂ්ඨ පුරාවිද්‍යාඥයන් සමග සිය ජීවිත ගමන ආරම්භ කළ සෙනෙවිරත්න මහතා රාජකාරියට අමතරව, උච්ච-අනුච්ච විවේක මුද්‍රාවන්, අපූර්ව වස්තු නිර්මාණයේ ඇති කුසලතාවයන් උපයෝගී කර ගනිමින් මෙට විටත් වන පරපුර වෙනුවෙන් ජාතියට දායාද කරනු ලබන මෙම විචිත්‍ර කැදිලියේ චිත්‍ර සමුදාය ලොව ජාතියක නිර්මාණශීලී ඉතිහාස කරුව ලොවට හෙළි කරන බිය නැති.

මෙම ප්‍රථම පුරාවිද්‍යාත්මක චිත්‍ර ප්‍රදර්ශනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්වර්ණ-ජයන්තිය වෙනුවෙන් ඉමහත් කැපවීමෙන් සහ පරිශ්‍රමයෙන් සංවිධානය කළ ඒ මහතාගේ පරිත්‍යාගශීලී ගුණය ප්‍රශංසාත්මකව මෙහිදී සිහි කරන අතර එය අප විශ්වවිද්‍යාලයේ අති මහත් ගෞරවයට සහ ප්‍රසාදයට පාත්‍ර වූ බවද සිහි කරමු.

ජීවිතයේ සැඳෑ සමය නිරාමය ප්‍රීතියෙන් යුතුව ගත කරන සෙනෙවිරත්න මහතාට තවදුරටත් නිර්මාණකරණය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය නිරෝගීභාවය සහ දීර්ඝායුෂ ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

(මහාචාර්ය සී.එම්. මද්දුම බණ්ඩාර)
උපකුලපති.

උප කුලපති
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය.

TELE FAX: 08 - 88151 & 08 - 88104 - KANDY TELEX: 23046 UPDN CE - SRI LANKA


❐ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට වසර 100 ක් පිරීම නිමිත්තෙන් කළ ප්‍රදර්ශනය සඳහා ලැබුණු ඇගයීම් ලිපිය.

බොහෝ කටයුතුවලින් එතුමා ඉවත් කිරීමට කටයුතු කළාය. මෙසේ සිදුකළ නොයෙක් කෙනෙහිලිකම් නිසා අවසනාදී ලංකා කලා සංගමය සහ සෙනෙවිරත්න යන කල්‍යාණ මිතුරන් දෙදෙනා බොහෝ දුරස්ව හුදකලා වන්නට විය.

එතුමා "පුරාවිද්‍යා චක්‍රවර්ති" ධූරයෙන් පිදුම් ලත් ප්‍රථම ලංකා කලා සංගමයේ සාමාජිකයා වීමත්, ලංකා කලා සංගමයේ ලාංඡනය හා ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ නිර්මාතෘ වීමත් නිසා සෙනෙවිරත්න මහතාගේ සහ විල්සන් හැගොඩ සූරීන්ගේ රූප දෙකක් ලංකා කලා සංගම් කාර්යාලයේ එල්ලා තිබූ අතර එයද ඉවත් කිරීමට කටයුතු යෙදීමට එම සභාපතිවරිය කටයුතු කළාය.

1995 සෙනෙවිරත්න මහතාගේ ප්‍රථම ඒකපුද්ගල චිත්‍ර ප්‍රදර්ශනය පැවැත්වීය. එය නම් වූයේ සංඛ-පද්ම ලෙසටයි.

දශක තුනහමාරක කාලය තුළ එතුමා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවය කරන විට තම විවේක කාලයේදී සිදුකළේ කුමක්ද? ළඟ තිබෙන නටබුන් චිත්‍රයට නැගීමයි. එසේත් නැතිනම් ඒවායේ කටුසටහන් ලබාගැනීමයි. බොහෝවිට ඉවත දමන කොළයක් හෝ සාමාන්‍යයෙන් වැරදුණු ලිපියක අනෙක් පැත්ත මේ සඳහා භාවිත කරන ලදී. එසේ ලබාගත් කටු සටහන් නිවසට පැමිණ වඩා නිවැරදිව පරිමානුකූලව ඇඳීම හෝ වර්ණ ගැන්වීම



❒ සෙනෙවිරත්න මහතාගේ පුරාවිද්‍යා චිත්‍ර රේඛා සටහන් සියල්ල සුරක්ෂිතව තැන්පත් කර ඇති ජාතික ලේඛනාගාරය.

දුරකථන- தொலைபேசி- Telephones-- | අධ්‍යක්ෂ பணிப்பாளர் Director 694419 | නියෝජ්‍ය අධ්‍යක්ෂ பிரதிப் பணிப்பாளர் Deputy Director 693954 | කාර්යාලය அலுவலகம் Office 694523 696917 | විදුලි පණිවුඩ தந்தி Telegrams "ජාතික ලේඛනාගාරය" "சுவடிகள்" "Archives"

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව තැ. පෙ. අංක 1414, 7, රීඩ් මාවත, කොළඹ 7.
தேசிய சுவடிக்கூடத் திணைக்களம் த. பெ. இல. 1414, 7, ரீட் அவெனியு, கொழும்பு 7.
DEPARTMENT OF NATIONAL ARCHIVES P. O. Box No. 1414, 7, Reid Avenue, Colombo 7, Sri Lanka.

මගේ අංකය/எனது இல./My No. ..........
ඔබේ අංකය/உமது இல./Your No. ..........
E-mail narchive @ slt. lk
Fax (0941) 694419
දිනය/திகதி/Date ..........

මගේ අංකය :- ජා.ලේ.6/49/190

2002 අප්‍රේල් මස 30 වෙනි දින.

එස්.එම්.සෙනෙවිරත්න මහතා,
845/12, දොඩංගහහේන,
ගොතටුව නව නගරය,
මුල්ලේරියාව.

මහත්මයාණෙනි,

<u>රේඛා චිත්‍ර ,සිතුවම් සහ එම විස්තර ඇතුලත් ලේඛන දෙක</u>

ඔබ විසින් පූදානය කරන ලද ඉහත සඳහන් සියල්ල මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර සංරක්ෂණය සඳහා භාර ගත් බව ස්තූති පූර්වකව සඳහන් කරමි.

02. ඔබ සතුව තිබූ අගනා චිත්‍ර සමූහය මහජන ප්‍රයෝජනය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කිරීම ගැන නැවතත් ස්තූතිවන්ත වෙමි.

03. මෙම සිතුවම් සහ ලේඛන 25.198/1-979 යටතේ ඇතුළත් කර ඇති බවද දන්වනු කැමැත්තෙමි.

මෙයට - විශ්වාසී,

ආචාර්ය කේ.ඩී.ජී.විමලරත්න,
ජාතික ලේඛනාරක්ෂක අධ්‍යක්ෂ.

ප/29/ජා.ලේ.6.

❒ 1995 න් පසු තම ජීවිත කාලය තුළම අඳිමින් එක්රැස් කරගත් ලංකාවේ අතිදුර්ලභ පුරාවිද්‍යා රේඛා සටහන්, චිත්‍ර සියල්ල ජාතිය සතු කළ මහා පිංකම වෙනුවෙන් ලත් ස්තුති ලිපිය.


සිය විවේක කාලය තුළදී සිදුකරන ලදී. එසේ නමුත් 1980 දශකයේ මැද භාගයේ සිට විශ්‍රාම සුවයෙන් සිටි කාලය තුළද එතුමා බොහෝ ඉපැරණි චිත්‍ර වර්ණ ගන්වා අඳින ලදී. මේ ආකාරයට 1996 වනවිට ඉපැරණි බිතු සිතුවම්, බුදු පිළිම, සඳකඩ පහන්, මුරගල්, කැටයම්, සිංහල මෝස්තර වෙනත් ඉපැරණි ගොඩනැගිලි ආදි වශයෙන් බොහෝ රේඛා හා සිතුවම් එතුමා සන්තකයේ තිබුණි. අවසානයේදී තම දූ දරුවන්ද එක්කර ගනිමින් දෙදහසකට ආසන්න චිත්‍ර හා රේඛා සටහන් ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සූදානම් කරන ලදී. මේ අනුව 1995 අදාල ප්‍රදර්ශනය කලාභවනේ ශාලා දෙකෙහිම පැවැති අතර එයට ලැබුණු මහජන ප්‍රතිචාර අතිමහත් විය. මෙම රේඛා හා චිත්‍ර තොගය දෙස්-විදෙස් ආදී වශයෙන් මුදලට තක්සේරු කළ නමුත් එය කිසිවකු සන්තක නොකොට තමා හා දරුවන්

සන්තකයේ චිත්‍ර 20 ක් පමණ තබා ඉතිරි සියල්ල රාජ්‍ය දේපළක් ලෙස රාජ්‍ය ලේඛනාගාරයට භාරදීමට සෙනෙවිරත්න මහතා කටයුතු කරන ලදී. එය එසේ කළේ ඇයි? එතුමා ජාතියේ දායාදයක් ලෙස එය සැලකිමය. උදාහරණයක් ලෙස ලංකාවේ මුරගල් වර්ග 20 කට අධික ප්‍රමාණයක් එතුමාගේ සන්තකයේ පැවතුණි. ඇතැම් නටබුන් අද අපට දැකගැනීමට පවා නැත. එසේනම් එය කොතරම් වටීද? ඒ ආකාරයට සඳකඩ පහන් විකාශනය, බුදුපිළිම වර්ග ආදී වශයෙන් විවිධ පුරාවස්තු වර්ග හා සියවස් ලෙස විශාල ප්‍රමාණයක පරිනාමීය චිත්‍ර ඒ එකතුවේ තිබුණි. එය මැදින් මැදින් අලෙවි කළා නම් ඒ චිත්‍ර තොගයේම වටිනාකම නැතිවන බව එතුමාගේ අදහසයි.

එසේම ලුසියානු මරංසි මහතා සමඟ සීගිරි චිත්‍ර සංරක්ෂණය කරමින් සිටින විට සීගිරි චිත්‍ර අදාළ රසායනික ද්‍රව්‍යයේ පෙඟී යනවිට එම චිත්‍රවල බදාමට යටින් ඇඳින ලද චිත්‍ර කීපයක් මතුවූ බව සෙනෙවිරත්න මහතා කියයි. ඒ සැණෙකින් කඩදාසියක් ගෙන චිත්‍ර රේඛා පිටපත් කරන ලදී. කෙසේ නමුත් නැවත බදාම වේලී ගියවිට එම රේඛා නොපෙනී ගිය අතර එසේ මතුවූ සීගිරි චිත්‍ර යටින් ඇති චිත්‍ර (වැරදියට ඇඳින ලද හෝ වෙනත් යුගයකට අයත්) සටහන් කීපයද මෙ ආකරයටම ලේඛනාගාරයට භාර දුන් චිත්‍ර



❒ ............................................................




❐ ලාංඡන අතරින් අවසන් වරට අඳින ලද දෙහිවල ගල්කිස්ස මහනගර සභා ලාංඡනය.

අතර වෙයි. මෙලෙස මිල කළ නොහැකි වටිනා රේඛා හා චිත්‍ර ජාතිය සතු කළ පිනම එතුමට දාන පාරමිතාවක් වනු ඇත.

"ලාංඡන අඳින එක ලේසි නෑ. ඒ වගේම ඇන්ද ලාංඡනවල අයිතිය ගන්න එකත් ලේසි නෑ. ඒකට වඩා අපි වගේ අයට අඳින දේවල්වලට ආර්ථික වාසි ගන්න එක ඔක්කෝටම වඩා අපහසුයි. මම දෙපාර්තමේන්තුවේදී අඳින ලද ලාංඡන රාජකාරි කියලා කියමුකෝ. නමුත් පසුව පසුව කොතරම් ගෘහ සැලසුම් ලාංඡන ඇඳලා දීලා තියෙනවද? සමහර මූල්‍ය ආයතනවලට පවා ලාංඡන ඇන්දා. නමුත් ඒ බොහෝ දේවලට මට ට්‍රේසිං කොළයක් ගන්නවත් සල්ලි ලැබිලා නෑ. පිං තකා තමයි ඔක්කෝම වගේ ඇඳලා තියෙන්නෙ. ඒ වගේ ඇඳගෙන අපි ඇන්ද බව කියන හොඳ අයත් ඉන්නවා. වැඩි හරියක් ඉන්නෙ ඇන්ද බව කියන්නෙත් නැති, ඊට පස්සෙ අහක බලාගෙන යන අය. නමුත් මම ඒ කිසිම කෙනෙක් එක්ක කිසිදු අමනාපයක් නෑ. ලෝකයේ ධර්මතාවයක් කියලා එකක් තියෙනවා. හේතුඵලවාදයත් මගේ බුදුහාමුදුරුවෝ අපට කියලා දුන්නා. ඒ හිත හොඳින් කළ දේවලට අවශ්‍ය ලෙස මට ධර්මය පිහිට වේවි. එච්චරයි."

"තවත් එකක් කියන්න ඕන. ලාංඡන ඇඳගන්න එන, නිවාස සැලසුම් ඇඳගන්න එන ඕන එක්කෙනෙක් තමන්ගෙ අදහස් කියනවා. අපි බලමු ලාංඡනයක් සමිතියකින් ඇඳගන්න ආවත් ඒ අයට ඕන දේ කියනවා. ඉතින් ඒ කරුණු සියල්ල අසාගෙන ඉන්න

ඕන. ඒ අදහසුත් ගන්න ඕන. මගේ නිර්මාණයට හානි නොවෙන්න ඒ අදහසුත් යම් තරමකට සංකලනය කළයුතු වෙනවා. එහෙම කළාම අර අදහස දීපු අයත්, ඒ ආයතනයේ නිලධාරීනුත් නියෝජනය වෙනවා අදහස් අතින්. නමුත් ඒක එහෙමයි කියලා නිර්මාණ අයිතිය ඒ අයගෙ නෙමෙයි. එය නිර්මාණය කළ අය සතුවෙනවා. ඡායාරූපයක් ගන්න කියලා කෙනෙක් හිටන් හිටියොත් කැමරාව පාවිච්චි කර එය ලබාගන්නා අයටයි නිර්මාණ අයිතිය හිමිවෙන්නෙ. පෙනී හිටිය අයටත් නෙමෙයි, ඒ පුද්ගලයාව හොඳින් අන්දපු අයටත් නෙමෙයි."

ලංකා කලා සංගමය
**THE CEYLON SOCIETY OF ARTS**
Art Gallery, Ananda Coomaraswamy Mawatha, Colombo 7.

FOUNDED 1887
Incorporated 1934
Approved 1952

VICE PRESIDENT
Kalapathi
Chathurani Abeywira

PATRON
Her Excellency
President Chandrika Bandaranaike Kumaranatunga

HONY. TREASURER
R. A. Nimal

Telephone 693067

HONY. GENERAL SECRETARY
Kalapathi, Kalabhushana
Puravidya Chakrawarthi
S. M. Seneviratne

DEPUTY PATRONS
Prime Minister Hon'ble Sirimavo Bandaranaike
Minister of Cultural & Religious Affairs and Buddhasasana Hon. Lakshman Jayakody
Hon. Deputy Minister of Cultural & Buddhasasana Mr A. V. Suraweera

..................2000

වසර 113 ක් පසු කරමින් ලංකා කලා සංගමයේ වාර්ෂික මහ සභා රැස්වීමේ දී එනම් 2000 මැයි මස 20 වෙනි දින තෝරා පත් කර ගන්නා ලද නව නිලධාරී මඬුල්ල මෙසේය.

ගරු සභාපති තනතුරට කලාපති චතුරානි අබේවීර මහත්මිය තෝරා පත් විය.

ගරු ප්‍රධාන ලේකම් තනතුරට කලාපති, කලාභූෂණ පුරා විද්‍යා චක්‍රවර්ති එස්.එම්.සෙනෙවිරත්න මහතා

ගරු උප ලේකම් තනතුරට ඊ.ජේ.ශේමසිලත බණ්ඩාර මහතා

ගරු භාණ්ඩාගාරික තනතුරට ආර්.ඒ.නිමල් මහතා

ගරු ප්‍රදර්ශන ලේකම් වීකී පෙරේරා මහතා

ගරු පූත සාටන් උප ලේකම් මෙරිණා රම්බි සිල්වා මෙතෙවිය තෝරා පත් කර ගත් අතර

ලංකා කලා සංගම් ඉතිහාසයේ පළමු වරට කාන්තාවක් තෝරා පත් කර ගැනීම විශේෂ සිද්ධියක් විය.

ලංකා කලා සංගමය
සදාකල් දිනේවා !

CHATHURANI ABEYAWIRA


එස්. එම්. සෙනෙවිරත්න

❒ සෙනෙවිරත්න මහතා ලංකා කලා සංගමයේ උප සභාපති ලෙස පත්වූ ලිපිය. එහි ලාංඡනයත් සෙනෙවිරත්නයන්ගේ නිර්මාණයකි.

"ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය අඳිද්දිත් ලාංඡන කමිටුව තම විවිධ අදහස් දුන්නා. ගරු අග්‍රාමාත්‍යතුමියගේ අදහසක් තමයි ලාංඡනයට ධර්ම චක්‍රය කොහොම හරි තියෙන්න ඕන කියන එක. කමිටුව හරහා රටේ ජනතාවත් විවිධ අදහස් ලබාදුන්නා. නමුත් එය සැලසුම් නිර්මාණ කාර්යය කළේ මම. නිර්මාණයක් සිහිනෙන් දැකපු, භාවනාවෙන් සංඛේත දැකලා ප්‍රකාශ කළ පමණින් කිසිවකුට නිර්මාණ අයිතියක් නෑ. උසාවියට ගිහින් මම ධ්‍යාන බලයෙන් අහවල් සමාගමට ලාංඡනයක් හිතුවා, ඒකම වෙන කෙකේ ඇඳලා, ඉතින් ඒකෙ අයිතිය මගේ කිව්වොත් උසාවියෙන් මට එහි ප්‍රකාශන අයිතිය, නිර්මාණාත්මක අයිතිය දෙයිද? මාව වෛද්‍ය පරීක්ෂණයකට බඳුන් කරාවි. මගේ නිර්මාණවලට මේ වගේ ප්‍රශ්න ආවා. කෙසේ හෝ මගේ හෘද සාක්ෂිය සහ මගේ හැකියාව මම ඔප්පු කර පෙන්වලා තියෙන නිසා මට මේ කිසිවක් ගැන නැවත තර්ක කරන්න අවශ්‍ය නෑ."

"අනෙක වසර 50 ක් පමණ මම දහස් ගණනක් නිර්මාණය කළ ප්‍රසිද්ධ ලාංඡන 1950 සිට ඇන්දා. නිවාස සැලසුම්, විහාර සැලසුම් දහස් ගණනක් 1942 ඉඳන් කළා. මේ අතර එකම එකක් ගැන ගැටලු ඇතිවුණා. ඉතින් මම කළේ මොකක්ද කියන එක සාක්ෂි ඇතිව ඔප්පු වේවි මම නැති දවසකට හරි. කිසිදු වෙනත් චිත්‍ර නිර්මාණයක් සමාජයට නොපෙන්වපු අයෙකුට කියන්න පුළුවන්ද ලාංඡනය නිර්මාණය කළේ එයා කියලා. ඉතින් එයාට අනෙක් කෙනෙකුට හරි ආයතනයකට හරි ඒ වගේ නිර්මාණයක් කරන්න තිබුණනෙ ජීවිතේ එකක් හරි. එකම එක ලාංඡනයක් හරි අඳින්න තිබුණා. ඉතින් මේවා තමයි යමක් කියනකොට හිතන්න ඕන දේ. මොකක් වුණත් එකක් කියන්න ඕන. අපි මැරෙන මිනිස්සු. ඉතින් ඉන්න කාලෙ අවංකව තමාගේ හැකියාවන් අනුව වීර්යයෙන්, අධිෂ්ඨානයෙන්, යහපත්ව ජීවත් වෙන්න ඕන. අපිට බුදුහාමුදුරුවෝ කියලා දුන් කාරණේ ඒක නේද? හැබැයි මැරෙන්න ඉස්සෙල්ලා රටට, ජාතියට, ආගමට සේවයක් කරන්නත් ඕන."

(ඇස්. ඇම්. සෙනෙවිරත්නයන් කොලොන්නාව සමූහ වාර්තාකරුවකු වන ඒ. සුමනසේන මහතා සමග වසර 2000 දී කරන ලද සංවාද සටහනක් ආශ්‍රයෙනි.)




❒ බ්‍රිතාන්‍ය ජාතික Roloff Beny විසින් රචිත 'ලංකා දූපත' නම් ග්‍රන්ථයෙන් උපුටා ගත් සෙනෙවිරත්න මහතා විසින් අඳින ලද අලුත්නුවර විහාර උළුවස්ස.

විශ්‍රාම යුගයේදීද එතුමා විවිධ ලාංඡන නිර්මාණය කරන ලදී. එසේම පෞද්ගලික වශයෙන් නිවෙස් සැලසුම් රාශියක් බොහෝ දෙනාට ඇඳ දුන් අවස්ථාද ඇත. ඉතා සුළු ප්‍රමාණයක කීපදෙනකු හැර බොහෝ දෙනා එතුමාගේ මූලික වියදම සඳහාවත්, අවශතා සඳහාවත් පෙරළා යමක් ලබා නොදුන් බව නම් ලේඛකයාටද හොඳින් මතකය.

සෙනෙවිරත්න මහතා විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන්ගෙන් විටින් විට අතිවිශාල සංඛ්‍යාවක් සම්මාන හිමිකර ගන්නා ලදී. මේවා අතර පුරාවිද්‍යා චක්‍රවර්ති සම්මානය, කල භූෂණ සම්මානය රජයෙන් හිමිකර ගන්නා ලද අතර කලාපති සම්මානය ලංකා කලා සංගමයෙන්ද, ගරු සහාගී සම්මානය ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයෙන්ද, 306 සී කොටුව සිංහ සමාජයෙන් සිංහ සම්මානයද 2009 සූරිය ලංකා සම්මානයද හිමිකරගත් වැදගත් සම්මානයන්. මීට අමතරව විවිධ පාසල්, ප්‍රාදේශීය සභා, මහනගර සභා, ස්වේච්ඡා සංවිධායන්ගෙන්ද පිදුම් ලබා තිබේ.

සෙනෙවිරත්න මහතා හා එම මැතිනිය ලන්ඩන් නුවර තම වැඩිමහළු දියණියගේ මැදිහත්වීම යටතේ වාර දෙකක් නිවාඩුවක් ගත කරන්නට යෙදුණි. එහිදී ඔහු එහි කෞතුකාගාර නරඹමින්

තවදුරටත් තම අතීත දැනුම වර්ධනය කරගත් අතර ග්‍රීක්, රෝම, ටියුඩර්, වික්ටෝරියානු හා ගොතික් සම්ප්‍රදායයන්ගේ ගෘහ නිර්මාණ හා වෙනත් නිර්මාණ සෙනෙවිරත්න මහතා විසින් බ්‍රිතාන්‍යයේදී තම තෙලිතුඩින් රූ සටහන් ලබාගන්නා ලදී. ඒ 1998 හා 2003 වසරවලදීය.

ඇතැම් ශ්‍රී ලංකා උගතුන් අතින් ලියැවෙන ග්‍රන්ථවලට එතුමා විසින් අඳින ලද චිත්‍ර උපුටා ගත්තද, ඒවායේ නම් ගම් සඳහන් නොකරන චාරිත්‍රයක් පැවතුණි. නමුත් බ්‍රිතාන්‍ය ජාතික රොලොෆ් බෙනි මහතා විසින් සිය ග්‍රන්ථය සඳහා උපුටා ගත් සෙනෙවිරත්න නිර්මාණය පිළිබඳව එම ග්‍රන්ථයේ සටහනක් පළ කිරීමට තරම් කෘතඥ පූර්වක වී තිබේ. ඔවුන්ගෙන් හෝ ශ්‍රී ලාංකික අප හොඳ ආදර්ශයන් ගත්තාට වරදක් නැතැයි සිතේ.

රටට, ජාතියට අවංකව කැපවීම් කළ කලාකරුවන්ට සමාජය නමැති විශ්වවිද්‍යාලයෙන් ලැබෙන විශේෂ උපාධි 3 ක් තිබේ.


1. ඉන් ප්‍රධාන වන්නේ ඔවුන්ගේ නිර්මාණවලට කිසිදු ගෙවීමක් නොලැබීමයි. යම් ගෙවීමක් ලැබුණහොත් එය යන්නේ වෙනත් අයකුගේ සාක්කුවටය.
2. දෙවෙනි උපාධිය වන්නේ කලාකරුවා තැලෙන යකඩයක් ලෙස සලකා ඔහුගෙන් අසීමිතව වැඩ ලබාගෙන කපා කොටා නම පවා ඉවත් කර කොන්කර දැමීමයි.
3. තෙවැන්න නම් නිර්මාණය වෙනත් අයකුගේ නමක් යොදා මංකොල්ල කෑමේ ගරු සම්මානයයි.

මේ සා විශාල සම්මාන ත්‍රිත්වයම නොඅඩුව මේ අහිංසක කලාකරුවාට ලැබුණු බව නම් මේ ග්‍රන්ථ කර්තෘවරයා ලෙසට නොව ඇස්. ඇම්. සෙනෙවිරත්න නම් වූ දැවැන්ත, නමුත් පුංචි මිනිසාගේ බාල පුතා ලෙසට ප්‍රකාශ කළ යුතුමය.

මහජන පුස්තකාලය සහ
විමර්ශන අංශය
මහ නගර සභාව
කුරුණෑගල

# නිවැරදි කිරීම්

| පිටුව | ඡේදය | පේළිය | නිවැරදි යෙදුම |
|---|---|---|---|
| vii | 01 | 08 | "නානාථ කායා නානත්ථ සංඥා" |
| xvii | (ලිපිනය) | - | 845/12, දොඩම්ගහහේන, ගොතටුව. |
| xxii | (පටුන 2, 47 පිට) | - | මාතෘකා ඇතුළු සමස්ථ ග්‍රන්ථයේ සංඛෙත යන්න සංකේත ලෙස නිවැරදි විය යුතුය. |
| 23 | 02 | 03 | තම්බපණ්ණී |
| 23 | (1 පාද සටහන) | 03 | "කුල ක්‍රමය" |
| 24 | (3 පාද සටහන) | 01 | මෙම කර්තෘවරයාගේ |
| 37 | 02 | 01 | සෘණාත්මක |
| 39 | 01 | 10-11 | (The Sovereignty of the Queen) |
| 39 | 02 | 06-07 | (From Sovereignty of the Queen to Sovereignty of the People) |
| 45 | 02 | 04 | අනීතික |
| 46 | 02 | 06 | මහාචාර්ය ගුණපාල මලලසේකර |
| 48 | (02 රූපය) | - | ඊජිප්තු පිරමීඩ |
| 49 | 01 | 01 | මෞර්ය |
| 50 | 01 | 02 | චක්‍රය |
| 58 | 02 | 02 | තෝම්බු |
| 64 | 02 | 23 | ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා |
| 66 | 03 | 09 | සියලු නිර්දේශ |
| 71 | (පින්තූර විස්තරය) | 04 | ඇත්පහන |
| 72 | (පින්තූර විස්තරය) | - | උළුවහු |
| 73 | 03 | 02 | චක්‍රය |
| 88 | 02 | 13 | කාරණය |
| 90 | 01 | 03 | මෝස්තර |
| 90 | 02 | 01 | අවශ්‍යතාවයක් |
| 90 | 02 | 02 | නියෝජනය |
| 92 | 02 | 02 | (පිටු අංක 89) |
| 96 | 02 | 03 | වැඩිහිටියෝ |
| 101 | 01 | 04 | යනුවෙන් සමස්ථ ජාතියම |
| 105 | 03 | 05 | ආසන්න |
| 105 | 04 | 01 | මහාචාර්ය සෙනරත් පරණවිතාන |
| 110 | 01 | 07 | ඔවුහුද |
| 110 | 02 | 03 | ගන්නා ලදී |
| 110 | 02 | 10 | මෙහෙවර |
| 112 | 02 | 01 | සංස්කෘතිය |
| 113 | 06 | 07 | සතුටින් |
| 117 | (34 වන කරුණ) | - | මහතාට |
| 127 | (පින්තූර සටහන) | - | ඇස්. ඇම්. සෙනෙවිරත්න මහතා සෙසු නිලධාරීන් සමඟ පොළොන්නරුවේ නිරීක්ෂණ චාරිකාවක. (1969) |



රාජ්‍ය ලාංඡනයේ නිර්මාතෘ, පුරාවිද්‍යා චක්‍රවර්ති ඇස්. ඇම් සෙනෙවිරත්න

" සෙනෙවිරත්න දක්ෂයි කිරිවෙහෙර ප්‍රතිසංස්කරණ සැළසුම් කරන්න ඔහුට භාර දෙන්න" - මහාචාර්ය සෙනරත් පරණවිතාන

හිටපු පුරාවිද්‍යා කොමසාරිස් 1958 කළ ප්‍රකාශයෙන්

---

සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ වුනේ පොළොන්නරුවෙන්,
ඒ එකදාහස් නවසිය අසූ එකේ අප්‍රේල් එක තෙමෙයි, .... දෙවෙනිදා,...
ඒ ආරම්භක ස්ථානයේ භාරකරු ලෙස අපි පත්කළේ සෙනෙවිරත්න මහතා.
ඒ, අපට එතුමා කෙරෙහි තිබූ විශාල විශ්වාසය නිසයි.

- ආචාර්ය රෝලන්ඩ් සිල්වා, හිටපු පුරාවිද්‍යා කොමසාරිස්,
කුලපති - මොරටුව විශ්වවිද්‍යාලය,
2007 රූපවාහිනී වැඩසටහනක්වූ "අපේ කාලේ අය" සඳහා කළ ප්‍රකාශයක්.

---

පුරාවිද්‍යා චක්‍රවර්ති ඇස්. ඇම් සෙනෙවිරත්නයන් 1958 මා අනුරාධපුර අතිරේක දිසාපති ලෙස කටයුතු කළ කාලයේදී හඳුනාගතිමි. ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය චිත්‍ර නිර්මාණ ශිල්පින් අතර එතුමා අසහාය ජාතික මෙහෙවරක් සිදුකොට තිබේ. ජාති හිතෛෂි කලාකරුවකු පමණක් නොව අප්‍රතිහත ධෛර්යයෙන් හා කැපවීමකින් ඔහු දැයට කළ සේවය අතර ජනරජ ලාංඡන නිර්මාණය, ශ්‍රී මහා බෝධි රන්වැට ආදිය කැපී පෙනෙයි. මාගේ කල්‍යාණ මිත්‍රයකු වන සෙනෙවිරත්නයන් වෙනුවෙන් පිදෙන මෙම "අපේ ජනරජ ගමන" ග්‍රන්ථයෙන් ඔහුගේ සේවය අගයනු දැකීම මාගේ ඉමහත් සතුටට කරුණකි. ඇස්. ඇම්. සෙනෙවිරත්න සූරීන්ට මම ජයසිරි සෙත් පතමි.

- ආචාර්ය ලීල් ගුණසේකර ( ලංකා සිවිල් සේවය )
ඇමති මණ්ඩල ලේකම් (1970- 1977)
එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සමාජ සංවර්ධන කලාපීය උපදේශක (බැංකොක්)

Rs.350/=

## කර්තෘ ගැන..

ආචාර්ය ඉන්ද්‍රජිත් සෙනෙවිරත්න විසින් රචිත "අපේ ජනරජ ගමන" කෘතිය කාලීන වශයෙන් ඉතා වැදගත් ග්‍රන්ථයකි. ලාංකික දේශීය රජවරුන්ගේ කාලයේ සිට විදෙස් ආධිපත්‍යයන් තුනක් ආවරණය කරණ ඔහු, දේශපාලන සමාජ හා ආර්ථික වශයෙන් සියුම් විග්‍රහයක යෙදේ. විශේෂයෙන්ම එතෙක් මෙතෙක් භාවිතා වූ රාජ්‍ය සංකේතයන් පිළිබඳව ද කෘතියෙන් තොරතුරු හෙළි කෙරේ. රාජ්‍යයේ බලය හා ස්වාධිපත්‍යයේ ස්වභාවය ගැන කෙරෙන විග්‍රහය විශිෂ්ට ය. මෙනිසා මෙය පාසැල් දරුවන්ගේ සිට විශ්ව විද්‍යාල මට්ටමේ මෙන්ම ඉන් ඔබ්බට සියලුම විද්‍යාර්ථයින්ට වැදගත් කෘතියක් වනු ඇත. අවසන ශ්‍රී ලංකාව 1972 ජනරජයක් වීම වෙනුවෙන් ස්ථාපිත කරන ලද ජනරජ ලාංඡනය පිළිබඳවත්, එම ලාංඡනයේ නිර්මාතෘ තම පියාණන් ගේ නිර්මාණයන් පිළිබඳවත් කරන විග්‍රහය පියාට කරන කෘතවේදී පිංකමක් මෙන්ම, අප සියලු දෙනා විසින් කළ යුතු ජාතික යුතුකමක් ඔහු කරට ගෙන කිරීමක් වැනිය. - ඒ. සපුමාන

අතිරේක ලේකම් ප්‍රවාහන අමාත්‍යාංශය



M.D.GUNASENA
00122645-2
CN 11/10
Rs. 350.00

52642-0-4
9179555264204